# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2016

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.

# පෙරවදන

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2016 වාර්ෂික කාර්යසාධන වාර්තාව 2002.09.12 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මඟින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ මුල් කොටසින් අමාත්‍යාංශයේ අංශ වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල කාර්යසාධනය පිළිබඳව විස්තර කර ඇත.

අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල කාර්ය සාධනය මෙම වාර්තාවේ දෙවෙනි කොටසින් දක්වා ඇත.

අමාත්‍යාංශයේ මානව සම්පත් තොරතුරු සහ 2016 වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්යසාධනය අවසන් කොටසින් සවිස්තරාත්මකව දක්වා ඇත.

# දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

"සවිමත් වාණිජමය පරිසරයක් තුළින් ජාත්‍යන්තර තරඟකාරී දේශීය කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැඟීම"

**මෙහෙවර**

"ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන්නාවූද, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන බිහි කරන්නාවූ, සවිමත් වාණිජ අංශයකින් සමන්විතවූ ද, ධරණීය හා තරඟකාරීත්වයකින් හෙබි නිෂ්පාදන ආයතනයන්හි අභිවෘද්ධිය සඳහා හිතකාමී වන පරිසරයක් නිර්මාණය කිරීම"

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශයේ විෂය පථය

2015.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශයට පවරා ඇති විෂයපථය පහත පරිදි වේ.

1. කර්මාන්ත හා වාණිජ විෂයයන්ට හා දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන් හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති,වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය
3. වෙළඳ ප්‍රදර්ශණ පැවැත්වීම
4. දේශීය වෙළඳපොල තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිලකට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
5. 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම
6. පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිළ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවෙහි යෙදවීම
7. පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම
8. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම
9. බුද්ධිමය දේපල පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු
10. සීනි කර්මාන්තයට අදාළ රාජ්‍ය සම්පත් කළමනාකරණය හා සුරැකීම

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
# යටතේ ක්‍රියාත්මක වන අංශ සහ ආයතන

කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

කර්මාන්ත සංවර්ධන අංශය

කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ පේෂ කර්මාන්ත සංවර්ධන අංශය

සංවර්ධන අංශ 1

සංවර්ධන අංශ 11

සංවර්ධන අංශ 111

කර්මාන්ත ලියාපදිංචි, ඵලදායිතා ප්‍රවර්ධන හා කළමනාකරණ තොරතුරු අංශය

කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 111- චක්‍රීය අරමුදල

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

සමුපකාර සංවර්ධන අංශය

**දෙපාර්තමේන්තු**

වාණිජ දෙපාර්තමේන්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

**අධිකාරි, මණ්ඩල සහ කොමිෂන් සභා**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

සමුපකාර සේවක කොමිෂන් සභාව

**රාජ්‍ය ව්‍යවසායයන් සහ වාණිජ ආයතනය**

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

ලංකා සතොස සමාගම

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

ජාතික ශිල්ප සභාව

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)

සී/ස ලංකා සළුසල ආයතනය

සීමාසහිත ජාතික කාඩදාසි සමාගම

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ලංකා සිමෙන්ති සමාගම

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම

හිඟුරාන සීනි කර්මාන්ත සමාගම

ලංකා ලේලන්ඩ් සමාගම

ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම

# පටුන


| | අංශ හා ආයතන | පිටු අංකය |
|---|---|---|
| | **අමාත්‍යාංශය තුල ක්‍රියාත්මක වන අංශ** | |
| **01** | කර්මාන්ත සංවර්ධන අංශය | 1-11 |
| **02** | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ පේෂ කර්මාන්ත සංවර්ධන අංශය | 12-17 |
| **03** | **ආංශික සංවර්ධන අංශය** | |
| 3.1 | සංවර්ධන අංශ 1 | 19-23 |
| 3.11 | සංවර්ධන අංශ 11 | 24-26 |
| 3.lll | සංවර්ධන අංශ 111 | 27-30 |
| 3.iv | කර්මාන්ත ලියාපදිංචි, ඵලදායිතා ප්‍රවර්ධන හා කළමනාකරණ තොරතුරු අංශය | 31 |
| 3.v | රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය | 32-35 |
| **04** | සමුපකාර සංවර්ධන අංශය | 36 |
| **05** | කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 111- චක්‍රීය අරමුදල | 37 |
| | **දෙපාර්තමේන්තු** | |
| 06 | වාණිජ දෙපාර්තමේන්තුව | 38-89 |
| 07 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 90-92 |
| 08 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 93-95 |
| 09 | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | 96-100 |
| 10 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 101-102 |
| 11 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 103-106 |
| 12 | ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | 107-110 |
| | **අධිකාරි, මණ්ඩල සහ කොමිෂන් සභා** | |
| 13 | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 111-118 |
| 14 | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | 119-125 |
| 15 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | 126-131 |
| 16 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 132-133 |
| | **රාජ්‍ය ව්‍යවසායයන් සහ වාණිජ ආයතන** | |
| 17 | මාන්තායි සෝල්ට් ලිමිටඩ් | 134-135 |
| 18 | ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය | 136-137 |
| 19 | ලංකා සතොස සමාගම | 138-140 |
| 20 | ජාතික ශිල්ප සභාව | 141-144 |
| 21 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 145-149 |
| 22 | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | 150-151 |
| | පුහුණු සහ මානව සම්පත් සංවර්ධන තොරතුරු | |
| 23 | කාර්යමණ්ඩල තොරතුරු | 152 |
| **24** | විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන් | 153-155 |
| **25** | මූල්‍ය ප්‍රගතිය | 156-164 |

# අමාත්‍යාංශය තුල ක්‍රියාත්මක වන අංශ

# කර්මාන්ත සංවර්ධන අංශය

**හැඳින්වීම**

අමාත්‍යාංශය විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක දහ අටක(18) කර්මාන්තපුර 32ක් පිහිටුවා තිබෙන අතර විදුලිය, ජලය සහ මංමාවත් යන යටිතල පහසුකම් සහිතව අක්කර 1006.5ක භූමියක් සංවර්ධනය කර ඇත.මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන කර්මාන්තපුර 32හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් රු.මිලියන 3,631ක් වැයකොට ඇති අතර, පෞද්ගලික අංශය විසින් සිදුකර ඇති ආයෝජනය රු. මිලියන 32,412කි. රාජ්‍ය ආයෝජනය පෞද්ගලික අංශයේ ආයෝජනය සඳහා ඉතා විශාල දිරිගැන්වීමක් සිදුකර ඇති අතර එය ප්‍රාදේශීය සංවර්ධනයට සහ විරැකියාවට විසඳුම් ලබා දී ඇති බව විද්‍යාමාන වේ.ඒ අනුව කර්මාන්ත සංවර්ධන අංශයේ වගකීම වන්නේ ප්‍රාදේශීය මට්ටමින් කර්මාන්ත අංශයේ ආයෝජනය ප්‍රවර්ධනය, යටිතල පහසුකම් සැලසීම සහ තාක්ෂණික හා උපදේශන සේවා ලබාදීමයි.

**<u>අරමුණු</u>**

රටේ කාර්මික සංවර්ධනයට අදාල ආයෝජන ප්‍රවර්ධනය

ප්‍රාදේශීය කාර්මීකරණ ප්‍රවර්ධනය

විරැකියාවෙන් පෙළෙන්නන්ට කාර්මික අංශයේ රැකියා අවස්ථා බිහිකිරීම

පරිසර හිතකාමී කර්මාන්ත ප්‍රවර්ධනය

**<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>**

- කර්මාන්ත පිහිටුවීමට සඳහා ඉඩම් ලබාදීම පිණිස අවශ්‍ය පහසුකම් සහිත කර්මාන්තපුර ජාලයක් ගොඩනැගීම.
- කර්මාන්තවල පහසු ක්‍රියාකාරීත්වයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කර්මාන්ත අංශයට පහසුකම් සැලසීම
- ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් නිදහස් කිරීමට අදාළ ගැටළු, පාරිසරික අවසරය සහ පළාත් පාලන ආයතනවල අනුමැතිය ආදිය ආමන්ත්‍රණය කරමින් ආයෝජකයින්ට පහසුකම් සැලසීම.
- කර්මාන්ත සඳහා සුදුසු ඉඩම් ලබා දීම පිණිස යාවත්කාලීන දත්ත පදනමක් සහිතව ඉඩම් ශ්‍රී ලංකාවේ සුදුසු ඉඩම් විස්තර පවත්වා ගෙන යාම.
- කර්මාන්තවලට බලපාන ගැටළු පිළිබඳව උපදෙස් දෙමින් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන (වාණිජ මණ්ඩලය, සංගම් ආදිය) සමඟ සම්බන්ධීකරණය .

01. ව්‍යාපෘතියේ නම:-නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- ග්‍රාමීය ප්‍රදේශය තුළ නව ආයෝජන අවස්ථා සහ යටිතල පහසුකම් සංවර්ධනය ඉහළ නැන්වීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| වැසි ජල කාණු පද්ධතියක් ඉදිකිරීම | අඩි | අඩි 1500 දිග කාණු පද්ධතියක් | වැඩ අවසන් කර ඇත |

02. ව්‍යාපෘතියේ නම:-කොළොන්නාව කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරය සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කිරීම | මීටර් | මීටර් 350 දිග පාර කාපට් කළ පාර | වැඩ අවසන් කර ඇත |

03.ව්යාපෘතියේ නම:-නාලන්ද(මාතලේ) කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරය සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කිරීම | කිලෝ මීටර් | කිලෝ මීටර් 1.3 දිග පාර කාපට් කිරීම | මාර්ගයේ ඉදිකිරීම් 45% ක් අවසන් කර ඇත. ඒබීසී මිශ්‍රණය ඇතිරීම සඳහා සූදානම් කර ඇත. මාර්ගය කාපට් කිරීම, බැමි, තාප්ප, තාර දැමීම, අභ්‍යන්තර අගුළු සවි කිරීම අවසන් කිරීමට ඇත. |

04. ව්‍යාපෘතියේ නම:-ත්‍රිකුණාමලය (අදියර III) කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්ත ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| යටිතල පහසුකම් සංවර්ධනය | යටිතල පහසුකම් | යෝජිත ජලය සහ විදුලිය ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | තවම ආරම්භ කර නොමැත |

05. ව්‍යාපෘතියේ නම: -මන්නාරම කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- ග්‍රාමීය ප්‍රදේශය තුළ නව ආයෝජන අවස්ථා සහ යටිතල පහසුකම් සංවර්ධනය ඉහළ නැංවීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| කර්මාන්ත ශාලා ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම | වර්ග අඩි2000 බැගින් | කර්මාන්තශාලා ගොඩනැගිලි දෙකක් එකක් වර්ග අඩි2000 බැගින් | සමස්ත කටයුතු වලින් 90% ක් අවසන් කර ඇත |

06. ව්‍යාපෘතියේ නම: -ත්‍රිකුණාමලය (අදියර II) කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්ත ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| යටිතල පහසුකම් සංවර්ධනය | | යටිතල පහසුකම් (පිවිසුම් මාර්ගය,අභ්‍යන්තර මාර්ග ජාලය ආදිය) යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | දොරටුව,සේවා ගොඩනැගිල්ල හා වැට ඉදිකිරීම අවසන් කරමින් පවතී. ඉඩම සංවර්ධනය සහ පවරු අනෙකුත් අමතර කටයුතු සිදු කරමින් පවතී. |

07 ව්‍යාපෘතියේ නම: -කළුතර කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරය ප්‍රවාහන පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කිරීම | මීටර් 600ක් දිග පාර | කාපට් කළ පාර | වැඩ අවසන් කර ඇත |

08. ව්‍යාපෘතියේ නම: -ලක්ෂ උයන කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- ග්‍රාමීය ප්‍රදේශය තුළ නව ආයෝජන අවස්ථා සහ යටිතල පහසුකම් සංවර්ධනය ඉහළ නැංවීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කිරීම | කිලෝ | කිලෝ 1.8ක් කාපට් කළ දිග පාර | මූලික වැඩ හා ඉදිකිරීම් වැඩ කටයුතු වලින් 5% ක් අවසන් කර ඇත |

09. ව්‍යාපෘතියේ නම: -ටෙම්පල්බර්ග් කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුර සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| පිවිසුම් මාර්ගය,අභ්‍යන්තර මාර්ගය වැඩි දියුණු කිරීම | මීටර් | මීටර් 1570ක් දිග පාර කාපට් කළ පාර | මාර්ගයේ වැඩ කටයුතු 50% ක් අවසන් කර ඇත. කාණුව සහ මාර්ගය සළකුණු කිරීම අවසන් කිරීමට තිබේ. |

10. ව්‍යාපෘතියේ නම: -මිල්ලෑව කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුර සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම සහ යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ජලය සැපයීම | ජල පහසුකම් පැවතීම | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ අවසන් කර ඇත |
| පිවිසුම් මාර්ගය ඉදි කිරීම | මීටර් 950ක් දිග පාර | කාපට් කළ පාර | වැඩ කටයුතු වලින් 98% ක් අවසන් කර ඇත |

11. ව්‍යාපෘතියේ නම: -මීනුවන්ගොඩ කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරය සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම සහ යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අභ්‍යන්තර මාර්ගය වැඩි දියුණු කිරීම | මීටර් 350ක් දිග පාර | කාපට් කළ පාර | වැඩ අවසන් කර ඇත |

12. ව්‍යාපෘතියේ නම: -මතුගම කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ජලය සැපයීම | මීටර් 900ක් දිග නල එළීම (මසකට 7000 m3) | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ අවසන් කර ඇත |
| කාපට් පාර, දුරකථන සහ විදුලිබල සම්බන්ධතා සංවර්ධනය | කාපට් පාර, දුරකථන සහ විදුලිබල සම්බන්ධතා | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | යටිතල පහසුකම් කටයුතු 99% ක් අවසන් කර ඇත. රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව (STC) තවමත් අනුමත කර නැත. ඒ නිසා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) වෙත පදිංචි අවසන් ගෙවීම් සිදු කිරීමට නොහැකි වී ඇත. |

13. ව්‍යාපෘතියේ නම:-මන්නාරම කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| යටිතල පහසුකම් සංවර්ධනය | අභ්‍යන්තර මාර්ග පද්ධතිය, වැසි ජල බැහැර පද්ධතිය,ප්‍රවේශ මාර්ග, පරිපාලන ගොඩනැගිල්ල, ආදිය. | යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම | කාර්මික පුරයේ ප්‍රධාන මාර්ගයට ආසන්න පර්චස් 40 කට වැඩි ඉඩමේ පවතින ආරවුල විසඳා ගැනීමට දැනට අධිකරණයේ නඩු පවරා ඇති හෙයින් එම කොටසේ වැට හැර යටිතල පහසුකම් සංවර්ධනය 99% කින් අවසන් කර ඇත. |

14. ව්‍යාපෘතියේ නම:-මඩකලපුව කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| යටිතල පහසුකම් සංවර්ධනය (විදුලිය සහ ජලය හැර) | සම්පූර්ණ කළ යටිතල පහසුකම් ජල පහසුකම් (පිවිසුම් මාර්ගය, අභ්‍යන්තර මාර්ග පද්ධතිය ආදිය) | යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම | 65% සම්පූර්ණ කර ඇති අතර ඉතිරි වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| ජලය සැපයීම | දිනකට ජලය ඝණ මීටර් (225 m3) සැපයීම | ජල සැපයීම සම්පූර්ණ කිරීම | වැඩ 15 % සම්පූර්ණ කර ඇත. අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ පයිප්ප ඇතිරීම ආරම්භ කිරීමට සහ සම්පූර්ණ කිරීමට ඇත. |
| විදුලිය සැපයීම | මෙගාවොට් 5 විදුලි බලය | විදුලිය සැපයීම සම්පූර්ණ කිරීම | වැඩ 15 % සම්පූර්ණ කර ඇත. සංවර්ධන කටයුතුවලින් පසු, ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිබල සැපයුම නිම කරනු ඇත |

15. වපෘතියේ නම:-වැලිඔය කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- මූලික යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සහ නව ආයෝජන අවස්ථා ඇති කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| යටිතල පහසුකම් සංවර්ධනය | පිවිසුම් මාර්ගය ඉදි කිරීම | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ 15 % සම්පූර්ණ කර ඇත. මාර්ගයේ බොරළු ඇතිරීම ආරම්භ කර ඇති අතර බෝක්කු ඉදි කරමින් පවතී. |
| | දම්වැල් සහිත වැට ආරක්ෂක කුටිය ඉදිකිරීම | | කණු සිටුවීම සහ දම්වැල් සහිත වැට ඉදිකිරීම 50% ක් අවසන් කර ඇත. |
| කර්මාන්ත ශාලා ගොඩනැගිලි 3 ක් ඉදි කිරීම | එකක් වර්ග අඩි 2000 සහිත ගොඩනැගිලි 3 ක් | ඉදිකළ කර්මාන්ත ශාලා ගොඩනැගිලි 3 ක් | සමස්ත ඉදිකිරීම් කටයුතු 50% ක් අවසන් කර ඇති අතර සහ වැඩ කටයුතු සිදු වෙමින් පවතී. |

16. ව්‍යාපෘතියේ නම:-මුසලි කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- මූලික යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සහ නව ආයෝජන අවස්ථා ඇති කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| යටිතල පහසුකම් සංවර්ධනය | යටිතල පහසුකම් (වැට, පොදු පහසුකම්, ආදිය) සම්පූර්ණ කරන ලදි. | වීථි ලාම්පු, වැට හා පොදු පහසුකම් සම්පූර්ණ කිරීම | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඉඩම මෙතෙක් අමාත්‍යාංශයට නිදහස් කර නැත |
| කර්මාන්ත ශාලා ගොඩනැගිලි 3 ක් ඉදි කිරීම | එකක් වර්ග අඩි 2000 සහිත ගොඩනැගිලි 3 ක් | කර්මාන්ත ශාලා ගොඩනැගිලි 3 ක් ඉදි කිරීම | |

17. ව්‍යාපෘතියේ නම:-දකුණ, වයඹ සහ බස්නාහිර පළාත් වල ජලය හා වායු තත්ත්වය පිලිබඳ නියමු - සමීක්ෂණය
ව්‍යාපෘති අරමුණ:-කර්මාන්තපුරවල පරිසර සංවර්ධන සහ දූෂණය පාලනය කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| **වයඹ පළාත** - පුහුණු සහ දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පවත්වාගෙන යාම හා වැඩසටහන් අධීක්ෂණය, බෙදා හැරීමේ පිරික්සුම් ලැයිස්තුව සංවර්ධනය | මූලික දත්ත සමීක්ෂණ | පරිසර හිතකාමී අයුරින් කර්මාන්ත පවත්වාගෙන | සමස්ත වැඩ 65% ක් අවසන් කර ඇති අතර අනෙකුත් වැඩ කටයුතු සිදු වෙමින් පවතී. |
| **බස්නාහිර පළාත** - පුහුණු සහ දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පවත්වාගෙන යාම හා වැඩසටහන් අධීක්ෂණය, බෙදා හැරීමේ පිරික්සුම් ලැයිස්තුව සංවර්ධනය | | | සමස්ත වැඩ 15% ක් අවසන් කර ඇති අතර අනෙකුත් වැඩ කටයුතු සිදු වෙමින් පවතී. |
| **දකුණු පළාත** - නියමු - සමීක්ෂණය, පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මූලික වැඩ කටයුතු | | | වැඩ කටයුතු සිදු වෙමින් පවතී. |

18. ව්‍යාපෘතියේ නම:- සියලුම කරමාන්තපුර සඳහා පොදු වියදම්
ව්‍යාපෘති අරමුණ:- පරිපාලනය හා සම්බන්ධ මූලික වගකීම් සම්පූර්ණ

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| සියලු පරිපාලන පිරිවැය ගෙවීම් | | නිසි පරිදි නිරවුල් කළ බිල්පත් සහ වියදම් | සම්පූර්ණ කරන ලදි. |

19. ව්‍යාපෘතියේ නම:-බට අත කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- ඉඩම් කැබලි හඳුනා ගැනීම සහ නව සංවර්ධනය කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ඉඩම් නිරවුල් කිරීම | අක්කර 55 | ඉඩම් නිරවුල්කරණය සම්පූර්ණ කිරීම | සම්පූර්ණ කරන ලදි. |
| ලෙවර් ගේට්ටුව ඉදිකිරීම | ලෙවර් ගේට්ටුව | ඉදි කළ ලෙවර් ගේට්ටුව | සම්පූර්ණ කරන ලදි. |

20. ව්‍යාපෘතියේ නම:-කරන්දෙනිය කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- මූලික යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සහ නව ආයෝජන අවස්ථා ඇති කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්රගතිය |
| ප්‍රධාන ගේට්ටුව ඉදි කිරීම | | ඉදි කළ ප්‍රධාන ගේට්ටුව | සම්පූර්ණ කරන ලදි. |
| වතුර ටැංකිය පිරිසිදු කිරීම | | පිරිසිදු කළ වතුර ටැංකිය | සම්පූර්ණ කරන ලදි. |
| විදුලිය සැපයීම | | විදුලි සබඳතා ලබා ගැනීම | සම්පූර්ණ කරන ලදි. |
| මුර කුටිය ඉදි කරීම | මුර කුටිය | ඉදි කළ මුර කුටිය | සම්පූර්ණ කරන ලදි. |

21. ව්‍යාපෘතියේ නම:-බුත්තල කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරය සඳහා නිසි ආරක්ෂාව සැපයීම සහ යටිතල පහසුකම් පවත්වා ගෙන යාම.

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| වීදි ලාම්පු ස්ථාපිත කිරීම | වීදි ලාම්පු 18 | ස්ථාපිත වීදි ලාම්පු 18 | සම්පූර්ණ කරන ලදි. |
| විදුලි සබඳතා | විදුලි සබඳතා | විදුලි සබඳතා සැපයීම | සම්පූර්ණ කරන ලදි. |

22. ව්‍යාපෘතියේ නම:-උඩුකව කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්ත ආරම්භ කිරීමට යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ලෙවර් ගේට්ටුව ඉදිකිරීම | ලෙවර් ගේට්ටුව | ලෙවර් ගේට්ටුව ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදි. |
| වැට ඉදිකිරීම | වැට | වැට ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදි. |
| වීදි ලාම්පු ස්ථාපිත කිරීම | වීදි ලාම්පු 11 | ස්ථාපිත වීදි ලාම්පු | සමස්ත වැඩවලින් 80% ක් අවසන් කර ඇත. |

23. ව්‍යාපෘතියේ නම: -මන්නාරම කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:-කාර්මාන්තපුරවල යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| විදුලිය සැපයීම | විදුලිය සැපයීම | විදුලි සබඳතා සම්පූර්ණ කිරීම | සම්පූර්ණ කරන ලදි. |

24. ව්‍යාපෘතියේ නම: -ලක්ෂ උයන කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්ත ආරම්භ කිරීමට යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ඉඩම් නිරවුල් කිරීම | අක්කර 55 | ඉඩම් නිරවුල්කරණය සම්පූර්ණ කිරීම | සම්පූර්ණ කරන ලදි. |

25. ව්‍යාපෘතියේ නම: -පුත්තලම කර්මාන්තපුරය (අදියර 11)
ව්‍යාපෘති අරමුණ:- ඉඩම් කොටස් සමඟ වැඩි දියුණු කළ යටිතල පහසුකම්

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ජල නළ අලුත්වැඩියා කිරීම | | වැඩි දියුණු කළ යටිතල පහසුකම් | සම්පූර්ණ කරන ලදි. |
| ඉඩම් නිරවුල් කිරීම | අක්කර 16 | ඉඩම් නිරවුල් කිරීම අවසන් කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| පරිපාලන ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීම | | වැඩ කටයුතු සම්පූර්ණ කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| වීදි ලාම්පු | | වැඩ කටයුතු සම්පූර්ණ කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |

26. ව්‍යාපෘතියේ නම: -ඇඹිලිපිටිය කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරවලට අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අභ්‍යන්තර කාණු පද්ධතිය පිරිසිදු කිරීම සහ වැසිකිළි දොර අලුත්වැඩියා කිරීම | වර්ග මීටර් (6300 X 1.43) කාණු පද්ධතිය | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| වැට සහ ආරක්ෂක මුර කුටියේ වහලය අලුත්වැඩියා කිරීම | 4500 Lft | | |

27. ව්‍යාපෘතියේ නම: -නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරවලට අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| වල හෑරීම | 3' X 5' X 5' | වලට එකතු කළ කාණු ජලය | සම්පූර්ණ කරන ලදි. |

28. ව්‍යාපෘතියේ නම: -තුල්හිරිය කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තපුරයේ භූමි පෙදෙස හඳුනා ගැනීම තහවුරු දියුණු කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| සමීක්ෂණය | | නිරවුල් කළ ඉඩම් කොටස් | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| IEE (පරිපාලන ගෙවීම්) | | | |

29. ව්‍යාපෘතියේ නම: -දංකොටුව කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්ත පුරවලට අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා සැලසුම් ඇඳීම | ජල පවිත්‍රාගාරයක | කර්මාන්තපුරය තුළ පිරිසිදු කළ වතුර | සම්පූර්ණ කරන ලදි. |
| විදුලිය සැපයීම | විදුලිය සැපයීම | විදුලිය සබඳතාවය | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |

30. ව්‍යාපෘතියේ නම: මාකඳුර (බටහිර) කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- මූලික යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශය තුළ නව ආයෝජන අවස්ථා ඇති කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| නැවත සමීක්ෂණය | | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| අභ්‍යන්තර මාර්ග – I | | කාපට් කළ පාර | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| අභ්‍යන්තර මාර්ග – II | | කාපට් කළ පාර | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| මාර්ගය දෙපස පැල සිටුවීම | | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| සේවා ගාස්තු මාරු කිරීම | | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | සම්පූර්ණ කරන ලදි |

31. ව්‍යාපෘතියේ නම: මාකඳුර (නැගෙනහිර) කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- මූලික යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශය තුළ නව ආයෝජන අවස්ථා ඇති කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| කාණු පද්ධතිය ඉදි කිරීම - I | | ඉදි කළ කාණු පද්ධතිය - I | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| කාණු පද්ධතිය ඉදි කිරීම - II | | ඉදි කළ කාණු පද්ධතිය - II | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |

32. ව්‍යාපෘතියේ නම: නාලන්ද (මාතලේ) කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තවල මූලික යටිතල පහසුකම් සහ ආරක්ෂාව ඉටු කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| පිවිසුම් ගේට්ටුව අළුත් වැඩියා කිරීම | | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| වීදි ලාම්පු ස්ථාපනය | වීදි ලාම්පු | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |

33. ව්‍යාපෘතියේ නම: -ත්‍රිකුණාමල) කර්මාන්තපුරය (අදියර 11)
ව්‍යාපෘති අරමුණ:- කර්මාන්තවල මූලික යටිතල පහසුකම් සැලසීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ජලය සැපයීම | | ජලය සැපයීම | සම්පූර්ණ කරන ලදි |

34. ව්‍යාපෘතියේ නම: මුසලි කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- මූලික යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශය තුළ නව ආයෝජන අවස්ථා ඇති කිරීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ජලය සැපයීම | | ජලය සැපයීම | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |

35. ව්‍යාපෘතියේ නම: -නවගම්පුර කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ - කර්මාන්තපුරයේ භූමි ප්‍රදේශ හදුනා ගැනීම සහ ග්‍රාමීය ප්‍රදේශය තුළ නව ආයෝජන අවස්ථා ඉහළ නැන්වීම

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| භූමි ප්‍රදේශය නිරවුල් කිරීම | | නිරවුල් කළ ඉඩම් කොටස් | වැඩ කටයුතු සිදු කරමින් පවතී. |

36. ව්‍යාපෘතියේ නම: උලපනේ කර්මාන්තපුරය
ව්‍යාපෘති අරමුණ:- මූලික යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

| **ක්‍රියාකාරකම** | **මැණුම් ඒකකය** | **භෞතික ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **ඉලක්කය** | **ප්‍රගතිය** |
| අභ්‍යන්තර මාර්ගය ඉදි කිරීම | | යෝජිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම | සම්පූර්ණ කරන ලදි |

# කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ පේෂ කර්මාන්ත සංවර්ධන අංශය

**හැඳින්වීම**

සුළු මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන හා පේෂ කර්මාන්ත සංවර්ධන අංශය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා ඇගළුම් හා පේෂ කර්මාන්තය සවිබල ගැන්වීම සඳහා නගා සිටුවීම සහ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, මූල්‍ය සම්පාදන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන ඵලදායිතාවය සහ ගුණාත්මකභාවය ඉහල නැංවීම සම්බන්ධ කටයුතු සිදු කරනු ලැබේ.

අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධන අංශය මගින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම මෙන්ම ග්‍රාමීය පළාත්වල පේෂ කර්මාන්ත ගම්මාන ඇති කිරීම, එම ගම්මානවලට අවශ්‍ය යන්ත්‍ර උපකරණ හා අවශ්‍ය පුහුණුව ලබා දීම, අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය උදෙසා නව තාක්ෂණය හඳුන්වා දීමේ අරමුණින් නවීණ වර්ණාගාර පහසුකම් සහිත අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම මෙන්ම
වෙළඳ පොළ ප්‍රවර්ධනය උදෙසා පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීමද සිදු කරනු ලැබේ.

ගෘහස්ථ ඇගළුම් නිෂ්පාදන කර්මාන්ත පිහිටුවීමේ වැඩසටහන යටතේ පොදු මිණිත හා ඒක මිණිත ඇගළුම් නිෂ්පාදනය තුළින් දේශීය ඇගළුම් අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ඇගළුම් කර්මාන්තය පදනම් කරගත් ගෘහ කර්මාන්ත ස්ථාපිත කිරීම අපේක්ෂිත වේ. ඇගළුම් ක්ෂේත්‍රයේ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ඇගළුම් කර්මාන්තශාලාවල නිෂ්පාදන කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහල නැංවීම, සේවකයින්ගේ ආකල්ප ගොඩනැංවීම සඳහා පුහුණු වැඩසටහන් මගින් අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු ලබයි. සුළු හා මධ්‍ය පරිමාණ ඇගළුම් ක්ෂේත්‍රයේ ඇගළුම් ආයතන වල කුසලතාවයන් සංවර්ධනය කිරීම හා තාක්ෂණික, කළමණාකරන පුහුණු වැඩසටහන යටතේ එම ඇගළුම් ආයතන සඳහා අවශ්‍ය පුහුණුව හා මගපෙන්වීම ලබා දෙනු ලැබේ.

ශ්‍රී ලංකා ආර්ථිකයට ක්‍රියාකාරි දායකත්වයක් ඇගළුම් අපනයන කර්මාන්තය මගින් ඇති කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ ජීවත් වන කාන්තාවන් සැලකියයුතු සංඛ්‍යාවකට සෘජු රැකියා අවස්ථා උදා කර දීම මෙමඟින් සිදු කරනු ලබයි. පේෂ කර්මාන්ත අංශය, ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණය වෙමින් නව පියවරක් ලෙස රෙදි පිළි අපනයන පිළිබඳව අන්තර්ජාලය හරහා ස්වයංක්‍රීයව සම්බන්ධීකරණය වීමේ පහසුකමක් හඳුන්වා දී ඇත.(ASYCUDA SYSTEM)එමඟින් අපනයන කරුවන්ගේ කාලය සහ සම්පත් නාස්තිය වළක්වාලීමේ පියවරක් ලෙස මෙම පහසුකම් හඳුන්වා දී ඇත.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ශ්‍රී ලංකා රජයේ සමස්ත අරමුණු තුළ වැදගත් ක්‍රමෝපායික අංශයක් ලෙස හඳුනාගෙන ඇති අතර සියලු අංශ ඇතුළත් වන ආර්ථික වර්ධන ප්‍රදේශ සංවර්ධනය, රැකියා උත්පාදනය හා දිළිඳුකම පහත හෙළිම සඳහා වූ ගාමක බලය ලෙස සැලකේ.කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට උපකාර කිරිමත් දැනට ඇති ව්‍යවසායකයන් ශක්තිමත් කිරිමටත් සාර්ථකව පැවතීමේ විභවය සහිත, එහෙත් දුෂ්කර තත්වයක පසුවන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රතිකර්ම වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහාත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රතිපත්ති රාමුවක් මෙම අමාත්‍යාංශය මගින් සකසා ඇත. මෙම ප්‍රතිපත්ති රාමුවේ දැක්ම වන්නේ ජාතික ආර්ථික සංවර්ධනයට දායක වන ගෝලීය

වශයෙන් තරගකාරි, ජවසම්පන්න, නව්‍ය, තාක්ෂණ, පරිසර හිතකාමි හා තිරසාර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් බිහි කිරිමයි.

මෙකී ප්‍රතිපත්ති රාමුවට අදාලව සකසා ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විට ලැබී ඇත. ඒ අනුව, මුදල් අමාත්‍යාංශය, මධ්‍යම බැංකුව, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමග එක්ව ඉදිරියේදී එම ක්‍රියාකාරී සැලැස්මට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ.

**2016 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රගතිය**

| **1. පේෂ කර්මාන්ත සංවර්ධන අංශය** | | | |
|---|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **මිණුම් ඒකකය** | **භෞතික ප්‍රගතිය** | |
| | | **ඉලක්ක%** | **ප්‍රගතිය** |
| 1.1. පේෂ කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන | *පේෂ කර්මාන්ත ගම්මාන 15ක් ස්ථාපිත කිරීම හා පේෂ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම | * පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 15ක් ස්ථාපිත කිරීම හා සංවර්ධනය කිරීම | (1)*පේෂ කර්මාන්ත ගම්මාන 16ක කර්මාන්ත 295ක් ස්ථාපිත කර ඇත. (කෑගල්ල, තිස්සමහාරාම, මරදමුණේ, වාලච්චේන, දෙහිඅත්තකණ්ඩිය, හිගුරක්ගොඩ, පොල්ගොල්ල )<br>(ii)පාලමුනේ මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කර ජනතා අයිතියට පත් කර ඇත<br>(iii) කටුබැද්ද ශ්‍රවණාගාරය සංවර්ධනය කිරීම |
| 1.2. අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය නගා සිටුවීමේ වැඩසටහන<br>1.3. දකුණු පළාතේ පේෂ කර්මාන්ත වර්ණාගාරය ස්ථාපිත කිරීම.<br>1.4. පේෂ කර්මාන්ත ප්‍රදර්ශන පැවැත්වීම | *පේෂ කර්මාන්ත ප්‍රදර්ශන පැවැත්වීම<br>* වියන්නන් සඳහා අත් යන්ත්‍ර හා උපකරණ ප්‍රදානය කිරීම. | * පළාත් මට්ටටමින් පේෂ කර්මාන්ත ප්‍රදර්ශන 09ක් පැවැත්වීම<br>* ප්‍රතිලාභීන් 147ක් සඳහා සඳහා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>* නැගෙනහිර පළාතේ ප්‍රතිලාභීන් | *දකුණු පළාතේ වර්ණාගාරයක් ස්ථාපිත කර ඇත.<br>*රන්සළු ප්‍රදර්ශන 09ක් පවත්වා ඇත<br>**සමුපකාර සමිති 11ක ප්‍රතිලාභීන් 147ක් සඳහා යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන ඇත<br>* නැගෙනහිර පළාතේ ප්‍රතිලාභීන් 152ක් සඳහා යන්ත්‍ර උපකරන සහ අවශ්‍ය පුහුණුව ලබා දීම |

| | | | |
|---|---|---|---|
| 1.5. ප්‍රාදේශිය මට්ටමින් පේෂ කර්මාන්ත සංවර්ධන වැඩසටහන් පැවැත්වීම<br>1.6. පේෂ කර්මාන්ත සමුපකාර සමිති සංවර්ධනය කිරීම | | 152ක් සඳහා යන්ත්‍ර උපකරන සහ අවශ්‍ය පුහුණුව ලබා දීම | |
| **(2)පේෂ කර්මාන්ත හා ඇගළුම් අංශය** | | | |
| 2.1. ගෘහස්ත ඇගළුම් නිෂ්පාදන සංවර්ධනය කිරීමේ වැඩසටහන | *ගෘහස්ත ඇගළුම් කර්මාන්ත 12ක් ස්ථාපිත කිරීම | *ගෘහස්ත ඇගළුම් කර්මාන්ත ස්ථාපිත කිරීම හා ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | * කුරුණෑගල මධ්‍යස්ථාන 07ක් ස්ථාපිත කිරීම.<br>* නුවර මධ්‍යස්ථාන 01ක්ද, අම්පාර මධ්‍යස්ථාන 04 ක් සහ වවුනියාවේ මධ්‍යස්ථාන 05ක් ද ස්ථාපිත කර ඇත. |
| 2.2 සුළු හා මධ්‍ය පරිමාණ ඇගළුම් ක්ෂේත්‍රයේ ඵලදායිතාවය ඉහල නැංවීමේ වැඩසටහන . | *කර්මාන්තකරුවන් සඳහා වැඩසටහන් 09ක් පැවැත්වීම. | *ඵලදායිතා වර්ධන වැඩසටහන් 09ක් පැවැත්වීම | *සුළු හා මධ්‍ය පරිමාණ ඇගළුම් ආයතන 07ක කර්මාන්තකරුවන් 513ක් සඳහා වැඩසටහන් 09ක් පවත්වා ඇත. |
| 2.3. සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ ඇගළුම් ආයතනවල කුසලතාවයන් සංවර්ධනය කිරීම හා තාක්ෂණික හා කළමණාකරන පුහුණුව | *ආයතන 21 ක් සඳහා පුහුණු වැඩසටහන් 21ක් පැවැත්වීම. | *කලමණාකරන පුහුණු වැඩසටහන් 21ක් පැවැත්වීම | *ආයතන19ක කර්මාන්තකරුවන් 764ක් සඳහා පුහුණු වැඩසටහන් 21ක් පවත්වා ඇත. |
| 2.4.කෙසෙල් කෙදි ආශ්‍රිත නූල් නිෂ්පාදනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | *නව නූල් ප්‍ර භේදයක් පේෂ කර්මාන්තයට හඳුන්වා දීම. | *කෙසෙල් කෙදි ආශ්‍රිතව සැකසූ නූල් පේෂ කර්මාන්තය වෙත හඳුන්වා දීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදු කිරීම | කෙසෙල් කෙදි ආශ්‍රිතව සැකසූ නූල් භාවිතයෙන් නිෂ්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. |

| 3.සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය | | | |
|---|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **ඒකක සංඛ්‍යාව** | **භෞතික ප්‍රගතිය** | |
| | | **ඉලක්ක** | **ප්‍රගතිය** |
| **3.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුවපිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන** | ව්‍යවසායකයින් සම්බන්ධ කර ගනිමින් වැඩසටහන් පැවැත්වීම | සුළු හා මධ්‍ය පරිමාණ **ව්‍යවසායකයින්** සම්බන්ධ කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු පැවැත්වීම | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පැවැති ව්‍යාපාරික ප්‍රදර්ශනය ඇතුළුව වැඩ සටහන් 04ක් පැවැත්වීම |
| **3.2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාල ක්‍රියාකාරී සැලැස්ම සැකසීම** | *සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ මැදිහත්වීමේ ක්ෂේත්‍ර 06 ඇතුලත් වන පරිදි ක්‍රියාකාරී සැලසුම සම්පාදනය කිරීම. | *ක්‍රියාකාරී සැලසුම සම්පාදනය කිරීම. | *ක්‍රියාකාරී සැලසුම සම්පාදනය කිරීම හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම. |
| **3.3. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාල ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.** | *සංවර්ධිත කර්මාන්තකරුවන් සංඛ්‍යාව | *කර්මාන්තකරුවන් 05 සංවර්ධනය කිරීම | *කර්මාන්තකරුවන් 05 සංවර්ධනය කිරීම |
| | *සහතික ලත් කර්මාන්ත සංඛ්‍යාව | *කර්මාන්තකරුවන් 05 ක් සඳහා ISO 14001 සහකතිකය ලබා දීම | *කර්මාන්තකරුවන් 05 ක් සඳහා ISO 14001 සහකතිකය ලබා ගැනීම |
| | *පුහුණු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | *ප්‍රතිලාභීන් 200 සඳහා තාක්ෂණික පුහුණුව ලබා දීම | *ප්‍රතිලාභීන් 200 සඳහා තාක්ෂණික පුහුණුව ලබා ගැනීම. |
| | *ඇගයීමට ලක් වූ කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව | *විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨතාවය දැක්වූ කාන්තා ව්‍යවසායකයින් 20 හඳුනා ගැනීම හා සම්මාන ප්‍රධානය කිරීම. | *ජාතික ආර්ථිකට දායකත්වය සපයමින් විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨතාවය දැක්වූ කාන්තා ව්‍යවසායකයින් 20 සඳහා සම්මාන ප්‍රධානය කිරීම තුලින් ඔවුන් ඇගයීම හා අභිප්‍රේරණය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | *ඇගයීමට ලක් වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව | *ප්‍රාදේශීය වශයෙන් දක්ෂතා දැක්වූ ව්‍යයවසායකයින් 117 ක් හා ජාතික මට්ටමේ විශිෂ්ඨතා දැක්වූ ව්‍යවසායකයින් 25 ක් සඳහා සම්මාන පිරි නැමීම. | *ප්‍රාදේශීය වශයෙන් දක්ෂතා දැක්වූ ව්‍යයවසායකයින් 117 ක් හා ජාතික මට්ටමේ විශිෂ්ඨතා දැක්වූ ව්‍යවසායකයින් 25 ක් සඳහා සම්මාන පිරි නැමීම. |
| **3.4.** මාකඳුර (බටහිර) **කර්මාන්තපුර පෙර වැඩුම් මධ්‍යස්ථානය සහ තාත්ෂණික හුවමාරු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම** | *සංවර්ධනය කල ව්‍යවසායකයින් සංඛ්‍යාව | *මධ්‍යස්ථානය සඳහාඋපකරණ මිලදී ගැනීම | * මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම නිම කර ඇත.<br>* මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම |
| **ක්‍රියාකාරකම්** | **ඒකක සංඛ්‍යාව** | **භෞතික ප්‍රගතිය** | |
| | | **ඉලක්ක** | **ප්‍රගතිය** |
| **3.5.** ව්‍යවසායකත්ව ගම්මාන හා කාන්තා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන | **1. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ⁕කර්මාන්ත ගම්මින සංවර්ධනය කිරීම - කම්මල්/කජු/ස්වර්ණාභරන / මැටි සහ කොහු නිෂ්පාදන ගම්මාන** | **⁕ප්‍රතිලාභීන් සඳහා උපකරණ මිලදී ගැනීම** | **⁕ මාතර පරවෙහෙර ගම්මානය - .ප්‍රතිලාභීන් 55ක් සඳහා උපකරණ මිලදී ගෙන ඇත** |
| | | **⁕ තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම**<br>**⁕කළමණාකරන පුහුණු වැඩසටහන් පැවැත්වීම.** | * මුලතිවු - මුලයාවලෙයි ගම්මානය - ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණික හා කළමණාකරන පුහුණු වැඩසටහන් පවත්වා ඇත.<br>* කජු ගම්මානය සඳහා කජු පොතු ඉවත් කරන යන්ත්‍රයක් හා කජු අඹරන යන්ත්‍රයක් මිලදී ගෙන ඇත. |
| | | | * නුවර - පිටවල - මැටිගම්මානය සඳහා පග්මිල් යන්ත්‍රයක් මිලට ගැනීම<br>*තාක්ෂණික/කළමණාකරන පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>*විදුලි සකපෝරු 25ක් මිලදී ගැනිම<br>*ප්‍රතිලාභින් සඳහා සෙවිළි වහලවල් 25ක් ලබා දීම |
| | | | * කළුතර - ඉළිඹ -ගම්මානය සඳහා කොහු යන්ත්‍ර 20ක් මිලට ගැනීම |
| | | | |

| | | | |
|---|---|---|---|
| | | | * මඩකලපුව - පරතිවුපත්තු ගම්මානය -.ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණික හා කළමණාකරන පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>*.පෙන්ඩන්ට් මෝටර්ස් 225ක් මිලදී ගැනීම. |
| | | | *කුරුණෑගල - පහළගම ගම්මානය - ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණික හා කළමණාකරන පුහුණු වැඩසටහන් පැවැත්වීම. *විදුලි මැටි අඹරන යන්ත්‍ර 10ක් මිලදී ගැනීම |
| | | | |
| | **2.ජාතික ශිල්ප සභාව**<br>*තල් හා මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානවල ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, නව නිර්මාණ හඳුන්වා දීම | **⁎සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන අදාල අංශයෙහි වඩා ශක්තිමත් ගම්මාන බවට පත් කිරීම** | *පෙසාලේ, නරවිලිකුලම් සහ මොලගොඩ යන ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>* යන්ත්‍ර උපකරන සහ අමුද්‍රව්‍ය ලබා දීම<br>* ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා තල් සංවර්ධන මණ්ඩලය එක්ව පුහුණු වැඩසටහන් 02ක් පැවැත්වීම<br>*ව්‍යාවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම |
| | **3. ජාතික මෝස්තර මධ්‍යස්ථානය**<br>**⁎කොහු/තල්/ඇගළුම්/** මැටි හා **වේවැල් ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.** | **⁎කර්මාන්තකරුවන් සඳහා පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම.**<br>**⁎නායකත්ව පුහුණු හා වෙළඳපොළ සම්බන්ධතා පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.** | *නව මෝස්තර නිර්මාණ 38ක් හඳුන්වා දීම.<br>*මූලා දර්ශන 182ක් හඳුන්වා දීම<br>*පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම<br>*නායකත්ව පුහුණු හා වෙළඳපොළ සම්බන්ධතා පිළිබඳ පුහුණු වැඩසටහන් 05ක් පැවැත්වීම. |

# ආංශික සංවර්ධන අංශ

# සංවර්ධන අංශ - I

**හැඳින්වීම**

කෘෂි නිෂ්පාදන පදනම්කරගත් කර්මාන්ත අංශයන්හි නිෂ්පාදන තුලින් වැඩි වාසිදායක තත්වයන් ලබාගත හැකි අංශ ලෙස තේ, කුළුබඩු, ආහාර සැකසුම් සහ ඇසුරුම් යනුවෙන් අංශ 05 කට වර්ග කොට සංවර්ධන අංශ 1 යටතේ එම නිෂ්පාදන කර්මාන්ත සඳහා සේවා පහසුකම් සපයනු ලබයි. එම ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම මඟින් රැකියා උත්පාදනය, දැනුම හා කුසලතා ඉහල නැංවීම, දේශීය පරිභෝජන අවශ්‍යතා ශක්තිමත් කිරීම සහ අපනයන සංවර්ධන සිදුකර ඒතුලින් විශේෂිත වාසි ලබා ගැනීමට අපේක්ෂා කරයි. මෙම අංශයන්හි කර්මාන්ත සංවර්ධනය සඳහා නිෂ්පාදන ඉහල නැංවීම, තත්ත්වය ඉහල නැංවීම, ඵලදායිතාවය ඉහල නැංවීම හා තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය අදාල අනෙකුත් ආයතනද සමඟ එක්ව විවිධ සංවර්ධන වැඩසටහන් දියත් කරයි.

**ප්‍රධාන අරමුණු**

1. ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරිත්වයට මුහුණදිය හැකි ගුණාත්මක තත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශිය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
2. දේශිය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම.

**සංවර්ධන අංශ 1 යටතේ පවතින කර්මාන්ත අංශ**

- සැකසූ ආහාර කර්මාන්ත අංශය
- ඇසුරුම් ද්‍රව්‍ය කර්මාන්ත අංශය
- කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය
- අගය එකතු කළ තේ කර්මාන්ත අංශය
- අගය එකතු කළ කොහු කර්මාන්ත අංශය

**ක්‍රියාකාරකම්**

- ඉදිරි වර්ෂයන් සඳහා සැලසුම්කර ඇති සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ දැක්වෙන අදාල ක්ෂේත්‍රයන් සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ විද්වත් මණ්ඩල වලින් සැදුම්ලත් උපදේශක කමිටුවල උපදේශකත්වයෙන් සංවර්ධන සැළසුම් හා උපාය මාර්ග පිලියෙළ කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- අදාළ අංශයන්හි නිෂ්පාදන හා අලෙවිය ආශ්‍රිත ගෝලීය ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ඒවායෙහි උපයෝගීත්වයෙන් සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා එතුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- දේශීය සහ විදේශීය කාර්මික ආයතන මඟින් කර්මාන්ත සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ පුහුණුව සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.
- කර්මාන්තකරුවන් හා විශ්ව විද්‍යාල / පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් නව තාක්ෂණික දැනුම හුවමාරු කිරීම සහ ඒතුළින් භාණ්ඩ විවිධාංගීකරණය සඳහා පහසුකම් සැළසීම.
- දේශිය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස් කර ගැනීමට සහය වීම.
- භාණ්ඩ අපනයනය දිරිමත්කිරීමේ අරමුණින් අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය තත්ව සහතික, කර්මාන්ත සඳහා හඳුන්වාදීම හා ඒවා ලබාගැනීමට උපකාර කිරීම.

**2016 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රගතිය**

**ව්‍යාපෘතියේ නම :** ''ලංකා පැක්'' ජාත්‍යන්තර ඇසුරුම් ප්‍රදර්ශනය - 2016

**අරමුණ** : දේශීය ඇසුරුම් ක්ෂේත්‍රයේ කර්මාන්ත සඳහා වෙළඳ පොළ ප්‍රවර්ධනය

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය | ප්‍රතිපාදන (රු. මි) | වැය (රු. මි) |
| ක්‍රියාත්මක කරනු ලබන ආයතන සමඟ | ප්‍රදර්ශනයට සහභාගි වූ කර්මාන්තකරුවන් | ඇසුරුම් කර්මාන්තයේ 150 දෙනෙකු | ඇසුරුම් කර්මාන්තයේ 150 දෙනෙකගේ | 2.0 | 2.0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| එක්ව ප්‍රදර්ශනය සංවිධානය කිරීම | සංඛ්‍යාව | පමණ ප්‍රදර්ශනයට සහභාගි කරවීම | සහභාගිත්වයෙන් ප්‍රදර්ශනය පැවැත්වීම | | |

**ව්‍යාපෘතියේ නම :** ඇසුරුම් තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පුහුණු පාඨමාලාව

**අරමුණ :** ඇසුරුම් කර්මාන්තයේ තාක්ෂණ ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීම හා නව තාක්ෂණය හඳුන්වාදීම

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය | ප්‍රතිපාදන (රු. මි) | වැය (රු. මි) |
| සුදුසු පාඨමාලාව සංවිධානය කිරීම<br><br>පුවත්පත් දැන්වීම පලකිරීම හා අයදුම්කරුවන් තෝරාගැනීම<br><br>වැඩසටහන පැවැත්වීම | පුහුණුලාභීන් සංඛ්‍යාව | ඇසුරුම් කර්මාන්තයේ තාක්ෂණවේදීන් 30 දෙනෙකු පුහුණු කිරීම | ඇසුරුම් කර්මාන්තයේ තාක්ෂණවේදීන් 30 දෙනෙකු පුහුණුව ලැබීම | 0.9* | 0.533 |

* පුහුණුකරුවන් ප්‍රවර්ධන කිරීමේ වැඩසටහන සඳහා රු. මිලියන 0.337 ක් ඉහත ප්‍රතිපාදන වලින් ලබාදීම

**ව්‍යාපෘතියේ නම :** ආහාර සුරක්ෂිතතා තත්ව සහතිකකරණ වැඩසටහන

**අරමුණ :** සැකසූ ආහාර කර්මාන්තය සඳහා ආහාර සුරක්ෂිතතාවය/ ගුණාත්මකභාවය තහවුරු කිරීමට ජාත්‍යන්තර තත්ව සහතික (SLS, GMP, HACCP හෝ ISO 22000 යන සහතික) ලබාගැනීම සඳහා අනුග්‍රහය දැක්වීම

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය | ප්‍රතිපාදන (රු. මි) | වැය (රු. මි) |
| පුවත්පත් දැන්වීම පලකිරීම හා අයදුම්පත් ගෙන්වා ගැනීම<br><br>සුදුසු කර්මාන්තකරුවන් තෝරා ගැනීම හා දැනුවත් කිරීම<br><br>වැඩසටහන ආරම්භකිරීම හා මෙහෙයවීම<br><br>සහතික පත් වියදම් ප්‍රතිපූරණය | සහතිකකරණ ක්‍රියාවලින් සම්පූර්ණ කරන ලද කර්මාන්ත සංඛ්‍යාව | කර්මාන්ත 20 සඳහා ජාත්‍යන්තර තත්ව සහතික ලබාගැනීමට පහසුකම් සැපයීම | කර්මාන්ත 18 සඳහා සහතික පත් ලබාගැනීමට අනුග්‍රහය ලබාදීම | 4.0 ** | 2.34 |

** ආහාර ඇසුරුම්කරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා රු. මි. 0.5 ක් ඉහත සඳහන් ප්‍රතිපාදන වලින් ලබා දීම.

**ව්‍යාපෘතියේ නම :** සැකසූ ආහාර හා ඇසුරුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනය

**අරමුණ :** සැකසූ ආහාර හා ඇසුරුම් කර්මාන්තයේ නිෂ්පාදකයින් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා ලබාදීම හා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා අනුග්‍රහය ලබාදීම

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය | ප්‍රතිපාදන (රු. මි) | වැය (රු. මි) |
| ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා මූලික සාකච්ඡා පැවැත්වීම<br><br>පුවත්පත් දැන්වීම පලකිරීම<br><br>ප්‍රදර්ශනය පැවැත්වීම | ප්‍රදර්ශනයට සහභාගි වූ කර්මාන්ත සංඛ්‍යාව | කර්මාන්ත 200ක සහභාගිත්වයෙන් ප්‍රදර්ශනය පැවැත්වීම | කර්මාන්ත 200ට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් ප්‍රදර්ශනය පැවැත්වීම. | 2.0 *** | 1.58 |

*** ආයුර්වේද ප්‍රදර්ශනය සඳහා ඉහත ප්‍රතිපාදන වලින් රු.මි. 0.5ක් වියදම් කිරීම

**ව්‍යාපෘතියේ නම :** කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුහුණුකරුවන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

**අරමුණ :** ඇසුරුම්වල තත්වය ඉහල නැංවීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලට සහාය වීම

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය | ප්‍රතිපාදන (රු. මි) | වැය (රු. මි) |
| පුහුණුව පවත්වාගෙන යාම | පුහුණුලාභීන් සංඛ්‍යාව | සියළුම දිස්ත්‍රික්ක වල ව්‍යවසාය ප්‍රවර්ධන කළමනාකරුවන් 25 ක් පුහුණුකිරීම | පුහුණුව සාර්ථකව පවත්වා පුහුණුලාභීන් 25 දෙනෙකු ප්‍රවර්ධනය කිරීම | | 0.337 |

**ව්‍යාපෘතියේ නම :** ආහාර ඇසුරුම්කරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

**අරමුණ :** දේශීය ඇසුරුම් කර්මාන්තකරුවන් සහ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ට නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීම

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය | ප්‍රතිපාදන (රු. මි) | වැය (රු. මි) |
| සම්මන්ත්‍රණය පැවැත්වීම | පැමිණි සංඛ්‍යාව | කර්මාන්තකරුවන් සහ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන් 90 දෙනෙකුට පමණ නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීම | සහභාගිවන්නන් 90 දෙනෙකුගෙන් සමන්විතව සම්මන්ත්‍රණය පැවැත්වීම | | 0.5 |

**ව්‍යාපෘතියේ නම :** වෙනත් ප්‍රදර්ශන

**අරමුණ :** නිෂ්පාදකයින් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා ලබාදීම හා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා අනුග්‍රහය ලබාදීම

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය | ප්‍රතිපාදන (රු. මි) | වැය (රු. මි) |
| ආයුර්වේද එක්ස්පෝ පැවැත්වීමට අවශ්‍ය සහයෝගය ලබා දීම. | ප්‍රදර්ශකයින් සංඛ්‍යාව | දේශීය හා විදේශීය ව්‍යවසායකයින් සහභාගිත්වයෙන් ප්‍රදර්ශනය පැවැත්වීම | ප්‍රේක්ෂකයන් 40000 සහභාගි වීයග<br><br>දේශීය හා විදේශීය ව්‍යවසායකයින් 135 ගේ සහභාගිත්වයෙන් ප්‍රදර්ශනය පැවැත්වීම | | 0.5 |

# සංවර්ධන අංශ 11

## හැඳින්වීම

දේශීය කර්මාන්ත අංශයන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත් ඒ මඟින් උසස් නිමැවුමෙන් හා ගුණාත්මක භාවයෙන් යුක්ත වූ භාණ්ඩ බිහිකරමින් ජාත්‍යන්තර වෙළෙඳ පොල ජය ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

**අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ**

- අච්චු හා තෙරපුම් අච්චු කර්මාන්ත
- රබර් ආශ්‍රිත කර්මාන්ත
- යන්ත්‍රෝපකරණ හා මූලික ලෝහ කර්මාන්ත
- බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත
- වාහන නිෂ්පාදන හා ප්‍රවාහන උපකරණ නිෂ්පාදන කර්මාන්ත
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- දෘෂ්ටි හා ඡායාරූප නිෂ්පාදන කර්මාන්ත

**ප්‍රධාන කාර්යයන්**

- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ දී රාජ්‍ය අංශය, අධ්‍යාපනඥයින් සහ කර්මාන්තකරුවන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.
- තාක්ෂණික කළමනාකරණ හා නිෂ්පාදනයට අදාල ගැටළු අවබෝධ කර ගැනීම හා අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැපයීම.
- දේශීය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීමේදී දේශීය විදේශීය වාණිජ මණ්ඩල, රාජ්‍ය අංශයට අයත් ආයතන සමාගම් හා කර්මාන්ත සංවර්ධනයට ආධාර ලබාදෙන වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය.
- ඵලදායිතාවය නැංවීම හා එකතු කල අගය වැඩි කිරීම සඳහා උසස් තාක්ෂණික ක්‍රමෝපායයන් හඳුන්වා දීම සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සේවා නියුක්තව සිටින ශ්‍රමිකයන්ගේ හැකියාවන් සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණුව ලබාදීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

■ බෝට්ටු නිෂ්පාදන අංශය

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| බෝට්ටු නිෂ්පාදන අංශයේ සංවර්ධන උදෙසා බෝට්ටු ප්‍රදර්ශනයක් (Boat Show) පවත්වන ලදී. | දේශීය හා විදේශීය බෝට්ටු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියැලි ආයතන | බෝට්ටු නිෂ්පාදන අංශයේ සංවර්ධනය උදෙසා | දේශීය හා විදේශීය බෝට්ටු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියැලි ආයතන 34ක් සහභාගි වී ඇත. ඒ සඳහා අප අමාත්‍යාංශය මඟින් රු.මි. 2 ක් ලබා දෙනු ලැබීය. |

•රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීමේ වැඩ සටහන | සහභාගි වී තාක්ෂණික ශිල්පීන් සංඛ්‍යාව | තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා | සඳහා දින 07 ක පුහුණු පාඨමාලාවක් ඉන්දියාවේ කොචින් විශ්ව විද්‍යාලයේ පැවැත්වීමට කටයුතු ලදී |

- ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන අංශය

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීමේ වැඩ සටහන | සහභාගි වී තාක්ෂණික ශිල්පීන් සංඛ්‍යාව | තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා | පොලිමර් විද්‍යා හා තාක්ෂණ උපාධි පාඨමාලාව හදාරන උපාධි අපේක්ෂකයන් 19 දෙනෙකු තෝරාගෙන ඇති |

• දැව ආශ්‍රිත කර්මාන්ත අංශය

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීමේ වැඩ සටහන | සහභාගි වී තාක්ෂණික ශිල්පීන් සංඛ්‍යාව | දැව අංශයේ නියැලි තාක්ෂණ ශිල්පීන් සඳහා නව තාක්ෂණය භාවිතය පිළිබඳ දේශීය හා විදේශීය පුහුණුවක් ලබා දීමට අපේක්ෂා කරයි. | කර්මාන්තයේ නියැලි සිටින තාක්ෂණික ශිල්පීන් 300 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් කාර්මික සංවර්ධන මණ්ඩලයේ දායකත්වයෙන් පවත්වන ලදී. |

- **රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය**

| ක්‍රියාකාරකම | මැණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීමේ වැඩ සටහන | . | කර්මාන්ත අංශයේ ඵලදායිතාව හා තරඟකාරිත්වය සඳහා රොබෝ තාක්ෂණය භාවිතා කිරීමේ ඇති අවශ්‍යතාවය | පස් අවුරුදු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතිය සඳහා රජය රු.මි. 80 ක ප්‍රතිපාදන ලබාදීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර රු.මි. 30 ක ප්‍රතිපාදන මේ සඳහා දැනටමත් ලබාදී ඇත. |

# සංවර්ධන අංශ 111

## හැඳින්වීම

ජාත්‍යන්තර වෙළෙඳපල තරඟකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහත සඳහන් කර්මාන්ත උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

**අංශයේ වගකීම යටතේ පවත්නා කර්මාන්ත අංශ**

- පාවහන්
- සම් භාණ්ඩ
- පිඟන් භාණ්ඩ
- විද්‍යුත් හා විදුලි උපකරණ
- ඖෂධ හා සුවඳ විලවුන් කර්මාන්තය
- තීන්ත හා මුද්‍රණ කටයුතු කර්මාන්තය
- රසායන ද්‍රව්‍ය/රෙදිපිළි නිෂ්පාදනය සඳහා වූ අමතර කොටස්/අනෙකුත් කර්මාන්ත

## ප්‍රධාන කාර්යභාරය

- අමාත්‍යාංශ උපදේශක සභා රැස්වීම් කැඳවීම, සංවර්ධන උපාය මාර්ග සාකච්ඡා කිරීම හා ඒවාට අවශ්‍ය උපදෙස් ලබාදීම හා ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත අංශ සඳහා සංවර්ධන සැලසුම් සහ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- රේඛීය අමාත්‍යාංශ, වෙළෙඳ සංගම්, සම්මේලන හා විශ්වවිද්‍යාල සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතියට කටයුතු කිරීම.
- තෝරා ගනු ලැබූ කර්මාන්ත අංශයන් හි කුසලතා වර්ධනය සඳහා පහසුකම් සැලසීම.

- නිදහස් වෙළෙඳ ගිවිසුම් තුලින් තම වෙළෙඳපල කොටස ඉහළ නංවා ගැනීමට කර්මාන්තකරුවන් දැනුවත් කිරීම.
- ආයෝජන ප්‍රවර්ධන හා අළෙවිකරණ කටයුතු සඳහා උපදේශන සේවා සැපයීම.
    - අපනයන දිරිගැන්වීම සඳහා තාවකාලික ආනයන, අපනයන ක්‍රියාවලිය (TIEP) මඟින් පහසුකම් සැලසීම හා කර්මාන්ත සඳහා අවශ්‍ය විදේශීය විශේෂඥයින් වෙනුවෙන් වාස වීසා නිර්දේශ කිරීම.
    - දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ජාත්‍යන්තර වෙළෙඳපල තරගකාරීත්වයට මුහුණ දීම සඳහා දේශීය නිෂ්පාදන කර්මාන්ත වලට අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

- **පාවහන් හා සම්භාණ්ඩ කර්මාන්තය**

- **රත්මලාන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය තුළ පිහිටුවා ඇති පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදන පුහුණු ආයතනය**

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| ජාත්‍යන්තර තලයේ පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම. | 1. නව විදේශීය ගැනුම් කරුවන් සංඛ්‍යාව<br>2. ප්‍රදර්ශණ කුටි සංඛ්‍යාව<br>3. ප්‍රදර්ශණය නැරඹීමට සහභාගීවූවන් සංඛ්‍යාව | 1. නව විදේශීය ගැනුම් කරුවන් ප්‍රදර්ශණයට සහභාගී කරවා ගැනීම<br>2. ප්‍රදර්ශණය නැරඹීමට පැමිනෙන සංඛ්‍යාව ඉහළ නැංවීම | ප්‍රදර්ශන කුටි 131 කින් සමන්විත වූ මෙම ප්‍රදර්ශනය සඳහා විදේශීය ගැනුම්කරුවන් 16 දෙනෙක් ද දේශීය නරඹන්නන් විශාල පිරිසක් ද සහභාගී වී ඇත |
| - සම් නිෂ්පාදන කර්මාන්ත සඳහාම වෙන් වූ කර්මාන්ත පුරයක් පිහිටුවීම | ඇස්තමේන්තුගත මුළු වියදම | නව තාක්ෂණික දැනුමින් යුත් ශ්‍රමිකයින් පුහුණු කිරිම ස | මේ වන විට එහි මූලික වැඩ කටයුතු ද ආරම්භ කර ඇත |

- **ඖෂධ හා සුවඳ විලවුන් අංශය**

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| විදේශ විශේෂඥයින් මගින්, ඖෂධ නිෂ්පාදන කර්මාන්තයේ නියුක්ත වන්නන් සඳහා පුහුණුවීම් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. | | රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ මිලදී ගැනීමේ දී දේශීය නිෂ්පාදකයින්ගෙන් ලබා ගන්නා ප්‍රමාණය ඉහල නැංවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ | ඖෂධ නිෂ්පාදන කර්මාන්ත සඳහාම විශේෂිත වූ කර්මාන්තපුරයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇත. |

- **විදුලි හා විද්‍යුත් භාණ්ඩ අංශය**

| **ක්‍රියාකාරකම** | **මිනුම් ඒකකය** | **භෞතික ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **ඉලක්ක** | **ප්‍රගතිය** |
| දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා ජාත්‍යාන්තරව පිළිගත් ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම<br><br>- **විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ නව නිර්මාණ එළි දැක්වීමේ ප්‍රදර්ශනය (INCO ප්‍රදර්ශනය)** | | දේශීය නිෂ්පාදන සඳහා අන්තර්ජාතිකව පිළිගත් වෙළෙඳපොලක්<br><br>නව තාක්ෂණික නිර්මාණ එළි දැක්වීමට අවශ්‍ය අනුග්‍රහය ලබා දීම සිදුවේ. | මේ සඳහා රු. මි. 15.80 ක මුදලක් වෙන්කර ඇත.<br><br>ප්‍රදර්ශන කුටි 278 කින් සමන්විත වූ මෙම ප්‍රදර්ශනය සාර්ථකව පවත්වන ලද අතර, අමාත්‍යාංශය විසින් මේ සඳහා රු. මි. 01 ක් වැය කර ඇත.<br><br>මෙම වසරේදී ද ඉහත සඳහන්. ප්‍රදර්ශනය සඳහා විදේශීය නියෝජිතයන් 15 දෙනෙක්ද දේශීය නරඹන්නන් 80,000 කට අධික ප්‍රමාණයක් ද සහභාගී වී ඇත |

- **පිඟන් භාණ්ඩ අංශය**
- **දේශීය උළු නිෂ්පාදන කර්මාන්ත සඳහා නවීන තාක්ෂණයෙන් යුත් උළු වියලනයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියෙහි මූලික පියවරයන් මේ වන විටත් අවසන් කර ඇති අතර මෙය නිර්මාණය කිරීමේ කාර්යය සඳහා NERD ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය මගින් දේශීය උළු කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීමෙන් කාර්යක්ෂමතාව ඉහල නැංවීමත්, නිෂ්පාදනයන්හි තත්ත්වය උසස් කිරීමත් බලාපොරොත්තු වේ.

| **ක්‍රියාකාරකම** | **මිනුම් ඒකකය** | **භෞතික ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **ඉලක්ක** | **ප්‍රගතිය** |
| - **දේශීය රතු මැටි උළු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබා ගැනීමේ වැඩසටහන** | | දේශීය උළු කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීමෙන් කාර්යක්ෂමතාව ඉහල නැංවීමත්, නිෂ්පාදනයන්හි තත්ත්වය උසස් කිරීමත් බලාපොරොත්තු වේ. | කර්මාන්ත කරුවන් 20 දෙනෙක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබා ගැනීමට අදාල ක්‍රියාවලියෙහි අවසාන අදියර මෙවන විට ක්‍රියාත්මක වන අතර මේ සඳහා අමාත්‍යාංශය විසින් රු. මි. 04 ක මුදලක් වෙන් කර ඇත. |

- **සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි නියුක්තවන්නන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන**

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| - සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි නියුක්තවන්නන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන | | දේශීය සුළු හා මධ්‍ය පරිමාණ උළු කර්මාන්තකරුවන් 14 දෙනෙක් සඳහා නව තාක්ෂණික දැනුම ලබා දීම | කර්මාන්තකරුවන් 06 දෙනෙකුගේ නව ව්‍යාපෘති 06 ක් සඳහා රු. මි. 4.7 ක් මූල්‍ය ආධාර ලෙස ලබා දී ඇත. |

# කර්මාන්ත ලියාපදිංචි, ඵලදායිතා ප්‍රවර්ධන අංශය

**දැක්ම:** සුහදශීලීව සේවා සපයන මධ්‍යස්ථානයක් බවට පත් වීම

**මෙහෙවර: :**ස්ථාවර රැකියා අවස්ථා බිහි කිරීම සඳහා ශ්‍රී ලාංකීය නිෂ්පාදන කර්මාන්ත දිරිමත් කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම

**අරමුණ:** කර්මාන්ත ලියාපදිංචිය ඉහළ නැංවීම හා කර්මාන්තයන්හි ඵලදායිතාවය ඉහළ නැංවීම

**ප්‍රධාන කාර්යයන්:**

* කර්මාන්ත ලියාපදිංචි කිරීම සහ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම

*බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හා බලශක්ති වියදම් අවම කිරීමට ව්‍යාපෘති මෙහෙයවීම

*කර්මාන්ත ප්‍රතිපත්ති සැකසීම සඳහා තොරතුරු ගවේෂණය හා විවිධ සංඛ්‍යාලේඛණ වාර්තා සැකසීම

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

1. **ව්‍යාපෘතියේ නම:**
   බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය- දෙවන අදියර

**ව්‍යාපෘතියේ අරමුණ:**

බලශක්තිය ඉතිරි කිරීම මඟින් ජාතික බලශක්ති පද්ධතියට දායකත්වය දැක්වීම හා ශ්‍රී ලංකාවේ කර්මාන්ත වියදම් අවම කිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය % | ප්‍රගතිය |
| ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් ව්‍යාපෘතිය මෙහෙයවීමට සුදුසු උපදේශන සමාගමක් තෝරා ගැනීම | | 100 | උපදේශන සමාගමක් තෝරා ගන්නා ලදී |
| දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවීම තුළින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිෂ්පාදන කර්මාන්ත 15ක් තෝරා ගැනීම | තෝරා ගන්නා ලද කර්මාන්ත ගණන | 100 | කර්මාන්ත 15ක් තෝරා ගන්නා ලදී |

# රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

**හැඳින්වීම:**

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය යනු අංක 58/2007 රසායනික අවි සම්මුති පනතට අනුව එම සම්මුතියේ ජාතික වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ යටතේ පිහිටුවා ඇති ආයතනයකි. රසායනික අවි සම්මුතිය යනු රසායනික අවි වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය, හුවමාරු කිරීම තොග රැස්කිරීම හා භාවිතය තහනම් කිරීම හා ඒවා විනාශ කිරීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුමකි. සමූහ ඝාතක අවි ගණයට අයත් සියළු රසායනික අවි තහනම් කිරීම සඳහා මෙම සම්මුතිය 1993 වසරේදී සම්මත කරගන්නා ලදී. තවද සම්මුතිය නිසිලෙස ක්‍රියාත්මක වේදැයි තහවුරුකර ගැනීම උදෙසා යාන්ත්‍රණයක් සහිතවීම හේතුකොට ගෙන මෙම සම්මුතිය අනෙක් සම්මුතින්ගෙන් වෙනස්වේ. එලෙසම නෙදර්ලන්තයේ පිහිටි රසායනික අවි තහනම් කිරීමේ ජාත්‍යන්තර සංවිධානය හා අනෙකුත් සාමාජික රාජ්‍යයන් සමග සාධනීය සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ජාතික අධිකාරිය කටයුතු කරනු ලැබේ.

**දැක්ම:** රසායානික අවි සම්මුතිය ශ්‍රී ලංකාව තුල ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම හා රසායනික ද්‍රව්‍යයන්හි සාමකාමී හා සුරක්ෂිත භාවිතය තහවුරු කිරීම

**මෙහෙවර :**

- රසායනික අවි තහනම් කිරීමේ ජාත්‍යන්තර සංවිධානය හා අනෙකුත් සාමාජික රාජ්‍යයන් සමග සාධනීය සම්බන්ධතාවයක් පවත්වා ගෙනයාම.
- කර්මාන්ත ආශ්‍රිත ලැයිස්තුගත රසායනික ද්‍රව්‍යන් වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම හා ඒවායේ සාමකාමී භාවිතය තහවුරු කිරීම.
- රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත හදිසි අවස්ථාවන්හි දී ක්‍රියාත්මකවීම සඳහා වූ විශේෂිත ප්‍රතිචාර දක්වන්නන්ගේ කණ්ඩායම් පුහුණු කිරීම හා ජාතික ආරක්ෂිත වැඩපිළිවල ගොඩනැගීම
- නිපුණතාවයෙන් යුත් සුරක්ෂිත නිලධාරින් බිහිකිරීම හා සුරක්ෂිත සංස්කෘතියක් ශ්‍රී ලංකාවේ ගොඩනැගීම

**අරමුණ:** ශ්‍රී ලංකාව තුල රසායනික ද්‍රව්‍ය සාමකාමී හා සුරක්ෂිත භාවිතය තහවුරු කිරීම

**ප්‍රධාන කාර්යයන් :**

- ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්ත පරිශ්‍රයන් කාලානුරූපියව පරික්ෂා කිරීම
- ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය භාවිතාකරන්නන් හා වෙළෙන්දන් ලියාපදිංචි කිරීම
- ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවට හා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයට ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීමේ දී අවශ්‍ය නිර්දේශ ලබාදීම
- ආනයනික හා අපනයනය කරන ලද ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම
- රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වෙත වාර්ෂික වාර්තා සැපයීම

- රසායනික හදිසි තත්වයන්හිදී ප්‍රතිචාර දක්වනන්නන් හා කර්මාන්තශාලා වල සුරක්ෂිත නිලධාරින් පුහුණු කිරීම හා දැනුවත් කිරීම
- ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය හා ඒවායේ පූර්වගයන් සාමකාමී භාවිතයන් සඳහා පමණක් යොදාගන්නා බව තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් සම්මත කිරීම
- රසායනික හදිසි අවස්ථා ආශ්‍රිත ජාතික ආරක්ෂක වැඩපිළිවල ගොඩනැගීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහයෝගය දැක්වීම.
- රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත හදිසි අවස්ථා වලදී කර්මාන්තවලට හා වගකිව යුතු ආයතන වලට සහයෝගය දැක්වීම
- රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය විසින් සංවිධානය කරන විවිධ වැඩසටහන්, වැඩමුළු සම්මන්ත්‍රන ආදිය පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම

**2016 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රගතිය**

ව්‍යාපෘතියේ නම : උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය පවතින පරිශ්‍ර හඳුනාගැනීම/පරීක්ෂා කිරීම සහ හදිසි අවස්ථායන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම ගොඩනැගීම

ව්‍යාපෘතියේ අරමුණ: කර්මාන්ත පරිශ්‍ර වල සේවකයින්ගේ හා මහජනතාවගේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය හා සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම

| ක්‍රියාකාරම් | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| හෝමාගම කර්මාන්ත පුරයේ ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය හා උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ සමීක්ෂණය කිරීම | කර්මාන්ත ශාලා සංඛ්‍යාව | කර්මාන්ත 36 පරීක්ෂා කිරීම | කර්මාන්ත 31 පරීක්ෂා කරන ලදි |
| අදාල කාර්මාන්ත ස්ථානයන්හි උපද්‍රව විශ්ලේෂණය කිරීම හා අවදානම් තක්සේරු කිරීම | කර්මාන්ත ශාලා සංඛ්‍යාව | කර්මාන්ත 36සහ අවදානම් තක්සේරු කිරීම | කර්මාන්ත 31 අවදානම් තක්සේරු කරන ලදි |
| අදාල සෑම කාර්මාන්ත ස්ථානයන් සඳහාම හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම ගොඩනැංවීම සඳහා සහයෝගය කිරීම | කර්මාන්තපුර සංඛ්‍යාව | කර්මාන්තපුර 01 | කර්මාන්තපුර 01 සම්පූර්ණ කරන ලදි |

**ව්‍යාපෘතියේ නම: රසායනික අවි සම්මුතියේ දසවන වගන්තිය ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘතියේ අරමුණ:** රසායනික හදිසි අවස්ථාවකදී ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීම

| කාර්යය | ඇගයීමේ ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | සාක්ෂාත් කරගැනීම |
| රසායනික හදිසි අවස්ථා ආශ්‍රිත ජාතික ආරක්ෂක වැඩපිළිවල ගොඩනැගීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහයෝගය දැක්වීම | ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාව | රසායනික සිදුවීම් වලට ප්‍රතිචාර දක්වන්න් 100 පුහුණු කිරීම. | රසායනික සිදුවීම් වලට ප්‍රතිචාර දක්වන්න් 460 පමණ පුහුණු කරන ලදී. |

**ව්‍යාපෘතියේ නම: රසායනික අවි සම්මුතියේ හයවන වගන්තිය ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘතියේ අරමුණ:** රසායනික හදිසි අවස්ථාවකදී ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීම

| කාර්යය | ඇගයීමේ ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | සාක්ෂාත් කරගැනීම |
| ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය භාවිතාකරන කර්මාන්ත පරිශ්‍ර පරීක්ෂා කිරීම | කර්මාන්ත පරිශ්‍ර සංඛ්‍යාව | පරිශ්‍ර 20 පරීක්ෂා කිරීම | පරිශ්‍ර 14 පරීක්ෂා කරන ලදී |

**ව්‍යාපෘතියේ නම: රසායනික අවි සම්මුතිය හා රසායනික ද්‍රව්‍යයන් ආරක්ෂිත හා සුරක්ෂිත කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

**ව්‍යාපෘතියේ අරමුණ :** රසායනික සුරක්ෂිතභාවය සම්බන්ධ සම්මත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය හා කර්මාන්තයන්හි හැකියා වර්ධනය කිරීම

| කාර්යය | ඇගයීමේ ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | සාක්ෂාත් කරගැනීම |
| **රසායනික ද්‍රව්‍ය ආරක්ෂිත හා සුරක්ෂිත භාවිතය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව පැවැත්වීම** | සමුළු සංඛ්‍යාව | රසායන විද්‍යාව සාමකාමී භාවිතය සඳහා යොදා ගන්නා බව තහවුරු කිරීම සඳහාත් රසායනික ආරක්ෂාව හා සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීම සඳහාත් ආසියානු කලාපීය සහයෝගීතාවය ගොඩනැංවීම උදෙසා අන්තර්ජාතික සමුළුවක් පැවැත්වීම | 2017 පෙබරවාරි 06-10 දක්වා දිනයන් හි පැවැත්වීමට නියමිත විය. |
| **දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම** | වැඩමුළු සංඛ්‍යාව | වැඩමුළු 02ක් පැවැත්වීම | වැඩමුළු 06ක් පවත්වන ලදි |
| **කර්මාන්ත සුරක්ෂිතතාවය, හදිසි අවස්ථා සඳහා සූදානම් වීම හා පරිසර කළමනාකරණය මැයින් මාස තුනක සහතික පත්‍ර පාඨමාලාවක් පේරාදෙනිය විශ්ව විද්‍යාලය සමග පැවැත්වීම** | වැඩසටහන් සංඛ්‍යාව | සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම | සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම<br><br>සහභාගිවන්නන් සංඛ්‍යාව 30 කි |

**ව්‍යාපෘතියේ නම: රසායනික අවි සම්මුතියේ හයවන වගන්තිය ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘතියේ අරමුණ :** ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය සාමකාමී භාවිතයන් සඳහා පමණක් ශ්‍රී ලංකාව තුල යොදාගන්නා බව ලෝකයට සත්‍යාපනය කිරීම

| කාර්යය | ඇගයීමේ ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | සාක්ෂාත් කරගැනීම |
| වාර්ෂික ප්‍රකාශනයන් හා අනෙකුත් වාර්තා රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වෙත යැවීම | වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අදාල සියළු වාර්තා යැවීම | නියමිත දිනට අදාල සියළු වාර්තා යවන ලදී. |

# ආහාර හා සමූපකාර අංශය

දැක්ම : සවිමත් වාණිජමය පරිසරයක් තුළින් ජාත්‍යන්තර තරඟකාරී දේශිය කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැඟීම.

මෙහෙවර : ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන්නාවූද, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන බිහි කරන්නාවූ, සවිමත් වාණිජ අංශයකින් සමන්විත වූද, ධරණීය හා තරඟකාරීත්වයකින් හෙබි නිෂ්පාදන ආයතනයන්හි අභිවෘද්ධිය සඳහා හිතකාමී වන පරිසරයක් නිර්මාණය කිරීම.

අරමුණ : සමූපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීම තුළින් මහජනතාවට උපරිම සේවාවක් සැලසීම.

ප්‍රධාන කාර්යයන් : ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමූපකාර සමිතිවෙත මූල්‍ය පහසුකම් සැලසීම.

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

* ව්‍යාපෘතියේ නම : සමූපකාර ග්‍රාමීය බැංකු පරිගණකගත කිරීම

* ව්‍යාපෘතියේ අරමුණ : ආකර්ශණීය හා කාර්යක්ෂම පාරිභෝගික සේවාවක් ලබාදීම තුළින් ලාභදායීත්වය හා සේවා සත්කාරය ඉහළ නැංවීම

| ක්‍රියාකාරකම | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය % | ප්‍රගතිය |
| සමූපකාර ග්‍රාමීය බැංකු ශාඛා පරිගණකගත කිරීම.<br>නැගෙනහිර පළාත -ග්‍රාමීය බැංකු 12 - රු.මි. 2.4 | පරිගණකගත කරන ලද සමූපකාර ග්‍රාමීය බැංකු | 100% | නැගෙනහිර පළාත - ප්‍රගතිය 80% |
| උතුරු මැද පළාත - ග්‍රාමීය බැංකු 7 - රු.මි. 2 | | | උතුරු මැද පළාත - ප්‍රගතිය 80% |
| වයඹ පළාත - ග්‍රාමීය බැංකු 4 -රු.මි. 2.39 | | | වයඹ පළාත - ප්‍රගතිය 80% |
| බස්නාහිර පළාත - ග්‍රාමීය බැංකු 12 - රු.මි. 2.4 | | | බස්නාහිර පළාත - ප්‍රගතිය 90% |
| සබරගමුව පළාත - ග්‍රාමීය බැංකු 12 - රු.මි. 2.4 | | | සබරගමුව පළාත - ප්‍රගතිය 50% |
| ඌව පළාත - ග්‍රාමීය බැංකු 12 - රු.මි. 2.2 | | | ඌව පළාත - ප්‍රගතිය 60% |

# සුළු හා මධ්‍යම ව්‍යාපාර අංශය සංවර්ධන වැඩසටහන

අරමුණ: අඩු පොලියට ණය පහසුකම් සපයමින් සුළු,කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය ලංකාව පුරා වැඩි දියුණු කිරීම

ප්‍රධාන කාර්යයන්: අඩු පොලියට ණය පහසුකම් ව්‍යාපාරිකයින්ට සැපයීමට අදාල කටයුතු ඉටු කිරීම

**2016** දෙසැම්බර් **31** දිනට ප්‍රගතිය

ව්‍යාපෘතියේ නම: සුළු හා කුඩා කර්මාන්තයන්හි නායකත්වය සහ ව්‍යවසායකයින් නංවාලීමේ ණය යෝජනා ක්‍රමය

ව්‍යාපෘතියේ අරමුණ: අඩු පොලියට ණය පහසුකම් සපයමින් සුළු,කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය ලංකාව පුරා වැඩි දියුණු කිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අඩු පොලියට ණය පහසුකම් සැපයීම | ණය නිකුත් කළ ප්‍රමාණය | 3500 | 2380 |
| | | | |

# වාණිජ දෙපාර්තමේන්තුව

දැක්ම

*"ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම"*

මෙහෙවර

***"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."***

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් පහත සාරාංශයෙන් දැක්වේ.

- අදාළ රේඛීය අමාත්‍යාංශ / අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.

- විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාණිජමය අපේක්ෂාවන් ප්‍රවර්ධනය කිරීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම්ව එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙලෙස, 2014 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම, නව වෙළඳපළ සොයා ගැනීම, නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, අන්තර්ජාතික වෙළඳපලවල් වලට පිවිසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) අංශ දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ මූලස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින්, සෘජු විදේශ ආයෝජන සහ ආයෝජන කළඹ ප්‍රවර්ධනය මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයද ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ සහාය ද ලබාදෙන ලදී.

## අපගේ සබඳතා




### 2016 **වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ආර්ථික සංවර්ධන වැඩසටහන තුළ ප්‍රමුඛ ස්ථානයක් විදේශ වෙළඳාම සඳහා හිමිවී ඇති අතර එය ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමෙහි ලා වැදගත් සුවිශේෂී සාර්ව ආර්ථික මෙවලමක් ද වේ.

මෙම ඉල්ලක්කය ලඟා කරගැනීම සඳහා වූ අරමුණු අතරට ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා විදේශීය වෙළඳපොළ ප්‍රවේශය ශක්තිමත් කිරීම, වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්තීන් තවදුරටත් යාවත්කාලීන කරමින් වෙළඳ ප්‍රවර්ධනය ජාතික සංවර්ධන රාමුව තුළ අනුකලනය කිරීම, සාධාරණීය වෙලඳ පරිසරයක් තහවුරු කිරීම සහ අයෝජනය දිරිමත් කිරීම යනාදිය ඇතුළත් වේ. මෙම අරමුණු, බහුපාර්ශවීය, කලාපීය සහ ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම් ඔස්සේ අත්පත් කරගැනීමට කටයුතු කරනු ලැබේ.

ගෝලීය මට්ටමෙන් වෙළඳාම ලිහිල්කරණයෙහි සම්මුතීන් හැරෙන්නට, කුඩා සහ අවධානමකින් පෙළෙන රටක් ලෙස ශ්‍රී ලංකාව, බොහෝ අභියෝගයන්ට මුහුණ දෙනු ලැබේ. දැඩි තාක්ෂණික සහ

සෞඛ්‍ය ප්‍රමිතීන්, රේගු පටිපාටීන් සහ සම්බන්ධ අවශ්‍යතාවන් වැනි තීරු බදු රහිත ක්‍රියාමර්ගයන් තුළින් ඇතිවන අයහපත් බලපෑම් ඒ අතර වේ. තීරු බදු රහිත ක්‍රියාමාර්ගයන් යොදාගැනීම 2008 හි වූ ආර්ථික අර්බුදයන් ඇතිවීමට බලපෑ අතර එය තවදුරටත් ශ්‍රී ලංකාවේ ගැටලුවක් ලෙස පවතින්නේ අපනයන වෙළඳපොළ මඟින් සිදු කරන ඕනෑම තීරුබදු ලිහිල්කරණයක ප්‍රගමනය එවැනි පියවරයන් නිසා අහෝසි වන විටදීය.

ගෝලීය ආර්ථික සීමාව තුළ පහළ බැසීමේ ප්‍රවණතාවයක් පැවතිය ද ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා නව සහ වෙනත් වෙළඳපොල සෙවීමේදී පවා ශ්‍රී ලංකාව පිටස්තරය අභිමුඛයෙහි දී සාමූහික ප්‍රයත්නයන් දරා ඇත. චීනය, බ්‍රසීලය, රුසියාව, තුර්කිය, දකුණු කොරියාව සහ දකුණු අප්‍රිකාව යනාදී රටවල් එලෙස වෙලඳපොළ පුළුල් කිරීම සඳහා හදුනා ගත් රටවල් කිහිපයකි.

පවත්නා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ කොටස වැඩි දියුණු කිරීම වැදගත් කටයුත්තක් මෙන්ම අභියෝගයක්ව පවතී. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ කොටස වැඩි දියුණු කිරීම සඳහා සුදුසු පියවරයන් ගෙන ඇති අතර ඒ විශේෂයෙන්ම ශ්‍රී ලංකාව පාර්ශව කරුවකු වී ඇති නිදහස් වෙළඳ ගිවිසුම් හා වරණීය වෙළඳ ගිවිසුම් යටතේ ඇති වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම සහ උපරිම උපයෝජනය මඟිනි. එකාබද්ධ කමිටු සාකච්ඡා සහ ඉන් පසු සිදු කරන කටයුතු මඟින් වෙළඳ ප්‍රවර්ධනය සඳහා රටවල් අතර අන්‍යෝන්‍ය සහයෝගිතාවය වැඩි දියුණු කරන අතර වෙළඳාම සම්බන්ධ ගැටලු විසඳනු ලබයි.

සමාලෝචනයට යටත්වන කාලයෙදී රටෙහි ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති පාලන තන්ත්‍රය අරමුණ වී ඇත්තේ අපනයන ක්ෂේත්‍රයෙහි සංවර්ධනය යි. ඒ අනුව ඵලදායිකතාවය වැඩි දියුණු කිරීමට මෙන්ම විදෙශීය වෙළඳාමෙහි ප්‍රතිලාභ බෙදා ගැනීම සඳහා ග්‍රාමීය හා නාගරික ක්ෂේත්‍රයන්හි හා ගෝලීය අර්ථිකය අතර සම්බඳතාවය ඉහළ නැංවීමට රජය විසින් ප්‍රමුඛත්වය දෙන ලදී. තාක්ෂණික නව නිපැයුම් දිරිමත් කිරීමෙන්, නව කර්මාන්ත කලාපයන් තුල පෞද්ගලික අයෝජනය පහසු කිරීමෙන්, රාජ්‍ය සේවා සැපයුම ඉහළ නැංවීමෙන් සහ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමෙන් හා වර්ධනය කිරීමෙන් කර්මාන්ත අංශයෙහි ජාත්‍යන්තර තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි රටෙහි ආර්ථික ප්‍රතිපත්ති සැලැස්මෙහි අවධානය යොමු වී ඇත. ද.දේ.නි හි අපනයන කොටස ඉහළ නැංවීමේ අරමුණෙන් යුතුව ලෝකයේ විශේෂිත අපනයන අවශ්‍යතාවයන් හා තාක්ෂණය මුල් කරගත් අපනයනයන් සඳහා අයෝජකයන් හදුනා ගැනීම කෙරෙහි රජයේ ආර්ථික ප්‍රතිපත්තීන්හි ආවධානය යොමු විය.

**ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය**
2010-2016 (**වටිනාකම ඇ.ඩො.මි**)

| වර්ෂය | අපනයන | වර්ධනය % | ආනයන | වර්ධනය % | සමස්ත වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| **2010** | 8,294 | 16.5 | 12,340 | 26.4 | 20,634 | -4,047 |
| **2011** | 10,018 | 20.8 | 19,703 | 59.7 | 29,721 | -9,685 |
| **2012** | 9,181 | -8.4 | 17,889 | -9.2 | 27,069 | -8,708 |
| **2013** | 10,009 | 9.0 | 17,098 | -4.4 | 27,107 | -7,088 |
| **2014** | 11,044 | 10.3 | 19,246 | 12.6 | 30,290 | -8,202 |
| **2015** | 10,212 | -7.5 | 18,989 | -1.3 | 29,201 | -8,777 |
| **2016** | 10,217 | 0.048% | 19,515 | 2.77 | 29,732 | -9,298 |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව*

2.1 **අපනයන හා ආනයන කාර්ය සාධනය**




**2016** වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන අදායම ඇ.ඩො.මි. **10,217** වූ අතර එය **2015** දී ඇ.ඩො.මි.**10,212** විය.
ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම් අතර රෙදිපිළි සහ ඇඟළුම් ප්‍රමුකත්වයක් ගන්නා අතර එහි දායකත්වය **45%**කි. **2015** වසරේ එම අගයට වඩා සුළු ඉහළ යෑමක් (**1.05%**) දක්නට ලැබේ.**2016** අපනයන ඉපැයුම් අතරින් දෙවැනි ප්‍රධන අපනයන ලෙස තේ (**12%**) ඝන සහ අනෙකුත් ටයර් (**3%**) රබර් අත්මේස් (**2%**) සහ කුරුඳු (**2%**) දැක්වේ.




ශ්‍රී ලංකා රේගු දත්ත අනුව, 2016 වසරේ ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම ඇ.ඩො.මි. 19,515 වන අතර 2015 වසරේදී එය ඇ.ඩො.මි. 18,989 විය. එය 2015 වසරට වඩා 2.77% වර්ධනයකි. ආනයන සංයුතියේ මූලිකවම 12% ක කොටසක් ඉන්ධන සඳහා ලැබී ඇති අතර 2015 වසරට සාපේක්ෂව එහි 21.49% වර්ධනයක් ඇත. මෝටර් රථ (8%), යකඩ සහ වානේ (5%), රෙදිපිළි සහ කපු පුළුන් (4%) ප්ලාස්ටික් සහ ද්‍රව්‍ය (4%) ලෙස ආනයන සංයුතිය සැකසී ඇත.

### 2.2 අපනයන හා ආනයන දිශාව



**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

| **ක්‍රියාකාරකම්** | **මිණුම් දණ්ඩ** | **භෞතික ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **අරමුණ** | **සාධනය** |
| **ද්වීපාර්ශවීය වෙළඳ සහ ආර්ථික සහයෝගීතාවය**<br><br>2016 වසරේදී, ශ්‍රී ලංකාව සිය ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් සහ ශ්‍රී ලංකාව සමඟ වෙළඳාම් කටයුතු කිරීමට එළැඹි වෙනත් රටවල් සමඟ ද්වීපාර්ශවීය වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමට දැඩි අවධානයක් යොමු කර ඇත. රුසියාව, යුරෝපා සංගමය, ඉරානය, ඇමරිකා එක්සත් ජනපදය,බෙලාරුසය, බංගලදේශය සහ තුර්කිය යනරටවල් සමඟ වෙළඳ සහ ආර්ථික සබඳතාවන්ට එළැඹී ඇත. සමාලෝචනයට ලක්වන කාල සීමාවේ දී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පකිස්ථානය සමඟ අත්සන් තබන ලද ද්වීපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ මෙන්ම චීනය, ඉන්දියා සහ සිංගප්පූරුව සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් ශ්‍රී ලංකාවේ වාණිජ අභිරුචියෙහි ප්‍රගමනයේ වැදගත්කම සඳහා ක්‍රියාකර ඇත. | | | |
| 1. **ඉන්දියාව වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා**:<br><br>**1.1. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)**<br><br>1998 දෙසැම්බර් 28 වන දින අත්සන් තබන ලදුව 2000 මාර්තු මස 01 වන දින සිට ක්‍රියත්මක ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම දෙරට අතර වෙළඳාමේ වර්ධනය සඳහා දායක වී ඇත. දේශීය කොටස්කරුවන් මෙන්ම ඉන්දියාවේ අදාල පාර්ශවයන් අතර නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු විසඳීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. එක්ටා (ECTA) ගිවිසුම් ක්‍රියාවලියේ මූලික කොටස ලෙස මෙම ගැටලු යොදා ගන්න ලදී. 2016 පැවති මෙම සාකච්ඡා අතරතුරේදී | ශ්‍රී ලංකාව තීරුබදු සහන ලැබූ අයිතම ගණන | | අයිතම 5,012 (ඉලක්කම් 6 කේතයෙන්) |
| | ඉන්දියාවට සිදුකළ සමස්ත අපනයනය | | ඇ.ඩො.මි.551.21 |
| | ISFTA යටතේ සමස්ත අපනයනය | | ඇ.ඩො.මි.375.25 |
| | ISFTA යටතේ අපනයන වෙනස්වීමේ % | | -7.65% |
| | ඉන්දියාවෙන් සිදුකළ සමස්ත ආනයනය | | ඇ.ඩො.මි.3,827.50 |
| | ISFTA යටතේ සමස්ත ආනයනය | | ඇ.ඩො.මි. 186.73 |
| | ISFTA යටතේ ආනයන වෙනස්වීමේ % | | -22.3% |
| | වෙළඳ ශේෂය (ISFTA යටතේ) | | ඇ.ඩො.මි.188.52 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| පොල් ආශ්‍රිත නිෂ්පාදන, සත්ව ආහාර සහ නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාවට ස්ට්‍රෝබෙරි අපනයනය ආදියෙහි පැවති ගැටලු කිහිපයක් විසඳා ගැනීමට ශ්‍රී ලංකා පාර්ශවයට හැකිවිය. | | | |
| **1.2. ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA)**<br><br>ඉන්දු- ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි පළමු වටයේ සාකච්ඡා 2016 අගෝස්තු මස 09-10 දිනවල කොළඹ දී පැවත් වූ අතර එහි දෙවන වටයේ සාකච්ඡා සැප්තැම්බර් මස 29-30 දිනවල නව දිල්ලියෙහි දී පවත්වන ලදී. පළමු වටයේ සාකච්ඡා අතරතුරේ දී, ගිවිසුමෙහි පුළුල් විශය පථය පිළිබඳ සාකච්ඡා කරන ලද අතර දෙපාර්ශවයේම එකඟත්වයෙන් යුතුව ශ්‍රී ලංකා පාර්ශවයෙන් ඉදිරිපත් කරන ලද ගිවිසුමෙහි කෙටුම්පත සඳහා මූලික පරිකල්පනය ඉදිරිපත් කිරීමට ඉන්දියානු පාර්ශවය විසින් එකඟවන ලදී. 2015 මද භාගය වන විට ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් මුහුණදෙනු ලබන තීරුබදු රහිත ක්‍රියාමාර්ග පිළිබඳ ඉදිරිපත් කරනු ලැබූ ලිපි ගොනුවට පිළිතුරු වශයෙන් ඉන්දියානු පාර්ශවය විසින් දෙවන වටයේ සාකච්ඡාවන්ට පෙරාතුව සිය ප්‍රතිචාරය ලබාදීමට එකඟවන ලදී. නිදහස් වෙළඳ ගිවිසුමට අදාල | අදාල වර්ෂයේ දී පවත්වන ලද සාකච්ඡා වට ගණන | | 03 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ගැටලු විසඳා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් සමුද්දේශ කොන්දේසි සැපයීමට නියමිත ක්‍රමවත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු බවට එකඟ වන ලදී. ECTA මුල් ඇස්වනු වැඩසටහන (ගිවිසුමෙහි එක් කොටසක් පමණක් ක්‍රියාත්මක කරමින් එහි ප්‍රතිඵල විමසා බැලෙන Early Harvest Mechanism) පිළිබඳව ද සාකච්ඡා කරන ලද අතර එහිදී ගම්මිරිස් සහ රෙදිපිළි නිෂ්පාදනයන් සඳහා විශේෂිත අවදානයක් යොමු කරමින් ශ්‍රී ලංකා පාර්ශවය විසින් ඒ සඳහා සලාක ඉවත් කරන මෙන් ඉල්ලීමක් කරන ලදී. ECTA යටතේ සාකච්ඡා පැවත්වීම සඳහා කණ්ඩායම් 7ක් පත් කරන ලදී. වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ගිවිසුම සඳහා තාක්ෂණික අංශයේ සහය ලබා දෙන ලදී.<br><br>දෙවන වටයේ සාකච්ඡාවන්හි දී ඉන්දියානු පාර්ශවයේ තීරුබදු රහිත ක්‍රියාමර්ග පිළිබඳ වූ ලිපි ගොනුවට පිළිතුරු සහ රෙදිපිළි, ගම්මිරිස්, තේ සහ වනස්පති සඳහා සලාක ඉවත් කරන මෙන් ශ්‍රී ලංකාවෙන් සිදු කළ ඉල්ලීම පිළිබඳ වැඩිදුර සාකච්ඡා පවත්වන ලද අතර ඉන්දියානු පාර්ශවය තම කොටස්කරුවන් සමඟ සාකච්ඡා කර දන්වන බවට එහිදී එකඟ වන ලදී. භාණ්ඩ වෙළඳාම හා සේවා වෙළඳාම පිළිබඳ අන්‍යෝන්‍යව පිළිගත් ගිවිසුම් තබාගැනීමේ වැදගත්කම පිළිබඳ දෙපාර්ශවයම එකඟ විය. ECTA ගිවිසුමට එළැඹීමට | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ප්‍රථමව මුල අස්වනු වැඩසටහන ක්‍රියාත්මක කිරීම මෙන්ම වෙළඳාම පහසුකරණ කටයුතු තීරණය කොට අවසන් කිරීමේ අරමුණෙන් යුතුව සංශෝධිත යාන්ත්‍රණ කෙටුම්පතක් ලබාදීමට ශ්‍රී ලංකාව විසින් එකඟ වන ලදී. අදාල කණ්ඩායම් වෙන වෙනම එක්වී ගිවිසුමේ අදාල කෙටුම්පත් සටහන පිළිබඳ සාකච්ඡා කරන ලදී | | | |
| 2. **පකිස්ථානය වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා**:<br><br>2.1. **පකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)**<br><br>2005 වසරේ දීපකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) බලාත්මක කිරීමත් සමඟ දෙරට අතර සිදුවන ද්වීපාර්ශවීය වෙළඳාමේ දියුණුවට එය මහත් දායකත්වයක් දක්වන ලදී.<br><br>සමාලෝචනයට ලක් වූ කාලයේදී PSFTA යටතේ අපනයන කරන ලද්දේ පොල්,බුලත්, වියලි පොල්, (MDF)මධ්‍යම ඝනත්වයෙන් යුතු ෆයිබර් ලෑලි: මි,මි, 9 ක ඝනත්වය ඉක්මවූ, වෙනත් කළු තේ (පැසුණු ) සහ වෙනත් තේ යනාදිය වේ.<br><br>PSFTA යටතේ එම කාලයේදී අපනයනය කරන ලද නිෂ්පාදන අතර වෙනත්, පාස්සන ලද හෝ කවාකාර | ශ්‍රී ලංකාව තීරුබදු සහන ලැබූ අයිතම ගණන | | අයිතම 5877 (ඉලක්කම් 8 කේතයෙන්) |
| | පකිස්ථානයට සිදුකළ සමස්ත අපනයනය | | ඇ.ඩො.මි 63.80 |
| | PSFTA යටතේ සමස්ත අපනයනය | | ඇ.ඩො.මි 51.60 |
| | PSFTA යටතේ අපනයන වෙනස්වීමේ % | | 80.87% |
| | පකිස්ථානයෙන් සිදුකළ සමස්ත ආනයනය | | ඇ.ඩො.මි 304.33 |
| | PSFTA යටතේ සමස්ත ආනයනය | | ඇ.ඩො.මි 20.72 |
| | PSFTA යටතේ ආනයන වෙනස්වීමේ % | | 6.80 % |
| | වෙළඳ ශේෂය (PSFTA යටතේ) | | ඇ.ඩො.මි 30.88 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| යකඩ බට හෝ අමිශ්‍රිත ලෝහ, සහල්, දොඩම් (මැන්ඩරින්), කි.ග්‍රෑ 50 සහ ඊට අඩු පෝර්ට්ලන්ඩ් සිමෙන්ති මිටි, පිටි, අහාර සහ සැකසූ මාළු හෝ මත්ස්‍ය ආහාර, බෙල්ලන් හෝ වෙනත් ජලජ අපෘෂ්ඨවංශීන් වේ. | | | |
| 2.2. **<u>ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර වාණිජ අමාත්‍ය මට්ටමේ රැස්වීමේ 6 වන සැසිවාරය</u>**<br>ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර වාණිජ අමාත්‍ය මට්ටමේ රැස්වීමේ 6 වන සැසිවාරය 2016 ජනවාරි මස 4 වන දින කොළඹ දී පැවැත්විය.<br>පකිස්ථානයේ තීරු බදු සහ ලැයිස්තුවට මෝටර් රථ අංශයේ අයිතමයන් නැවත ඇතුල් කිරීමත්, නිෂ්පාදන සලාක කිරීම සඳහා වෙළඳපොළ ප්‍රවේශය තවදුරටත් ලිහිල්කරණය කිරීමටත්, ප්‍රමිතීන් සඳහා අන්‍යෝන්‍ය පිළිගත් ගිවිසුම්වලට එලැඹීමටත්, ගැටළු නිරාකරණ යාන්ත්‍රණයක් සැකසීම, ශ්‍රී ලංකාවේ යම් යම් නිෂ්පාදනයන් සඳහා ආනයනික වෙළඳ මිලක්(ITP) පැනවීමටත් අදාල සාකච්ඡා රැස්වීමේදී සිදු කෙරුණි. | අදාල වර්ෂයේ දී පවත්වන ලද සාකච්ඡා වට ගණන | | 01 |
| 3. **නව නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම**<br><br>3.1. **චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම**<br>චීනය සහ ශ්‍රී ලංකාව අතර | අදාල වර්ෂයේ දී පවත්වන ලද සාකච්ඡා වට ගණන | | 02<br><br>මූලික මට්ටමේ සාකච්ඡා 07<br>නිෂ්පාදිත අංශයේ රැස්වීම් 10<br>1. පෞද්ගලික අංශයේ |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම දියත් කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුම වෙළඳ සහයෝගිතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටුවෙන් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යනය මත පදනම්ව 2014 සැප්තැම්බර් මස 16 වන දින අත්සන් තබන ලදී.<br>චීනය සහ ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළඳ ගිවිසුමෙහි උපායමාර්ගික අරමුණ වන්නේ ඇඟලුම් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, පොල් ආශ්‍රිත නිෂ්පාදන, ආහාර වර්ග කිහිපයක්, ආදී ශ්‍රී ලාංකික අපනයනය සඳහා, නිදහස් වෙළඳ ගිවිසුම්/කලාපීය වෙළඳ ගිවිසුම් හරහා ආසියාන් (ASEAN) කලාපය තුල වරණීය ආනයනික බදු වාසිය අත් කරගත් තරඟකාරී සැපයුම්කරුවන් හමුවේ චීන වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම සහ තහවුරු කිරීමයි.<br>පළමු සහ දෙවන වටයේ සාකච්ඡා පිළිවෙලින් 2014 සැප්තැම්බර් මස 17-19 දිනවලදී කොළඹ දී සහ 2014 නොවැම්බර් මස 26-28 බීජිං හි දී පැවත් විය. තෙවන වටයේ සාකච්ඡා 2016 අගෝස්තු මස 02-04 දිනවල පැවැත් වූ අතර සිව්වන වටයේ සාකච්ඡා 2016 නොවැම්බර් මස බීජිං හි දී පැවත් විණි.<br>නිදහස් වෙළඳ ගිවිසුමෙහි වෙළඳාම් ලිහිල්කරණයේ අපේක්ෂිත ප්‍රතිඵලයක් ලෙස දේශීය කර්මාන්ත මත පැටවී ඇති පැටලැවීම් සැලකිල්ලට ගෙන වෙළඳාම ලිහිල්කරණ වඩසටහන් සඳහා විදි ක්‍රමයක් | | | සමාගම්වල අයිතම ගත ලැයිස්තු නියෝජනය<br>2. සංවේදී තීරු බදු සඳහා ආසන්න වශයෙන් 40% විස්තීරණ සෘණ ලැයිස්තු සැකසීම් |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | **අරමුණ** | **සාධනය** |
| සැකසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට අතිශයින්ම වැදගත්වන භාණ්ඩ වෙළඳාම පරිච්ඡේදයේ විස්තරාත්මකව සකච්ඡා වේ. තවද ශ්‍රී ලංකාව TLP I , TLP II (වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන) ලෙස අනුයාත කාල සීමව තුළදී ලිහිල්කරණ කටයුතු පියවර දෙකක් මගින් ආවරණය කෙරෙණ ද්වීමාර්ගික තීරුබදු ලිහිල්කරණ වැඩසටහනක් යෝජනා කරන ලදී. භාණ්ඩ වෙළඳාම පිළිබඳ පරිච්ඡේදයේ කෙටුම්පතෙහි වගන්ති පිළිබඳ සාකච්ඡා කොට නිම කරන ලද අතර මෙම වටයේදී වගන්ති බොහොමයක් පිළිබඳ අවසන් තීරණයන්ට එළැඹෙන ලදී.<br>නිදහස් වෙළඳ ගිවිසුමෙහි ප්‍රභවස්ථාන නීති පිළිබඳ පරිච්ඡේදය පිළිබඳ මෙහිදී සාකච්ඡා කරනු ලැබුව ද සම්මුතියකට පැමිණියේ යෝජනා ඉදිරිපත් කිරීමේ ඉල්ලුම් (PSR) යෝජනාවන් බහුතරයකිනි.<br>වාණිජ දෙපාර්තමේන්තුව විසින් කණ්ඩායම් 3 ක් මෙහෙයවනු ලබන අතර එවා නම් භාණ්ඩ වෙළඳාම, ප්‍රභවස්ථාන නීති හා වෙළඳ පිළියම් වේ. එමෙන්ම අනෙත් කාණ්ඩායම් හයටම අදාල තාක්ෂණික විශේෂඥ දැනුම ලහා දෙනු ලබයි.<br>මෙම ප්‍රාරම්භක ක්‍රියාවලිය එක් යාන්ත්‍රණයක් බවට පත් කරණු පිණිස පෞද්ගලික අංශයේ කොටස්කරුවන් හට ද සවිස්තරාත්මක උපදෙස් ලබා දෙන ලදී. | | | |
| 3.2. **සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව අතර** | අදාල වර්ෂයේ දී පවත්වන ලද | | 03 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| **යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම**<br><br>සිංගප්පූරු පාර්ශවය සහ උපායමාර්ගික සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය විසින් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යනයෙන් පසු සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව යන දෙරට විසින්ම නව සහ වඩාත් විස්තීරණ නිදහස් වෙළඳ ගිවිසුමකට එළැඹීමට සූදානම් බව ප්‍රකාශයට පත් කරන ලදී.<br>යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ ශ්‍රී ලංකාව හා අදාල ආයතන අතර විෂයපථය සහ එහි ආවරණයන් පිළිබඳ මූලික සාකච්ඡාවන් සිදු කිරීම සඳහා සිංගප්පූරුවෙන් පිරිසක් **2016** ජූලි මස **7** වන දින ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී. ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සිංගප්පූරුසංචාරය අතරතුර ශ්‍රී ලංකාවෙහි ගරු උපායමාර්ගික සංවර්ධන සහාන්තර්ජාතික වෙළඳ අමාත්‍යතුමා සහ සිංගප්පූරුවෙහි වෙළඳ හා කර්මාන්ත අමාත්‍යතුමා අතර ගිවිසුම හා සම්බන්ධ එකාබද්ධ ප්‍රකාශයක් 2016 ජූලි මස 18 වන දින අත්සන් කරන ලදී. 2016 අගෝස්තු, ඔක්තෝබර් සහ දෙසැම්බර් යන මාසයන්හි කොළඹ සහ සිංගප්පූරුවෙහි දී සාකච්ඡා වට තුනක් පැවැත්වෙන ලදී. | සාකච්ඡා වට ගණන | | |
| **4.** ඒකාබද්ධ ආර්ථික කමිටු සාකච්ඡා **(JEC)**<br><br>වැදගත් වෙළඳ පාර්ශවකරුවන් සමඟ ශ්‍රී ලංකාව ඇතිකරගත් වෙළඳ හා | දැනටමත් බලාත්මකව පවත්නා ඒකාබද්ධ ආර්ථික කමිටු ගණන | | 18<br>වාණිජ දෙ. විසින් කොරියානු ජනරජය සමඟ ඒකාබද්ධ ආර්ථික කමිටු ගිවිසුම කෙටුම්පත් කිරීම |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ආර්ථික සහයෝගිතා ගිවිසුම් ආදියෙහි ඒකාබද්ධ ආර්ථික කමිටු සඳහා අදාල කටයුතු සිදු කරන කේන්ද්‍රීය ආයතනය ලෙස වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලබයි. ඒකාබද්ධ ආර්ථික කමිටු යටතේ ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම් සඳහා තීරණ සැකසීම, සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම වැනි සියලුම කටයුතු වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.<br>වෙළඳාම හා සම්බන්ධ කටයුතුවලට අවශ්‍ය තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාවය දිරිමත් කරමින් එම රටවල් වෙත ශ්‍රී ලංකාවෙන්සිදුකරන අපනයනයන් වර්ධනය කොට විස්තාරණය කිරීමට මෙම ඒකාබද්ධ ගිවිසුම් මඟින් අවස්ථාව සැලසේ.<br>අදාල වර්ෂයේදී අමාත්‍ය/ලේකම් මට්ටමෙන් පවත්වන ලද පහත සඳහා ඒකාබද්ධ කමිටු සඳහා සම්බන්ධීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනලදී.<br>• ශ්‍රී ලංකාව - බංගලාදේශය<br>• ශ්‍රී ලංකාව - ඇමරිකා එක්සත් ජනපදය<br>• ශ්‍රී ලංකාව - ඉරානය<br>• ශ්‍රී ලංකාව - තුර්කිය<br>• ශ්‍රී ලංකාව - යුරෝපා සංගමය<br>• ශ්‍රී ලංකාව - බෙලාරුසය<br>• ශ්‍රී ලංකාව - රුසියාව<br>• ශ්‍රී ලංකාව - පකිස්ථානය | අදාල වර්ෂය තුල බලාත්මක කරන ලද න ඒකාබද්ධ ආර්ථික කමිටු ගණන<br><br>අදාල වර්ෂයේ දී පවත්වන ලද සාකච්ඡා වට ගණන | | 1<br><br>7 |
| | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| **කලාපීය ආර්ථික සහයෝගිතාවය**<br>APTA, SAPTA, SAFTA, BIMSTEC සහ IORA යන කලාපීය වෙළඳ හා ආර්ථික ගිවිසුම්හි ප්‍රධාන භූමිකාවක් ශ්‍රී ලංකාව විසින් හොබවනු ලබයි. | | | |
| **1. ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡා පවත්වාගෙන යාම (APTA)** | නිරුබදු සහන ලැබූ අයිතම ගණන | | බංගලාදේශය–209<br>චීනය– 1697<br>ඉන්දියාව– 570<br>ද. කොරියාව– 1367 |
| ආසියා පැසිෆික් කලාපය තුල අතිකරගත් පළමු වෙළඳ ගිවිසුම වන්නේ 1975 දී අත්සන් තබන ලද බැංකොක් ගිවිසුම වන අතර එය 2005 වසරේ සිට ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම ලෙස හැඳින්වේ.<br><br>APTA ස්ථාවර කමිටුවෙහි 49 වන සැසිවාරය 2016 සැප්තැම්බර් මස තායිලන්තයේ බැංකොක් හි දී පැවැත්විය. වෙළඳාම පහසුකරණය, අයෝජන සහ සේවා පිළිබඳ සැකිළි ගිවිසුමෙහි මෙහෙයුම් සනාථ කිරීමේ ක්‍රියාවලිය සහ උපක්‍රම තවදුරටත් වර්ධනය කිරීම පිළිබඳ මෙම සැසිවාරයේදී සාකච්ඡා කරන ලදී. APTA 2017 ජනවාරි මස තායිලන්තයේ බැංකොක් හි පැවැත්වීමට නියමිත අමාත්‍ය මණ්ඩල රැස්වීමේ 4 වන සැසිවාරය අතරතුරදී APTA යටතේ 4 වටයේ සාකච්ඡා අවසන් කළ යුතු බවට සාමාජික රාජ්‍යන් තීරණය කරන ලදී.<br><br>විද්‍යුත් ප්‍රභවස්ථාන සහතිකපත් නිකුත් කිරීම සහ ප්‍රභවස්ථාන සහතිකපත් නිකුත් කිරීම සඳහා ලියකියවිලි ගොනුවක් ලබාදීම යන | APTA යටතේ අපනයනය<br><br><br><br><br><br><br>පවත්වනු ලැබූ ස්ථාවර කමිටු/ වැඩ කණ්ඩායම් ගණන | | ඇ.ඩො.මි 126.00<br>බංගලාදේශය – 0.38<br>චීනය – 91.88<br>ඉන්දියාව – 1.60<br>ද. කොරියාව– 31.72<br><br><br>ස්ථාවර කමිටු- 01<br>වැඩ කණ්ඩායම් – 01<br>(ප්‍රභවස්ථාන නීති) |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| දැක්මෙන් යුතුව, සාමාජික රටවල නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2016 නොවැම්බර් මස දකුණු කොරියාවේ සෙයොල් හි දී පැවැත්විය. වැඩමුළුවට සමගාමීව ප්‍රභවස්ථාන නීති සහතික කිරීමට සහ ස්ථිර කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලිය සමාලෝචනය සඳහා ප්‍රභවස්ථාන නීති පිළිබඳ කණ්ඩායම රැස්වීමක් ද පැවැත්විණි. | | | |
| **2. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡා පවත්වාගෙන යාම SAFTA** | තීරුබදු සහන ලැබූ අයිතම ගණන | | ඇෆ්ගනිස්ථානය – 4357<br>බංගලාදේශය – 4176<br>භූතානය – 5057<br>ඉන්දියාව – 4593<br>මාලදිවයින -5053<br>නේපාලය – 4171<br>පකිස්ථානය - 4271 |
| දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම **2004** ජනවාරි මස අත්සන් තැබීමෙන් පසු **2006** ජනවාරි මස සිට බලාත්මක විය. **1995** දී පිහිටුවන ලද දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුමත් **(SAPTA)** සමඟ ආරම්භ වූ වරණීය වෙළඳාම ප්‍රවර්ධනය කරමින් කලාපීය ආර්ථික සංකලනය කිරීමේ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීම **SAFTA** හි අභිප්‍රාය වේ.<br><br>**2016** වන විට වසර **10**න් සම්පූර්ණ කිරීමට නියමිත හි වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන යටතෙඇ සූක්ෂම ලැයිස්තුවේ භාණ්ඩ අරෙන්නට අනෙකුත් නිෂ්පාදන සඳහා තීරු බදු ක්‍රමයෙන් අඩු කරන ලදී. **2015** නොවැම්බර් මස **21** වන දින ශ්‍රී ලංකව සිය තීරු බදු ලිහිල්කරණය **TLP** පලවන | SAFTA යටතේ අපනයනය | | ඇ.ඩො.මි 7.52<br>ඇෆ්ගනිස්ථානය– 00<br>බංගලාදේශය – 2.49<br>භූතානය – 00<br>ඉන්දියාව – 4.67<br>මාලදිවයින – 0.02<br>නේපාලය – 0.27<br>පකිස්ථානය – 0.67 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| අදියරේ දීම සම්පූර්ණ කරන ලදී. උගණ සංවර්ධිත රටවල් ද **2016** වන විට එසේ නිම කිරීමට නියමිතය.<br><br>**TLP** හි දෙවන අදියර ද සාර්ථකව සාකච්ඡාකොට අවසන් කර සෑම සාමාජික රටකම ක්‍රියාත්මක කරන ලදී. දෙවන අදියර යටතේ, සිය මූලික සූක්ෂම ලැයිස්තුවලින් අවම **20%** ක් අඩු කිරීමට සාමජිකයන් එකඟ විය. සූක්ෂම ලැයිස්තුවෙනිවත් කරන ලද නිෂ්පාදන සඳහා තීරු බදු අඩු කිරීම ක්‍රමයෙන් **2020** වන විටදී සම්පූර්ණ කළ යුතු අතර ශ්‍රී ලංකාව විසින් එය **2018** වන විට දී සම්පූර්ණ කල යුතුය.<br><br>සාර්ක් (SAARC) රටවල් වෙත ශ්‍රී ලංකාවේ අපනයනයන්ගෙන් **80%**ක වත් වඩා සිදු වන බැවින් සාර්ක් කලාපය තුල ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් වන ඉන්දියාව සහ පකිස්ථානය සමඟ ශ්‍රී ලංකාව විසින් ඇති කරගන්නා ලද ද්වීපාර්ශවික ගිවිසුම් ද සලකා බැලීමේදී, එම රටවල් සඳහා නැවත SAFTA යටතේ අපනයන් සිදු කිරීමට වීම සාධ්‍ය නොවේ. | | | |
| 3. **නව කලාපීය වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡා**<br><br>**3.1 බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC)** | පවත්වන ලද සාකච්ඡා වට ගණන | | TLP ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල ඇනුමැතිය ලබා දී ඇත. |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල් 7 න් සැදුම්ලත් බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් හි අරමුණු වන්නේ සාමජික රටවල් අතර වෙළඳ ප්‍රවාහය වර්ධනය කිරීමත් කලාපීය ආර්ථික සබඳතා මනාව පිහිටුවා ගැනීමත් ය.<br><br>ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය කමිටුව විසින් BIMSTEC වෙත TLP ඉදිරිපත් කිරීම සඳහා ඇනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව 2016 පෙබරවාරි මස BIMSTEC මහ ලේකම් කාර්යාලය වෙත TLP ඉදිරිපත් කරන ලදී. වෙළඳ ගිවිසුම් පිළිබඳ කමිටුවේ 21 වන රැස්වීම 2017 මාර්තු මස පැවැත්වීමට නියමිතය. | | | |
| **3.2. ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA)**<br><br>ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) යනු, ඉන්දියානු සාගර වටද්දර රටවල් අතර සහයෝගීතාව සහ සමීප අන්තර් ක්‍රියාකාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ විද්වත් ප්‍රජාව යන ත්‍රෛපාර්ශ්වයයන් එකට කැටුව එන, එම රටවල් අතර පිහිටුවා ගන්නා ලද කලාපීය සංසදයකි. වෙළඳාම හා | අදාල වර්ෂයේ දී පවත්වන ලද සාකච්ඡා වට ගණන | | 02 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI), ඉන්දියානු සාගර වටද්දර රටවල ව්‍යාපාරික සංසදය (IORBF) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යයන කණ්ඩායම (IORAG) යනාදී වශයෙන්, පාර්ශ්ව කණ්ඩායම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් මේ යටතේ පිහිටුවා ඇත. කලාපයේ සහ සාමාජික රාජ්‍යයන්ගේ තිරසාර වර්ධනය සහ තුලිත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කලාපීය ආර්ථික සහයෝගීතාව උදෙසා පොදු පදනමක් ඇතිකිරීම සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) විසින්, (i) සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතතාව, (ii) වෙළඳාම් සහ ආයෝජන පහසුකරණය, (iii) ධීවර කළමනාකරණය, (iv) ආපදා අවදානම් කළමනාකරණය, (v) අධ්‍යයන, විද්‍යා හා තාක්ෂණ, (vi) සංචාරක හා සංස්කෘතික හුවමාරු (vii) කාන්තා සවිබල ගැන්වීම (viii) සමුද්‍රීය ආර්ථික යනාදී ප්‍රමුඛ ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත.<br><br>කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතා **2016** අප්‍රේල් මස **11-13** යන දිනයන් හි ඩුබායි හි දී පැවත්වූ IORA ආර්ථික සහ ව්‍යාපාරික අමාත්‍ය සමුළුවට සහභාගී විය. | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| සමුළුව ආරම්භ කරන ලද්දේ එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ ආර්ථික කටයුතු ගරු අමාත්‍ය සුල්තාන් බින් සයීඩ් අල් මන්සූරි (Mr. Sultan Bin Saeed Al Mansoori) මහතා විසිනි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කරමින් සහ චිරස්ථායී සහ පුළුල් ආර්ථික හා සමාජීය සංවර්ධනය සුරක්ෂිත කෙරෙන නව්‍ය ආර්ථික පරිසරයක් ඇතිකළ යුතු බව ඔහු විසින් පෙන්වා දෙන ලදී.<br><br>IORA අමාත්‍ය මණ්ඩලයේ 16 වන රැස්වීම සහ ඒ ආශ්‍රිත අනෙකුත් රැස්වීම් 2016 ඔක්තෝබර් මස 12-27 දිනයන්හි ඉන්දුනීසියාවේ බාලි සහ ජකර්තා නගරයන් හි දී පැවැත්වෙන ලදී. අමාත්‍ය මණ්ඩලයේ 16 වන රැස්වීම් 2016 ඔක්තෝබර් මස 27 දින ඉන්දුනීසියාවේ බාලි හි දී පවත්වන ලද අතර අනෙකුත් රැස්වීම් වන ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යන කණ්ඩායමෙහි (IORA G) 22 වන රැස්වීම සහ ඉන්දියානු සාගර ව්‍යාපාර සමුළුවෙහි (IORBF) 22 වන රැස්වීම පිළිවෙලින් ඔක්තෝබර් මස 12, 13 දිනයන්හි දී ජකර්තාහි පැවැත්වෙන ලදී. වෙළඳාම හා අයෝජනය පිළිබඳ වැඩ කණ්ඩායම් (WGTI) හි 16 වන රැස්වීම 2016 ඔක්තෝබර් 24 ද, ජ්‍යෙෂ්ඨ නිළධාරීන් (CSO) ගේ | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| 18 වන රැස්වීම 25-26 දිනවල බාලි හි දී පැවැත්වෙන ලදී. වෙළඳාම හා අයෝජනය පිළිබඳ වැඩ කණ්ඩායම් සඳහා මෙම වසරේ දී වාණිජ දෙපාර්තමේන්තුව සහභාගී විය. | | | |
| **4. සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)**<br><br>2010 අප්‍රේල් මාසයේදී භූතානයේදී පවත්වන ලද 16 වැනි සාර්ක් සමුළුව අතර තුරදී සාමාජික රාජ්‍යයන්ගේ නායකයින් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම් කෙටුම්පත අත්සන් කරන ලදී. සියලුම රටවල් මෙම ගිවිසුම සඳහා එකඟතාව පළ කරන ලද අතර සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා ජාතික බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතවන ලදී.<br>SATIS හි විශේෂඥ කණ්ඩායම් රැස්වීම් කිසිවක් මෙම වර්ෂයේ දී නොපැවත්විය.<br><br>SATIS යටතේ ශ්‍රී ලංකාවේ සේවා යෝජනාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර SATIS යටතේ සිය සේවා යෝජනාවලිය සූදානම් කර ඇති බවට ශ්‍රී ලංකාව විසින් | අදාල වර්ෂයේ දී පවත්වන ලද සාකච්ඡා වට ගණන | | SATIS යටතේ ශ්‍රී ලංකාවේ සේවා යෝජනාවලිය අමාත්‍ය මණ්ඩල ඇනුමැතිය ලබා දී ඇත. |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| SAARC මහ ලේකම් කාර්යාලය දැනුවත් කරන ලදී. කෙසේ වුවත් බැඳීම ලේඛණයන්ගේ අවසාන කෙටුම්පත සභාගත වන්නේ සියලුම සාමජිකයන් තමන්ගේ යෝජනාවලි ඉදිරිපත් කර අවසන් වූ පසුවයි. | | | |
| **3. බහු-පාර්ශ්වික වෙළඳ සම්බන්ධතා**<br>ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා මගින් ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින්, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ඇතුළත් වෙනත් බහු පාර්ශ්වීය සංවිධාන කිහිපයක් සමඟ සමීප සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ. | | | |
| **3.1. ලෝක වෙළඳ සංවිධානය තුල ශ්‍රී ලංකාවේ නියෝජනය (WTO)**<br><br>නයිරෝබි යේ පැවැත්වූ WTO අමාත්‍ය සමුළුවේදී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටලු නිරාකරණය කොට අවසන් කිරීම සහ කෘෂිකර්මය, කෘෂිකාර්මික නොවන වෙළඳපොල ප්‍රවේශය (NAMA) හා සේවා යනාදියෙහි පවතින ගැටලු සඳහා ඉදිරි විසඳුම් සෙවීමේ මාර්ගයක් සෙවීම පිළිබඳ 2016 වසරේ දී WTO විසින් සිය අවධානය යොමු කර ඇත. කෙසේ වුවත්, බොහෝ සාමජිකයන්ගේ විවේචන සහ අදහස් තවමත් ක්‍රියාවට නැංවීමට නියමිතය.<br><br>සාමාජික රටවලින් කිහිපයක් සිය දේශීය සහනාධාර , වෙළඳපොළ ප්‍රවේශය, කපු හා අපනයන සීමා පිළිබඳ | ලෝක වෙළඳ සංවිධානය හි ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | | 2016 වසරේ ලෝක වෙළඳ සංවිධානයේ ආසියානු පැසිෆික් කණ්ඩායම් සම්බන්ධීකාරක ලෙස ලෝක වෙළඳ සංවිධානය විසින් ශ්‍රී ලංකාව පත් කරන ලද<br><br>වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ ලෝක වෙළඳ සංවිධාන කමිටු රැස්වීම සඳහා දෙවන වරට ද සහභාගී වීම (CTD) |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ගිම්හාන නිවාඩුව අවසන් වීමට ප්‍රථම විශේෂ කෘෂිකාර්මික සභාව වෙත ගොනු කොට ඉදිරිපත් කර ඇත. එහෙත් සාමජික රටවල් අතර ඉදිරි අරමුණ පිළිබඳ පැහැදිලි වෙනසක් ඇති බවට විශේෂ කෘෂිකාර්මික සභාවෙහි සභාපති විසින් වාර්තා කර ඇත. G-33 මඟින් යෝජනා කරන ලද පොදු තොග සහ විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය පිළිබඳ කටයුතු තවමත් උදාසීන මට්ටමේ පවතී.<br><br>ශ්‍රී ලංකාව කුඩා හා අවධානමට ලක්විය හැකි ආර්ථිකයක් සහිත රටක් ලෙස ලෝක වෙළඳ සංවිධානය විසින් හඳුනාගෙන ඇත. කුඩා සහ අවධානමකින් පෙලෙන ආර්ථිකයන්ගේ අවශ්‍යතාවයන් සැලකිය යුතු සහ අර්ථවත් ආකරයකින් සපුරාලීමට අදාල වගකීම් අමාත්‍යමණ්ඩල ප්‍රකාශනයේ 27 වන වගන්තියෙන් දැක්වේ. එමනිසා ශ්‍රී ලංකාවට ලෝක වෙළඳ සංවිධානයෙන් එහි වෙළඳාම සම්බන්ධ වැඩසටහන් සඳහා තාක්ෂණික සහ ශක්‍යතා සංවර්ධන සහය ලබා ගැනීමේ අවස්ථාව ඇති අතර ඊට අමතරව අමාත්‍ය රැස්වීඑමේදී යලි ප්‍ර ති ඥා දුන් කුඩා ආර්ථිකයන් සඳහා කාර්යය වැඩසටහන තවදුරටත් පවත්වාගෙන යාම ලෝක වෙළඳ සංවිධානයෙහි සංවර්ධන මුල් කරගත් වැඩසටහන් මඟින් ප්‍රතිලාභ ලබා ගැනීම සබ්බ්දහා තවදුරටත් අවස්ථාව සලසා | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| දෙනු ඇත.<br><br>2016 වසරේ ලෝක වෙළඳ සංවිධානයේ ආසියානු පැසිෆික් කණ්ඩායම් සම්බන්ධීකාරක ලෙස ලෝක වෙළඳ සංවිධානය විසින් ශ්‍රී ලංකාව පත් කරන ලද අතර ශ්‍රී ලංකාව විසින් වැඩ කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා නව වැඩසටහන් දියත් කරන ලදී.<br><br>ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තය පිළිබඳ විශේෂ සභාවාරයක් ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රමිති සහ වෙළඳාම් සංවර්ධන අංශය (STDF) සමඟින් සංවිධානය කරන ලද අතර එය 2016 ජූනි මස 21 වන දින පවත් වන ලදී .<br><br>2016 නොවැම්බර් මස 4 දින ලෝක වෙළඳ සංවිධානයේදී පැවැත් වූ වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ ලෝක වෙළඳ සංවිධාන කමිටු (CTD) රැස්වීමේදී කුඩා ආර්ථිකයන් සඳහා සභාවාරයක් වෙන් කෙරෙන ලද අතර එහිදී ශ්‍රී ලංකා පාර්ශවය විසින් ලංකාවේ මෘදුකාංග ක්ෂේත්‍රයේ සංවර්ධනය පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ලදී.<br><br>වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ ලෝක වෙළඳ සංවිධාන කමිටුවෙන් කුඩා ආර්ථිකයන් සඳහා ලබා දුන් සභා වාරයේදී කුඩා ආර්ථිකයන් විසින් ලෝක වෙළඳාමට දායක වීමේදී මුහුණ පාන්නට සිදුවන විශේෂ අභියෝග පිළිබඳ සාකච්ඡා කිරීමට සහ විසඳුම් ලබා දීම සඳහා කාර්ය වැඩසටහනක් | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| අනුගමනය විය. මෙම සභාවාරය සඳහා ශ්‍රී ලංකාව ඉදිරිපත් කිරීමක් සිදු කළ දෙවන අවස්ථාව මෙය වේ. | | | |
| **3.2. වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය**<br>ශ්‍රී ලංකාවේ සිව්වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය 2016 නොවැම්බර් මස 1-3 යන දිනයන් හි ජිනිවා හි පිහිටි ලෝක වෙළඳ සංවිධානයේදී පැවැත්විණි.<br><br>වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරන ලදුව 2012-2016 දක්වා කාල පරාසය ආවරණය කෙරන රාජ්‍ය වාර්තාව සම්පාදනය කරන ලදී.<br><br>ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය වෙනස්වීම පිළිබඳ රටවල් 24 ක් මඟින් ලිඛිත ගැටළු 100 ට වඩා මෙම වර්ෂයේදී ශ්‍රී ලංකාවට ලැබී ඇත. අදාල රේඛීය අමාත්‍යංශයන් සමඟ සම්බන්ධ වීමෙන් එම ගැටලු සඳහා විසඳුම් ලබාදීමට වාණිජ දෙපාර්තමේන්තුව සහ ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිත විසින් කටයුතු කරනු ලැබීය.<br><br>යහ පාලනය සහ නීතිය ඇතුලු බොහෝ ක්ෂේත්‍රවල දියුණුව ඇති කෙරෙන ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණ වැඩසටහනක් දියත් කිරීම ප්‍රශංසනීය බව ඇ.එ.ජ. , යුරෝපා සංගමය, රුසියාව, කැනඩාව, ඉන්දියාව සහ ඕස්ට්‍රේලියාව වැනි රටවල නියෝජිතයන් ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ අදහස් දක්වමින් කියා සිටින | වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය අවසාන කිරීම | | ශ්‍රී ලංකාවේ සිව්වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය සාර්ථකව නිමා කිරීම<br><br>ශ්‍රී ලංකාව බහුපාර්ශවීය නීති ක්‍රමයට අනුකූල වන බවට ලෝක වෙළඳ සංවිධානය විසින් අනුමත කිරීම<br><br>සාමාජික රටවල් අතර ශ්‍රී ලංකාව පිළිබඳ විශ්වාසය ගොඩනැගීම |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ලදී.<br><br>මීට අමතරව, දකුණු කොරියාව, සිංගප්පූරුව, මැලේසියාව, මුරුසිය, සැල්වදෝරය, මොන්ටිනිග්‍රෝව, ගෝතමාලාව, නේපාලය, ජපානය සහ කෙන්යාව යන අතරමැදි රටවල නියෝජිතයන් ද මීට සමාන අදහස් ප්‍රකාශ කරන ලදී.<br><br>වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම සඳහා සහභාගී වූ සාමාජිකයන් විසින් සෘජු විදේශීය අයෝජන සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කරමින් උපකල්පිත සහ සම්පිණ්ඩිත තීරු බදු සහ අයකිරීම් ව්‍යුහය වෙත ශ්‍රී ලංකාවේ අවධානය යොමු කරවන ලදී. උපකල්පනය කළ හැකි විනිවිද භාවයෙන් යුත් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති මඟින් සෘජු විදේශීය අයෝජන ආකර්ෂණය කර ගැනීමේ හැකියාවක් ශ්‍රී ලංකාවට ඇත. | | | |
| **3.3. ඉදිරිපත් කිරීම - "Sri Lanka An Emerging Economic Hub (ආසියාවේ නැගී එන ආර්ථික කේන්ද්‍රය ; ශ්‍රී ලංකාව )"** , ලෝක වෙළඳ සංවිධානයේදී<br><br>2016 නොවැම්බර් මස 1-3 දිනවල ලෝක වෙළඳ සංවිධානයේදී පැවත්වූ ශ්‍රී ලංකාවේ සිව්වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයට සමගාමීව ශ්‍රී ලංකාව අනුග්‍රහ දැක්වීමක් වශයෙන් වෙනත් වැඩසටහනක් දූත මෙහෙවර මඟින් සංවිධානය කරන ලදී. | සහභාගීත්වය | | WTO සාමාජික රටවලින් 150 වැඩි සහභාගීත්වය, WTO ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්,අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය, ආර්ථික සමුළුව, UNCTAD, WTO නීති පිළිබඳ උපදේශන මධ්‍යස්ථානය ආදිය |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ලෝක වෙළඳ සංවිධානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් යොනෝව් ෆෙඩ්‍රික් අගා (Yonov Fedric Agah)මහතා එම වැඩසටහනට සහභාගී වන ලදී. ශ්‍රී ලංකාවේ නියෝජිත කණ්ඩායමේ ප්‍රධානිත්වය දරන ලද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතා වන අතර ඔහු විසින් “Sri Lanka An Emerging Economic Hub (ආසියාවේ නැගී එන ආර්ථික කේන්ද්‍රය ; ශ්‍රී ලංකාව )" යන තේමාව යටතේ **150** ක ටත් වැදි සහභාගීත්වයක් සහිත සභාවක් ඉදිරි පිටදී ශ්‍රී ලංකාවේ ආර්ථික දෘෂ්ඨිකෝණය පිළිබඳ ඉදිරිපත් කරන ලදී.එහිදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අංශයේ අතිරේක ලේකම් විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ වෙළඳ ක්‍රියාකාරීත්වය පිළිබඳ සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලදී. එය වඩාත් සිත් ඇදගන්නසුලු දේශනයක් වූ අතර ඉන් අනතුරුව ප්‍රශ්නවලට පිළිතුරු ලබදීමේ සැසියක් ද පැවැත්විණි. ශ්‍රී ලංකාවේ මෙම ජයග්‍රහණය පිළිබඳව සහභාගී වූවන් බොහොමයක් ප්‍රශංසා කළ අතර අලුතෙන් පිහිටුවාගත් ජාතික ඒකීය රජයේ දේශපාලන වෙළඳ සහ ආර්ථික ප්‍රතිසංස්කරණයන් පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය තබන ලදී. | | | |
| **3.4. වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ** | අමාත්‍ය සමුළුව නියෝජනය කිරීම | | 2016 ජූලි මස 17-22 දිනවලදී කෙන්යාවේ නයිරොබි නගරයේදී |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| **එක්සත් ජාතීන්ගේ**<br><br>**සමුළුව** (UNCTAD):<br><br>වෙළදාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවෙහි අමාත්‍ය සමුළුවේ 14 වැනි සැසිවාරය 2016 ජූලි මස 17-22 දිනවලදී කෙන්යාවේ නයිරොබි නගරයේදී පැවැත්විණි. ඒ සඳහා ශ්‍රී ලංකාවේ නියෝජිත කණ්ඩායමේ ප්‍රධානීත්වය දරන ලද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතාය.<br><br>සමුළුවේ වැඩසටහන් අතරින් අමාත්‍ය විවාද, ඉහළ මට්ටමේ වට මේස සාකච්ඡා, තේමාත්මක වැඩසටහන්, ලෝක අයෝජන සම්මන්ත්‍රණයක් , ගෝලීය වෙළද භාණ්ඩ පිළිබඳ සම්මන්ත්‍රණයක්, තරුණ සංසදයක් සහ සිවිල් සමාජ රැස්වීමක් යනාදිය විශේෂිත විය. ඉදිරි සිව් වසර සඳහා වෙළදාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට අදාල කර්තව්‍යන් ලෙස (නයිරෝබි ඇසිමියෝ) "Nairobi Azimio" (දේශපාලන ප්‍රකාශය ) සහ හයිරෝබි මාෆිකියානෝ "Nairobi Maafikiano" (නයිරෝබි ප්‍රතිඵල සම්මුතිය ) සමුළුව විසින් සම්මත කරගන්නා ලදී.<br><br>සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ සංවර්ධිත රටවල් අතර සාධාරණීය වෙළදාම සුරක්ෂිත කිරීමටත් වෙළදාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ | | | පැවැත්වූ වෙළදාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවෙහි අමාත්‍ය සමුළුවේ 14 වැනි සැසිවාරය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| පූර්ව ගිවිසුම් සඳහා පියවර ගෙන ඇති බවට සහතික කරගැනීමත් මෙම ලේඛන දෙකෙහි අරමුණ වේ. | | | |
| **3.5. යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම** (EU GSP+)<br><br>වාණිජ දෙපාර්තමේන්තුව විසින් යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රම පහසුව ශ්‍රී ලංකාවට නැවත ලබා ගැනීම පිළිබඳ අනු කමිටු සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්වීමෙන් අනතුරුව එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුති 27 සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් ට අනුව සිදු කරන ලද අනුකූලතාවන් සහ ප්‍රගතිය පිළිබඳ අදාල තොරතුරු සම්පාදනය කරන ලදී. උපකාරක ඇමිණුම් සියල්ල ඇතුලත් අවසාන වාර්තාව බ්‍රස්ල් හි ශ්‍රී ලංකා දූත මෙහෙයුම හරහා 2016 ජූනි මස 14 වන දින යුරෝපා කොමිසම වෙත ඉදිරිපත් කරන ලදී. යුරෝපා කොමිසම විසින් 2016 ජූලි මස12 වන දින් එය භාරගත් බවට සහතික කරන ලදී. | ශ්‍රී ලාංකේය අපනයන කරුවන් සඳහා යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම<br>(EU GSP+ ) | | උපකාරක ඇමිණුම් සියල්ල ඇතුලත් අවසාන වාර්තාව යුරෝපා කොමිසම වෙත ඉදිරිපත් කරන ලද අතර යුරෝපා කොමිසම විසින් ජූලි මස 12 වන දින එය භාරගත් බවට සහතික කරන ලදී. |
| **3.6. මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා යුරෝපා සංගමයේ තහනම ඉවත් කිරීම (EU-IUU)**<br>වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ධීවර අධිකාරිය සමඟ මෙන්ම යුරෝපා කොමිසම සමඟ ද එක්ව යුරෝපා අධිකාරීන් විසින් | තහනම ඉවත් කිරීම | | ශ්‍රී ලංකාවෙන් මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා යුරෝපා සංගමයේ තහනම 2016 ජූනි මස 23 දින ඉවත් කරන ලදී |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| පනවනු ලබන විවිධ කොන්දේසීන්ට අනුකූලව කටයුතු කරන ලදී. ඒ සඳහා තීරණ ක්‍රියාත්මක කිරීමේ මණ්ඩලයේ ප්‍රකාශනය 2016 ජූනි මස 23 දින යුරෝපා සංගමයේ නිල ප්‍රවෘත්ති පත්‍රයේ පල වීමත් සමඟ ම ශ්‍රී ලංකාවෙන් මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා යුරෝපා සංගමයේ තහනම ඉවත් විය. මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මේ වන විට තහනමට පෙර පැවති ප්‍රකෘති තත්ත්වයට ක්‍රම ක්‍රමයෙන් පත්වෙමින් ඇත. | | | |
| **3.7. වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුම:**<br><br>ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුමෙහි මුල් කෙටුම්පත සඳහා ශ්‍රී ලංකාවේ අනුමැතිය ලෝක වෙළඳ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් රොබැර්ටො අසවේදු (Roberto Azevêdo) මහතා වෙත එහි නිත්‍ය නියෝජිතවරයා විසින් 2016 මැයි මස 31 වන දින ඉදිරිපත් කරන ලදී.ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුම අනුමත කරන ලද 81 වෙනි සාමාජිකයා ශ්‍රී ලංකාව වේ. සාමජික රටවල් මඟින් 3/2 ක් අදාල අනුමත කිරීම් සංඛ්‍යාව (110) සම්පූර්ණ කල පසු ගිවිසුම බලාත්මක වනු ඇත. 2017 ජනවාරි මස 10 වන දින වන විට සාමජික රටවල් 105 විසින් ගිවිසුම අනුමත කර ඇත.<br>වෙළඳාම පහසුකරණය පිළිබඳ | ගිවිසුම අනුමත කිරීම සහ පහසුකරණය පිළිබඳ ජාතික කමිටුව පිහිටුවීම | | වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුමෙහි මුල් කෙටුම්පත සඳහා ශ්‍රී ලංකාවේ අනුමැතිය 2016 මැයි මස 31 වන දින ඉදිරිපත් කරන ලදී අමාත්‍ය මණ්ඩලය විසින් වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුව (NTFC) පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.<br>ජාතික වෙළඳ ද්වාරය පිහිටුවීම |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ගිවිසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ ශක්‍යතා සංවර්ධනය හඳුනා ගැනීමට සහ ප්‍රමාණය තීරණය කිරීමට වාණිජ දෙපාර්තමේන්තුව ලෝක වෙළඳ ස\විධානය, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යසථානය, ලෝක ආර්ථීක සමුළුව තුළින් වෙළඳාම පහසුකරණය සඳහා ගෝලීය සන්ධානය, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO), ලෝක රේගු සංවිධානය සමඟ එකතුව කටයුතු කරයි. අමාත්‍ය මණ්ඩලය විසින් වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුවක් (NTFC) පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදුන් අතර වෙළඳාම පහසුකරණයට අදාල රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ වෙළඳ මණ්ඩලයේ නියෝජිතයන්ගෙන් එම කමිටුව සමන්විත වේ. මෙම වෙළඳාම පහසුකරණය පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධීකරක ලෙස ශ්‍රී ලංකාව විසින් ලෝක බැංකු කණ්ඩායම තෝරාගෙන ඇත. එමනිසා ලෝක බැංකු කණ්ඩායම සමඟ සමීප සම්බන්ධතාවයක් වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුව විසින් පවත්වා ගත යුතු වේ.<br><br>තාක්ෂණික, මූල්‍යමය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය සහය පිළිබඳ සැලසුම් කිරීම සඳහා 2016 නොවැම්බර් මස ලෝක බැංකු කණ්ඩායම විසින් ශ්‍රී ලංකා සංචාරයක නිරත විය. | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| **3.8. ශ්‍රී ලංකාව තුල ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන සහ ආරක්ෂණ නීති පැනවීම**<br><br>ශ්‍රී ලංකාව තුල ප්‍රපාතන විරෝධීඑ සහ ප්‍රතිතෝලන සහ ආරක්ෂණ නීති පැනවීම ක්‍රියාත්මක කිරීම දිගු කලක සිටම අවශ්‍යව පැවතියකි. **2005** මැයි මස **12** වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නීති කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලබා දී ඇත. **2006** ජනවාරි මස පත්‍රිකා දෙකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව **2006** අප්‍රේල් **4** වන දින එය දෙවන වර කියවීම සිදු කරන ලදී. එහිදී අමාත්‍යවරුන් කිහිපදෙනෙකු විසින් පත්‍රිකා දෙකෙහි විධිවිධාන සම්බන්ධයෙන් කරුණු විමසන ලද අතර ඒව විශේෂ කමිටු යටතේ තවදුරටත් සාකච්ඡා කරන ලදී. එම රැස්වීම්වල සාකච්ඡා වූ කරුණු අනුව බිල්පත් දෙකෙහි කෙටුම්පතට සුදුසු සංශෝධන සිදු කිරීම සඳහා නීතිකෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීමට තීරණය කරන ලදී. 2010 පෙබරවාරි මස පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද බැවින් එම බිල්පත ඉදිරිපත් කිරීමටත් පෙර අහෝසි වූ බවට සැලකේ.<br><br>ඉන්පසු 2014 ජූලි මස තවත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර මුදල් හා ක්‍රමසම්පාදන | අසාධාරණ වෙළඳාම වැළැක්වීම සහ දේශීය කර්මාන්ත සුරක්ෂිත කිරීම | | 2016 ඔක්තෝබර් මස 18 වන දින දින එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.. |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| අමාත්‍යාංශයේ නිරීක්ෂණයන්ට හා නිගමනයන්ට අනුව නීතිපතිවරයා විසින් මෙය ප්‍රමුඛස්ථානයක් දිය යුතු කටයුත්තක් සේ සලකා නීති කෙටුම්පත් කිරීම සිදු කර ඇත. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදුව 2016 ඔක්තෝබර් මස 18 වන දින එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. | | | |
| **3.9. මාර්ගයෙහි නොදිවෙන ශ්‍රී ලංකාවේ නව වායව ටයර් කිහිපයක් පිළිබඳ ප්‍රතිතෝලන තීරු බදු විමර්ශනය (“OTR”)**<br><br>ජාත්‍යන්තර වෙළඳ පාලක මණ්ඩලය වන වන එක්සත් ජනපදයේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2016 ජනවාරි මස 8 වන දින ශ්‍රී ලංකාව "මාර්ගයෙහි නොදිවෙන ශ්‍රී ලංකාවේ නව වායව ටයර් කිහිපයක් "අනුගෲහිත අපනයනයක යෙදෙන බවට පෙත්සමක් ගොනු කොට ඇත. ශ්‍රී ලංකාවේ මාර්ගයෙහි නොදිවෙන වායව ටයර් නිෂ්පාදකයන් සඳහා අධාර ලැබෙන වැඩසටහන් 22ක් පිළිබඳ විමර්ශනයක් සිදු කරන ලෙසට පෙත්සම ගොනු කරනු ලැබූ ටයිටන් ටයර් සමාගම සහ එක්සත් ලෝහ, කඩදාසි සහ වන වගා, රබර්, නිෂ්පාදන, බලශක්ති අනුබද්ධිත කාර්මික හා සේවා කම්කරුවන්ගේ ජාත්‍යන්තර සංගමය (පෙත්සම්කරුවන්) | | | 3.78% ක් වූ සිය මූලික නිර්ණනය 2.18% දක්වා අඩු කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| එක්සත් ජනපදයේ වාණිජ දෙපාර්තමේන්තුවෙන් ඉල්ල සිටින ලදී.<br><br>එක්සත් ජනපදයේ දේශීය කර්මාන්ත සඳහා හානි සිදු වීම හෝ හානි වීමේ තර්ජනයක් මෙමගින් ඇතිවන බවට ද පෙත්සමේ සඳහන් වේ.<br><br>අධාර වැඩසටහන් මඟින් සිය දේශීය කර්මාන්තයන්ට හානි පැමිණෙන බවත් එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදාල ආනයන සඳහා ශ්‍රී ලංකාව තුල ප්‍රතිතෝලිත අනුග්‍රහ ආධාර ලැබෙනවා ද යන්න නිර්ණය කිරීම පිණිස විමර්ශනය අඛණ්ඩව සිදු කළ යුතු බවට එකසත් ජනපද ජාත්‍යන්තර වෙළඳ කොමිසම (ITC) විසින් සිය පළමු තීන්දුව නිකුත් කරන ලදී.<br><br>නීතිපති දෙපාර්තමේන්තුවේ ද එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ නීති ආයතනයේද සහය ඇතුව මූලික ප්‍රශ්නාවලි සහ අතිරේක ප්‍රශ්නාවලි සඳහා පිළිතුරු ලබාදුන් පසු එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අයෝජන මණ්ඩලය, ශ්‍රී ලන්කා රේගුව, රබර් සංවර්ධන මණ්ඩලය, මුදල් අමාත්‍යංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) වෙත 2016 අගෝස්තු 23-26 දක්වාද කැම්සො ලෝඩ්ස්ටාර් (පෞලි ) (Camso Loadstar (Pvt) Ltd.) සමාගම වෙත 29 දා සිට සැප්තැම්බර් මස 2 තෙක් | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| විමර්ශන මෙහෙයුමක් දියත් කිරීම සඳහා සංචාරයක නිරත විය.<br><br>ශ්‍රී ලංකාවේ මාර්ගයෙහි නොදිවෙන වායව ටයර් (OTR) සඳහා ප්‍රතිතෝලන බදු විමර්ශනය (CVD) පිළිබඳ මත විමසුමක් එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ දී නොවැම්බර් මස 3 දින පැවැත්වීය. වැඩසටහන් තුනක් ප්‍රතිතෝලනාත්මක බවත් සහනාධාර සහ ප්‍රතිතෝලන බදු පියවර පිළිබඳ ගිවිසුමෙහි (SCM Agreement) VII වන ඇමිණුමේ (b) කොටසෙහි දක්වා ඇති කොන්දේසි අනුව 2015 දෙසැම්බර් මස 31 වන දින තෙක් ශ්‍රී ලංකාවට අපනයන සහනාධාර ලබාදීම කොහෙත්ම තහනම් කර නොමැති බවට ශ්‍රී ලංකා රජය කරුණු ගෙන හැර දක්වන ලදී. කැම්සො ලෝඩ්ස්ටාර් (පෞලි ) සමාගම හා ශ්‍රී ලංකාවේ මාර්ගයෙහි නොදිවෙන වායව ටයර් අපනයනකරුවන් වෙත **2.18%** ප්‍රතිතෝලන බදු අනුපාතිකයක් ලබාදීමෙන් එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව විසින් අවසන් නිර්දේශය නිකුත් කරන ලදී. | | | |
| **3.10. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය** (GSTP)<br><br>සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) පිළිබඳ ගිවිසුම 1989 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) | GSTP යටතේ අපනයන | | ඇ.ඩො.මි. 45.14 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| යනු, දකුණ - දකුණ අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි (UNCTAD) අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි.<br><br>මෙම ක්‍රමය යටතේ 2016 වසරේ දී ශ්‍රී ලංකාව ඇ.ඩො.මි 45.14 වටිනා අපනයනයන් ද ඇ.ඩො.මි 0.03 වටිනා ආනයනයන් ද සිදු කර ඇත. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් මෙක්සිකෝව හා පේරු රාජ්‍යට කුරුඳු අපනයනය කරන අතර 2015 වසරේ මෙම ක්‍රමය යටතේ අපනයනය ට වඩා ඇ.ඩො.මි 4.00 ක අපනයන පහත වැටීමක් මේ වසරේ දී දක්නට ලැබේ. | | | |
| **3.11. යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය සහ අනෙකුත් වරණීය ක්‍රමයන්හි වර්ධනයන්**<br><br>යුරෝපා කොමිසම සහ සංගමයේ පාර්ලිමේන්තුව විසින් 2014.01.01 දින සිට ක්‍රියාත්මක වූ නව GSP යෝජනා ක්‍රමය අනුමත කරනු ලැබ ඇති අතර ශ්‍රී ලංකාව ද එහි අර්ථලාභියෙකි.<br><br>තවද 2014 සිට යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමයේ කලාපයන් අතර සමුච්චිත (Cross Regional Cumulation) විධිවිධාන යටතේ, ඉන්දුනීසියානු සම්භවීය HS ශීර්ෂ 2401 හි නොනිමි | GSP යටතේ අපනයන | | ඇ.ඩො.මි.3,393.72 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| දුම්කොළ සක ප්‍රතික්ෂේපිත දුම්කොළ රැස් කිරීම හා යුරෝපා සංගමය වෙත සිගරට් අපනයනය කිරීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබී ඇත.<br><br>**<u>එක්සත් ජනපද වරණීය පොදු ක්‍රමය</u>** <u>(US GSP)</u><br><br>එක්සත් ජනපද වරණීය පොදු ක්‍රමය වැඩසටහන 2013 ජූනි මස 31 වන දින අහෝසි වී 2015 ජූනි මස 29 දින සිට නැවත ව්‍යවස්ථාපිත කරන ලද්දේ 2017 දෙසැම්බර් මස 31 වන දින තෙක් වරණීය පොදු ක්‍රමය සඳහා නැවත අවසර දෙමිනි. මෙම පනත මඟින් GSP ප්‍රතිලාභය 2013 ජූලි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සකසා ඇත.<br><br>ඌණ සංවර්ධිත රටවල (LDCs) සහ අප්‍රිකානු වර්ධනය සහ අවස්ථා පනතට (AGOA- African Growth and Opportunity Act) ඇතුලත් රටවල භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගෝලීය වරණීය ක්‍රමය යටතේ තීරු බදු රහිත සහනයක් ලැබෙන ලෙස සෑම GSP ලාබී රටකම භාණ්ඩ ප්‍රවාහන සඳහා තීරු බදු රහිත ක්‍රමවේදය දීර්ඝ කිරීමට, ශ්‍රී ලංකාව අනෙකුත් GSP ලාබීන් සමඟින් ඉල්ලුම් පෙත්සමක් ජාත්‍යන්තර වෙළඳ පාලක මණ්ඩලයට ඉදිරිපත්කරන ලදී.<br><br>GSP ලාබී සියලුම රටවල් සඳහා භාණ්ඩ ප්‍රවාහන තීරු බදු රහිත ක්‍රමවේදය දීර්ඝ කිරීම පිළිබඳ ජාත්‍යන්තර වෙළඳ පාලක මණ්ඩලය විසින් 2017 මුලදී නිවේදනය කරනු ලැබේ. | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| **<u>ජපාන වරණීය පොදු ක්‍රමය</u>**<br><u>(GSP)</u><br><br>තාවකාලික තීරුබදු පියවර පනත බලාත්මක කිරීම සඳහා ආඥා පනතෙහි සංශෝධනය මුල් කරගනිමින් ලිහිල් කරන ලද වරණීය ප්‍රභවස්ථාන නීති ජපාන වරණීය පොදු ක්‍රමය යටතේ ප්‍රකාශයට පත්කොට ඇත.<br><br>සංශෝධනයත් සමඟ නිෂ්පාදිතය රෙදි වර්ගවලින් (තනි ක්‍රියාවලි න්‍යාය ) සිදු කරන අවස්ථාවේ ජේහවීය භාණ්ඩ ලෙස රේගු වර්ගීකරණයෙහි 61 වන පරිච්ඡේදයේ ඇති නිෂ්පාදන (ගොතන හෝ වියන ලද ඇඟළුම්) සුදුසුකම් ලබයි. මෙය 2015 අප්‍රේල් මස 01 සිට බලාත්මක විය. | | | |
| **3.12. වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (CFC)**<br><br>වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (CFC) යනු 1989 එක්සත් ජාතීන්ගේ රාමුව තුල පිහිටුවන ලද ස්වතන්ත්‍ර අන්තර් රාජ්‍ය මූල්‍ය ආයතනයකි. එය එක්සත් ජාතීන්ගේ සාමාජිකයන් 101 දෙනෙකු හා අන්තර් රාජ්‍ය ආයතන 10 කින් යුත් පාර්ශවකරුවන් 111 න් සමන්විත සංවිධානයකි. වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (CFC) ආරම්භයේ සිටම ශ්‍රී ලංකාව එහි | ගිවිසුම නිම කිරීම | | භාණ්ඩ සඳහා පොදු අරමුදල පිහිටුවීමේ සංශෝධිත ගිවිසුම සඳහා අනුමැතිය ලබාදීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය නීතිපති ජනරාල්තුමා විසින් සංශෝධිත කෙටුම්පතේ නෛතික අනුමැතියට යටත්ව,2016 නොවැම්බර් මස ලැබිණි. |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| සාමජිකයකු වන අතර තේ, කිරි නිෂ්පාදන, කුරුඳු, කොහු, උණ අංකුර, රබර්, පොල්, මත්ස්‍ය නිෂ්පාදන ආදී භාණ්ඩ අංශ සඳා ප්‍රතිලාභ ලබන්නෙක්ද වේ. භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සමාජීය-ආර්ථික සංවර්ධනය ඇති කිරීම සමස්ත සමාජීය සංවර්ධනයට දායක වීම යන නියමයෙන් යුතුව CFC දිගින් දිගටම භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි නියැලෙන්නන් හට සහන ණය ප්‍රදාන ලබාදීම මඟින් උපකාර කරයි.<br><br>පොදු අරමුදල පිහිටුවීම සඳහා ගිවිසුමේ ප්‍රධාන අංශ 1989 අරමුදල පිහිටුවාගත් දින සිටම විවිධ වෙනස්කවලට ලක්වූ බව හදුනාගනිමින්, ජාත්‍යන්තර සංවර්ධන සුසමාදර්ශය තුල පැතිර පවත්නා මෙහෙයුම් සාර්ථක කරගැනීමට හැකිවන ලෙස ගිවිසුම සංශෝධනය කිරීමට CFC සාමාජිකයින් විසින් එකඟ වන ලදී.<br><br>ඒ අනුව, . CFC අධ්‍යක්ෂක මණ්ඩල නිර්දේශය ද හා පාලක සභාවේ අනුමැතිය ද ඇතිව සංශෝධන ක්‍රියාවලිය ඇරඹිණි. මුල් ගිවිසුම සඳහා සංශෝධනයන් කිහිපයක් හදුනාගත් පසු, සංශෝධිත ගිවිසුමේ අවසන් කෙටුම්පත සකස් කෙරිණි. මුල් ගිවිසුම සඳහා සංශෝධන බලාත්මක වන්නේ සියලුම සාමජිකයන් විසින් සිය අනුමැතිය CFC මහ ලේකම් කාර්යාලය වෙත දැනුම්දුන් පසුව ය.<br><br>ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුව කර්මාන්ත | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හරහා භාණ්ඩ සඳහා පොදු අරමුදල පිහිටුවීමේ සංශෝධිත ගිවිසුම වෙත අනුමැතිය ලබාදීම සඳහා 2016 ඔක්තෝබර් මස අමාත්‍යාංශ සංදේශයක් ඉදිරිපත් කළ අතර නීතිපති ජනරාල්තුමා විසින් සංශෝධිත කෙටුම්පතේ නෛතික අනුමැතියට යටත්ව, ඒ සඳහා 2016 නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි | | | |
| 4. **වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය** | | | |
| 4.1 **වෙළඳ සල්පිල් සඳහා සහභාගීත්වය**<br><br>තොරතුරු හුවමාරු කරගැනීමට අවැසි වේදිකාවක් සඳහා කාර්මික තාක්ෂණයේ සහ විශේෂ වුවමනාවන්ගේ ඉහළ යෑම හමුවේ වෙළඳ සල්පිල් හුදු සල්පිළක මට්ටමේ සිට ගැනුම් හා විකුණුම් සඳහා වැදගත් තොරතුරු සපයන, වෙළඳ පාර්ශවකරුවන්ට හමුවීමේ අවස්ථාව සලසා දෙන සාර්ථක ඵලදායී වෙළඳපොළක් ලෙස වර්ධනය වී ඇත.<br>වාණිජ නිලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ සංචාර්ක ප්‍රදර්ෂන කරුවන් හා අදාල රාජ්‍ය නිලධාරීන් සඳහා වෙළඳ සල්පිල් සඳහා සහභාගීත්වය, විවිධ ප්‍රවර්ධන වැඩසටහන්, කර්මාන්ත හා සුපිරි වෙළඳසැල් සඳහා දාම සංචාරයන්, වැඩමුළු, මාධ්‍ය හමු සංවිධානය කරන ලදී.<br><br>ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල පැවැත්වීමට නියමිත වෙළඳ සල්පිල් සඳහා ප්‍රචාරණ | ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය<br><br>වාණිජ නිලධාරීන් සහභාගී වූ ප්‍රදර්ශන ගණන<br><br>සහභාගී වූ සංචාරකයින්/ ගැනුම්කරුවන් ගණන | | වෙළඳ ප්‍රදර්ශන 62 ( 400 වැඩි ශ්‍රී ලාංකික ප්‍රදර්ශනකරුවන්/සංචාරකයින්)<br><br>ශ්‍රී ලාංකාවේ ප්‍රථම සහභාගිත්වය - ප්‍රදර්ශන 03<br><br>ප්‍රදර්ශන 200 වැඩියෙන්<br><br>300 වැඩියෙන්<br>2016 ලෝක අපනයන සංවර්ධන සමුළුව (WEDF) සඳහා-171 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ලබාදීම හරුණුකොට වාණිජ නිලධාරීන් විසින් නිරන්තරයෙන් අදාල ප්‍රදර්ශනයන් සඳහා සහභාගී වේ. | | | |
| 4.2 **වෙළඳාම, ආයෝජන සහ සංචාරක ආරවුල් විසඳීම**<br><br>වාණිජ දෙපාර්තමේන්තුව සහ වාණිජ නිළධාරීන් දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන්ගේ වෙළඳාම පිළිබඳ පැන නගින්නා වූ ගැටළු සඳහා විසඳුම් ලබාදීමෙහි ලා මහඟු සේවයක් ඉටු කරයි. විදේශ රටවල ස්ථාපිත වාණිජ දූත මණ්ඩල විසින් විදේශීය පාර්ශවකරුවන්ගේ වෙළඳ ආයෝජන සහ සංචාරක කටයුතු පිළිබඳ ගැටලු විසඳීමට දායක වෙයි.<br><br>විදේශීය ගැනුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති වෙළඳ විමසීම්වලට අදාල ශ්‍රී ලංකා අපනයනකරුවන්ට ද, එමෙන්ම වාණිජ මණ්ඩල , අපනයන සංවර්ධන මණ්ඩල වැනි ආයතන වෙත ද කඩිනම් පියවර ගැනීම සඳහා සෘජුවම භාරදෙනු ලබයි. වාණිජ මණ්ඩල, අපනයන සංවර්ධන මණ්ඩල වැනි ආයතනවල සාමාජිකයන්ගේ එවැනි විමසීම් සඳහා අදාල විදේශීය ගැනුම්කරුවන් සොයා ගැනීම සඳහා වාණිජ නිලධාරීන් තම සහය ලබා දෙයි.<br><br>එමෙන්ම ආයෝජන හා සංචාරක කටයුතු සම්බන්ධයෙන් වාණිජ නිලධාරීන් වෙත ලැබෙන විමසීම් සඳහා ඔවුන් විසින් සුදුසු පරිදි සහය මෙන්ම | වාණිජ නිලධාරීන් විසින් තොරතුරු සපයන ලද විමර්ශන (වෙළඳ/ ආයෝජන/සංචාරක ) | | 1,871 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| තොරතුරු ලබාදෙන අතර ඒවා අදාල ශ්‍රී ලාංකික ආයතන/ අමාත්‍යාංශ වෙත යොමු කිරීමටද කටයුතු කරයි. | | | |
| **4.3 වෙළඳ ආරවුල් විසඳීමට සහය**<br>අපනයන කරුවන් හා ආනයන කරුවන් අතර ඇතිවන වාණිජ ආරවුල් සඳහා සාමකාමී විසඳුම් ලබදීමට වාණිජ දෙපාර්තමේන්තුව මැදිහත් වේ. අපක්ෂපාතී සහ සාමකාමී විසඳුම් සොයාගැනීම හා අන්‍යෝන්‍යව සාකච්ඡා කොට විසඳා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා සුදුසු පියවර ගනු ලබයි. | වාණිජ නිලධාරීන් විසින් විසඳීමට සහය වූ ආරවුල් ගණන | | ආරවුල් 228<br>(22 සාමකාමීව විසඳා ඇත) |
| **4.4 විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය**<br>විදේශ රටවල ස්ථාපිත වාණිජ නිලධාරී විසින් රට තුලට විදේශීය සෘජු ආයෝජන ලබාගැනීමෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. එහිදී ඔවුන් විසින් ප්‍රධාන පෙලේ අයෝජකයන් සහ අයෝජන ආයතන සමඟ මනා සම්බන්ධතාවයක් පිහිටුව ගනු ලබයි. මීට අමතරව ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත වඩාත් පුළුල් කිරීම සඳහා බලවත් බද්ධ ව්‍යාපාර පර්ශවකරුවන් හඳුනා ගැනීමට ශ්‍රී ලංකාවෙන් පරිබාහිර ව්‍යාපාරික නියෝජිතයන් සමඟ ව්‍යාපාර හමු සංවිධානය කිරීමද ඔවුන් සිදු කරනු ලබයි. | ආයෝජන යෝජනා ගණන<br><br>ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් ගණන<br><br>ආයෝජන නියෝජනයන් ගණන | | යෝජනා 107<br><br>සත්කාරක රටෙහි ආයෝජන පිළිබඳ සම්මන්ත්‍රණ පවත්වන ලදී.<br><br>ආයෝජන නියෝජනයන් ශ්‍රී ලංකාව වෙත හා ශ්‍රී ලංකාවෙන් සූදානම් කරන ලදී. |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ඒ අනුව අදාල වර්ෂයේදී, වාණිජ නිලධාරීන් විසින් එක් එක් ක්ෂේත්‍රයට අදාල සවිමත් ආයෝජකයන් හමු වී දිවයිනෙහි පවතින ආයෝජන අවස්ථා පිළිබඳ විස්තර සැපයීමට කටයුතු කර ඇත. | | | |
| **4.5 සංචාරක ප්‍රවර්ධනය**<br><br>වාණිජ නිලධාරීන් විසින් සංචාරක ක්ෂේත්‍රයේ විභවීය ලක්ෂණ හඳුනා ගනිමින් ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහයද ඇතිව, විදේශ රටවල් තුල විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලබයි. විශේෂ සංසද සහ සම්මේලන සංවිධානය, සංචාරක කණ්ඩායම් සඳහා සංචාර සංවිධානය, සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සූදානම් කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දීම, මාධ්‍ය නියෝජන, ශ්‍රී ලංකාව වෙත FAM සංචාර, සංචාරප්‍රවර්ධන මණ්ඩල පිහිටුවීම, සත්කාරක රට තුල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්ගෙන් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම ආදිය ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා වාණිජ නිළධාරීන් විසින් අනුගමනය කරනු ලහන | සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ගණන | | 22 සංචාරක ප්‍රදර්ශනයට සහභාගී වීම<br>(380 අධික ශ්‍රී ලංකා සංචාරක සමාගම්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලන්කන් ගුවන් සේවය )<br><br>සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාර- 8<br>FAM සංචාර-100 අධික සංචාර/ ශ්‍රී ලංකාව පිළිබඳ විස්තරාත්මක මාධ්‍ය වැඩසටහන්/ සඟරා ලිපි සම්මන්ත්‍රණ, වැඩමුළු හා සංස්කෘතික රාත්‍රී වැඩසටහන් සංවිධානය |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ප්‍රධාන ක්‍රමෝපායන් වේ. | | | |
| **4.6 තාක්ෂණික සහය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**<br><br>වර්ෂය තුලදී, ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් සහ වෙළඳ ගනුදෙනු හැකියාව අදාල රාජ්‍ය නිලධාරීන් තුළ වර්ධනය කිරෙමේ අභිලාශයෙන් වෙළඳාම් ප්‍රවර්ධන සංවිධාන සහ අපනයන සමාගම්වල නියෝජිතයින් හා වාණිජ දෙපාර්තමේන්තුව WTO, UNESCAP, ITC සහ අනෙකුත් විවිධ සංවිධාන යන්ගේ ද සහය ඇතුව පහත දැක්වෙන සම්මන්ත්‍රණ පවත්වන ලදී.<br>• තීරුබදු රහිත පියවාරයන් සහ ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාවේ ප්‍රමිති සහ රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීම<br>• WTO නයිරොබී ගටලු වලින් පසු තත්වය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්ති සම්පාදක වැඩමුළුව ශ්‍රී ලංකාවේ පැවැත් වීම<br>• වෙළඳ පිළියම් පිළිබඳ ශක්‍යතා සංවර්ධන වැඩසටහන<br>• සේවා වෙළඳාම පිළිබඳ සම්මන්ත්‍රණය<br>• බහුපාර්ශවික වෙළඳ ක්‍රමය තුල වෙළඳාම මුල් කරගත් සංවර්ධනය පිළිබඳ කලාපීය වැඩමුළුව<br>• වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ සම්මන්ත්‍රණය | සංවිධානය කරන ලද වැඩසටහන් ගණන | | සම්මන්ත්‍රණ, වැඩමුළු 07 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| • ලෝක වෙළඳ සංවිධානය- වෙළඳාම පහසුකරණ ගිවිසුම පිළිබඳ සම්මන්ත්‍රණය | | | |
| **4.7 වෙළඳාම හා බැඳි යුරෝපා සංගමය අනුගෘහිත ශක්‍යතා සංවර්ධන ව්‍යාපෘතිය**<br>"යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වෙළඳාම සම්බන්ධ සහය: කලාපීය හා යුරෝපා සංගමයේ වෙළඳපොළ තුල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ තරගකාරීත්වය වර්ධනය කිරීම" යන ව්‍යාපෘතිය **,2013** දෙසැම්බර් මස **2** වන දින බ්‍රසල් හි පැවති යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ කමිටුව හා සමගාමීව පැවත් වූ වෙළඳ හා ආර්ථික සම්බන්ධතා පිළිබඳ යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වැඩ කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී.<br>විශේෂයෙන් ම ආහාර, කුළුබඩු සහ තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (IT & BPO) යන අංශ සඳහා **1.** ව්‍යාපාර හා වෙළඳ ප්‍රතිපත්ති, **2.** වෙළඳ පහසුකරණය, **3,** තත්ත්ව සහතික හා සනීපාරක්ෂක සහ ස්වස්තතා පියවරයන් (SPS**)**, **4.** ආංශික අගයන් දාම සංවර්ධනය සහ කලපීය හා ගෝලීය අගය දාමයට සුළු හා මධය පරිමාණ ව්‍යාපාරිකයන් සම්බන්ධ කිරීම තුලින් ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සමස්ත කාර්ය සාධනය ඉහළ නැංවීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.<br><br>යුරෝපා සංගමය විසින් මෙම | ව්‍යාපෘතිය දියත් කිරීම සහ යෝජිත ගිවිසුම් සම්පූර්ණ කිරීම | | 2016 නොවැම්බර් 15 ව්‍යාපෘතිය දියත් කිරීම.<br>යුරෝපා සංගමය මෙම ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 8 ක අරමුදල් දීමට එකඟවිය |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 8ක අරමුදල් ලබා දීමට එකඟ වූ අතර ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ක්‍රියා කරනවිට වාණිජ දෙපාර්තමේන්තුව එහි ජාතික සම්බන්ධීකාරක ලෙස පත් කර ඇත. | | | |
| 4.7 **නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම**<br><br>විදේශිකයන් විසින් ඔවුන්ගේ ව්‍යාපාරික, වෘත්තීය සහ පෞද්ගලික කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුල වැඩි කාලයක් සිටීමට නේවාසික වීසා අයදුම් කරනු ලබයි. ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා බලපත් ලබාදීම සඳහා අදාල රේඛීය අමාත්‍යංශයන්ගෙන් නිර්දේශයන් අපේක්ෂා කරයි. ලංකාව වෙත පැමිණීම සහ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වල යෙදීමට, විදේශීය සමාගම්වල සහ වෙනත් වෙළඳ සහ වාණිජ ව්‍යාපාරවල සම්බන්ධීකරණ කාර්යාලවල/ ශාඛා කාර්යාලවල සේවයේ නියුතු විගමණිකයන් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත්කිරීම සඳහා නිර්දේශ ලිපි නිකුත්කිරීමේ බලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාණිජ දෙපාර්තමේන්තුව වෙත පවරාදී ඇත.<br><br>වාණිජ දෙපාර්ත්මේන්තුව විසින් වෙත වාණිජ ආයතනයන්හි අධ්‍යක්ෂ, | අදාල වර්ෂයේදී නිකුත් කරන ලද නිර්දේශ ගණන | | අයදුම්කරුවන් 121 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම<br>සමාගම් 72 ක ජාතීන් 25 ක යැපෙන්නන් 86 |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| උපදේශක සහ විශේෂිත කාණ්ඩ යටතේ සිටින සුදුසුකම් ලත් විදේශිකයන්, ඔවුන්ගේ යැපෙන්නන් වෙත ඔවුන්ගේ ඉල්ලීමට අදාලව ඇතුල්වීමට සහ දීර්ඝ කිරීමට අදාල නේවාසික වීසා නිර්දේශ ලිපි අවුරුද්දක කාලයක් සඳහා නිකුත් කරයි. එවැනි සේවා නියුක්තියක් මගින් අපනයන වෙළදාම, තාක්ෂණික මාරුව සහ ඵලදායිතා වර්ධනය සඳහා ඇතිවන ඍජු ප්‍රතිලාභ සහ එමඟින් ජාතික ආර්ථිකයට ඇතිවිය හැකි වාසි සැළකිල්ලට ගනිමින්, එවැනි වීසා බලපත්‍ර නිර්දේශ සඳහා ඉදිරිපත්වන අයදුම්පත් දැඩි ලෙස තක්සේරු කරනු ලැබේ. | | | |
| **4.9 ණය දෙන ආයතන අනුමත කිරීම**<br><br>1949 අංක 06 දරන උකස් පනත යටතේ, ඕනෑම සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ සිය අනුමැතිය දෙනු ලබන්නේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114 (1) වන වගන්තිය යටතේ ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත | කැඳවූ අයදුම්පත් ගණන<br><br>ගැසට් නිවේදනය කරන ලද ආයතන ගණන | | 11<br><br>03 |

<table>
<tr><th rowspan="2">ක්‍රියාකාරකම්</th><th rowspan="2">මිනුම් දණ්ඩ</th><th colspan="2">භෞතික ප්‍රගතිය</th></tr>
<tr><th>අරමුණ</th><th>සාධනය</th></tr>
<tr><td>මණ්ඩලයක නිර්දේශ මත පදනම්ව වේ.</td><td></td><td></td><td></td></tr>
<tr><td>4.10 ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම (CoOs)<br>පහත සඳහන් වරණීය ගිවිසුම් සහ කලාපීය, ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික සම්භවීය නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත්කරනු ලබයි.<br>✓ වරණීය පොදු ක්‍රමය (GSP)<br>✓ ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)<br>✓ සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)<br>✓ දකුණු-ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)<br>✓ ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)<br>✓ පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)<br>✓ ආසියානු-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)<br><br>සාමාන්‍ය වැඩකරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 500 ක් සම්බන්ධයෙන් කටයුතු</td><td>වර්ෂය තුලදී නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික පත් ගණන</td><td></td><td>EU GSP – 40,644<br>GSP CIS – 514<br>GSP වෙනත් – 11,981<br>ISFTA – 12,621<br>PSFTA – 6,673<br>APTA – 4,508<br>SAFTA – 149<br>SAPTA – 288<br>GSTP – 143<br>එකතුව – 110,830</td></tr>
</table>

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| කරන ලදුව නිකුත් කරනු ලැබ ඇත. පූර්ව දැනුම්දීමකින් තොරව රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක හමුවිය හැකි පූර්ණකාලීනව ප්‍රභවස්ථාන සහතික අංශය වෙත අනුයුක්තව කටයුතුකරන, ඉතා ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් උපදෙස් ලබා දීම සඳහාත්, වැඩිදුර තොරතුරු පැහැදිලිකර දීම සඳහාත් සූදානම්ව සිටියි. සාමාන්‍යයෙන්, පත්කර ඇති නිලධාරීන් විසින් අපනයනකරුවන් 30 - 50 දෙනෙකුට දිනපතා උපදෙස් ලබා දෙනු ලැබේ. ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම, විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අදාළ ප්‍රභවස්ථාන රීති නිර්ණායකය පිළිබඳව ගැඹුරු දැනුමක් ලබාගැනීම යනු අවශ්‍යවන ඉතා විශේෂිත කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම් වන්නේ;<br><br>(අ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීම,<br>(ආ) අපනයනකරුවන්ගේ තොරතුරු සටහන් (profiles) | | | |

| ක්‍රියාකාරකම් | මිණුම් දණ්ඩ | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | අරමුණ | සාධනය |
| ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම,<br>(ඇ) පිරිවැය ප්‍රකාශයන් සහ යෝග්‍යතාව සපුරාලීම සඳහා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ආධාරක ලිපිලේඛන ඇගයුමට ලක්කිරීම,<br>(ඈ) වරණය ලබාදෙන්නාවූ රටවල ඉල්ලීම මත ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ<br>(ඉ) ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම. | | | |

**විදේශ වාණිජ නියෝජනය**

විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල25 ක නිලධාරින් 27 දෙනෙකුගෙන් සමන්විත වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධාණය යොමු කරමින් සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරිම සහ ආරක්ෂා කිරීමෙහිලා නිරතවන ලදී .“රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන” යටතේ වාණිජ නිලධාරින් විසින් ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් ක්‍රියාවට නංවනු ලැබේන්තර වෙළඳපළ තවදුරටත් පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා ලාංකික අපනයන සඳහා ජාත්‍යශ්‍රී ., විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පිහිටි අනෙකුත් සහාය ව්‍යාපාරික සංවිධානවල සහයෝගය ඇතිව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පෙළක් ක්‍රියාවට නංවන ලදී . නව අපනයන වෙළඳපළ හඳුන්වාදීම සහ පවත්නා වෙළඳපළවල වඩාත් යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඔවුනගේ වෙළඳපළ කොටස පුළුල් කිරීම සඳහා ප්‍රමුඛ අපනයනකරුවන් වෙත මූලික අවධානය යොමුකරන අතරතුර, වාණිජ නිලධාරීන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් වෙත ඔවුනගේ නිෂ්පාදන වෙනුවෙන්

<table>
<tr><th rowspan="2">ක්‍රියාකාරකම්</th><th rowspan="2">මිණුම් දණ්ඩ</th><th colspan="2">භෞතික ප්‍රගතිය</th></tr>
<tr><th>අරමුණ</th><th>සාධනය</th></tr>
<tr><td colspan="4">ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීම සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී .<br><br>විදේශයන්හි සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ .<br><br>• ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා අපනයන අවස්ථාවන් හඳුනාගැනීම සඳහා වෙළඳපළ සමීක්ෂණ /තොරතුරු සම්පාදනය කිරීම .<br>• සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්, විශේෂයෙන් තීරුබදු සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.<br>• වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනමෙය . ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම අවස්ථා සඳහා ශ්‍රී/, ශ්‍රී ලාංකික අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා වඩාත් ඵලදායී මෙවලමක් වශයෙන් සළකනු ලැබේ.<br>• ශ්‍රී ලංකාවේ පවත්වන ලද ප්‍රදර්ශන.මපාරික දූත පිරිස් සංවිධානය කිරීඅවස්ථා සඳහා විදේශීය ව්‍යා/<br>• සත්කාරක රටවලදී ශ්‍රී ලංකා .චාරණ වැඩසටහන් පැවැත්වීමප්‍ර (රට-තනි) විශේෂී-<br>• ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත වෙළඳ, ආයෝජන සහ සංචාරක දූත පිරිස් සංවිධානය කිරීම.<br>• ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත පුද්ගල ව්‍යාපාරික සංචාරයන් සංවිධානය කිරීම.<br>• සත්කාරක රටවල වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍ර වලට අදාළ රජයේ නිලධාරීන් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු වලට අදාළ ගැටළු සහ ජාත්‍ය න්තර කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ් / . ලංකාව නියෝජනය කිරීමවලදී ශ්‍රී සංවිධාන<br>• වෙළඳ, ආයෝජන සහ සංචාරක ආශ්‍රිත වෙළඳ විමසුම් සම්බන්ධයෙන් සේවය සැපයීම, විදේශ ව්‍යාපාරිකයින් හමුවීම /සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ වෙළඳ ආරවුල් විසඳීම යනාදිය .</td></tr>
</table>

| | ක්‍රියාකාරකම | |
|---|---|---|
| 1 | සත්කාරක රටවල්වල ශ්‍රී ලංකා-විශේෂී (තනි රට ) ප්‍රවර්ධන වැඩසටහන් (වෙළඳාම/ ආයෝජන / සංචාරක ) | |
| 2 | ශ්‍රී ලංකාව වෙත සිදු කරන ලද දූත මෙහෙයුම් | නියෝජන ගණන |
| | | නියෝජිතයින් ගණන |
| 3 | සත්කාර රටවල් වෙත ශ්‍රී ලංකාවෙන් සිදු කරන ලද දූත මෙහෙයුම් | නියෝජන ගණන |
| | | නියෝජිතයින් ගණන |
| 4 | ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාර | |
| 5 | සත්කාරක රට වෙත පුද්ගල සංචාර | |
| 6 | සත්කාරක රටවල සිදු කරන ලද ප්‍රදර්ශන | |
| 7 | ශ්‍රී ලංකාව තුල පැවති ප්‍රදර්ශන සඳහා සත්කාරක රටවල සහභාගීත්වය | ප්‍රදර්ශන/සල්පිල් ගණන |
| | | සහභාගී වූවන්/ ප්‍රදරශනකරුවන් ගණන |
| 8 | පිළිතුරු දුන් වෙළඳ විමර්ශන සංඛ්‍යාව (වෙළඳ/ආයෝජන/සංචාරක ) | |
| 9 | විසඳුම් ලබා දුන් වාණිජ ගැටලු/ ආරවුල් සංඛ්‍යාව | |
| 10 | ප්‍රවර්ධනය කරන ලද නිෂ්පාදන ක්ෂේත්‍ර ප්‍රමාණය | |
| 11 | සත්කාරක රටවල්වල වාණිජ නිලධාරීන් විසින් සහභාගී වන ලද ප්‍රදර්ශන/සල්පිල් | |
| 12 | සත්කාරක රටවල වෙළඳාම පහසුකරණ සහ ව්‍යාපාර ජාලගත රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය | |
| 13 | වෙළඳපොළ තොරතුරු | |
| 14 | ජාත්‍යන්තර සම්මේලනයන් හි ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | |
| 15 | තේ අලෙවි ප්‍රවර්ධනය | |
| 16 | ආයෝජන ප්‍රවර්ධන කටයුතු | |
| 17 | සංචාර ප්‍රවර්ධන කටයුතු | |
| 18 | ව්‍යාපාර ජාලගත වැඩසටහන් | |

# සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

**දැක්ම**

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශය ආවරණ කරමින් සංස්ථා යහ පාලනය පිළිබඳව හැදියාවක් ක්‍රම ක්‍රමයෙන් බිහි කිරීමට සමත් සක්‍රීය නියාමන අධිකාරියක් ඇති කිරීම තුලින් විශ්වසනීය ව්‍යාපාරික පසු බිමක් සංවර්ධනය කිරීම හා පෝෂණය කිරීම.

මෙහෙවර

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇතිවන සේ අදාල පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්වයක් ලබා දීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දරය

**අරමුණු**

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යය වන්නේ පහත සඳහන් කර ඇති ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීම, පරිපාලනය කිරීම හා බලගැන්වීම වේ. එම ව්‍යවස්ථාවන් පහත දැක්වේ.

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත
(ආ) සමිති ආඥා පනත - 123 වන අධිකාරිය
(ඇ) 1935 අංක 61 දරන සීට්ටු ආඥා පනත
(ඈ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත

ප්‍රධාන කාර්යන්

1. පෞද්ගලික, පොදු, විදේශීය, සීමා රහිත, ඇපයෙන් සීමිත සමාගම් සහ සංගම් සංස්ථාපනය කිරීම.
2. ගණන් පරික්ෂකවරුන්, සමාගම් ලේකම්වරුවන් සහ පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම
3. පුද්ගලයන් විසින් ඉල්ලුම් කරන පරිදි අදාල සමාගම් තොරතුරු ලබා දීම
4. සමාගමේ අදාල සියළුම තොරතුරු, විස්තර අදාල ගොනු වලට යාවත්කාලීන කිරීම
5. සමාගම් ලේකම්වරුන්ගේ, ගණන් පරීක්ෂකවරුන්ගේ, සමිතිවල සහ පොදු කොන්ත්‍රාත් වලට අදාල තොරතුරු ලියාපදිංචි කිරීම
6. සහතික පිටපත් ලබා ගැනීම සහ මහජන තොරතුරු ලබා ගැනීම සඳහා අදාල ප්‍රතිපාදන සකස් කිරීම.
7. උගස්බැඳුම්කර හා ඍණ පත්‍ර ලියාපදිංචි කිරීම
8. ලේඛණ තහවුරු කිරීම
9. ගාස්තු එකතු කිරීම හා සැසඳීම
10. සමාගම් නැවත ලියාපදිංචි කිරිම
11. සමාගම් ඇවර කිරීම හා විසුරුවා හැරීම
12. භෞතික ලේඛණ හා ගොනු නඩත්තු කිරිම හා කළමණාකරණය කිරිම

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

- ව්‍යාපෘතියේ නම : e-ROC ව්‍යාපෘතිය
- ව්‍යාපෘතියේ අරමුණ : සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීම

| වැඩසටහන් හා ව්‍යාපෘති | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ලබා කර ගැනීම් |
| **2501 - ප්‍රතිව්‍යුහගත කිරීම** | | | |
| මෘදුකාංග සංවර්ධනය හා ලේඛණ Scanning වැඩසටහන | වියදම (රු. මිලියන) | සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීම | ගිවිසුම අත්සන් කිරිමට යෝජිතයි. |
| මෘදුකාංග තත්ව විගණනය | වියදම(රු. මිලියන) | | |
| දෘඩාංග හා යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම | වියදම(රු. මිලියන) | | |
| කළමණාකරන ක්‍රියාවලිය වෙනස්කිරිම | වියදම(රු. මිලියන) | | |
| ආයතන පරිසරය වෙනස් කිරීම | වියදම(රු. මිලියන) | | |
| **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| ගොඩනැඟිලි හා ඉදිකිරීම් | වියදම(රු. මිලියන) | ගොඩනැඟිල්ල අළුත්වැඩියා කිරීම | ඉලක්ක ලඟා කර ඇත |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | වියදම(රු. මිලියන) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම | ඉලක්ක ලඟා කර ඇත |
| වාහන | වියදම(රු. මිලියන) | වාහන වැඩිදියුණු කිරීම | ඉලක්ක ලඟා කර ඇත |
| **මූලධන වත්කම් අත්පත්කරගැනීම** | | | |
| වාහන | වියදම(රු. මිලියන) | කල් බදු පදනම යටතේ වාහන මිලදී ගැනීමට යෝජිතයි. | |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | වියදම(රු. මිලියන) | කාර්යාලීය මේස, පුටු,මිලදී ගැනීම | ඉලක්ක ලඟා කර ඇත |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | වියදම(රු. මිලියන) | පරිගණක 22ක් හා ඊට අදාල මුද්‍රණ යන්ත්‍ර හා UPS මිලදී ගැනීම | ඉලක්ක ලඟා කර ඇත |
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | වියදම(රු. මිලියන) | නිලධාරීන්ගේ හැකියා පුහුණු වර්ධන කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම | ඉලක්ක ලඟා කර ඇත |
| **ආදායම(රු. මිලියන)** | | | |
| සමාගම් අරමුදල | ආදායම(රු. මිලියන) | | |
| පනත ක්‍රියාත්මක කිරීම | ආදායම(රු. මිලියන) | | ඉලක්ක ලඟා කර ඇත |
| වෙනත් ආදායම් | ආදායම(රු. මිලියන) | | ඉලක්ක ලඟා කර ඇත |
| සමාගම් රෙජිස්ට්‍රාර්ගේගාස්තු 20.03.02.10 | ආදායම(රු. මිලියන) | | ඉලක්ක ලඟා කර ඇත |
| පොදු කොන්ත්‍රාත් ගාස්තු 20.03.02.12 | ආදායම(රු. මිලියන) | | ඉලක්ක ලඟා කර ඇත |

| | | | |
|---|---|---|---|
| **දෙපාර්තමේන්තුවේ සමස්ථ ආදායම(රු. මිලියන)** | | | |
| **<u>වියදම(රු. මිලියන)</u>** | | | සමාගම් පනත පරිපාලනය කිරීම |
| සමාගම් අරමුදල | වියදම(රු. මිලියන) | | |
| පුනරාවර්තන වියදම් | වියදම(රු. මිලියන) | | |
| මූලධන වියදම් | වියදම(රු. මිලියන) | | |
| 297 ශීර්ෂය | වියදම(රු. මිලියන) | | |
| **දෙපාර්තමේන්තුවේ සමස්ථ වියදම(රු. මිලියන)** | | | |
| | | | |
| **<u>භෞතික කාර්සාධනය</u>** | | | |
| නව සංස්ථාගතකිරීම් | ඒකක ප්‍රමාණය | | සමාගම් පනත ක්‍රියාත්මක කිරීම |
| ලේඛණ ලියාපදිංචි ප්‍රමාණය | ඒකක ප්‍රමාණය | | |
| සමිති ලියාපදිංචි ප්‍රමාණය | ඒකක ප්‍රමාණය | | |
| ලේකම්වරු ලියාපදිංචිය | ඒකක ප්‍රමාණය | | |
| පොදු කොන්ත්‍රාත් ලියාපදිංචිය | ඒකක ප්‍රමාණය | | |
| සමාගම් ලියාපදිංචි කිරීමේ බද්ද හා ඇවර කිරීමේ බද්ද | ඒකක ප්‍රමාණය | | |

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

**දැක්ම :-** " ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය "

**මෙහෙවර :-** " ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සානුබල සපයමින්, සමුපකාර සමිතිවල යහ පාලනයක් ගොඩනැගීම සඳහා පුළුල් ලෙස මැදිහත් වීම "

**අරමුණු :-**

සමුපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරීම

සමුපකාර සමිති/ සංගම් ශක්තිමත් කිරීම

සමුපකාර සමිති/ සම්ගම් සමුපකාර ප්‍රතිපත්ති අනුව මෙහෙය වීම

සමුපකාර සේවයට සම්බන්ධ වෙනත් බාහිර පුද්ගලයින්/ ආයතන අතර සම්බන්ධීකරණය

කලින් කලට රජය මගින් දියත් කරනු ලබන සංවර්ධන කටයුතු වලට මැදිහත්වීම

❖ **ක්‍රියාකාරකම් :-**

ප්‍රතිපත්ති සහ කළමනාකරණය

සමුපකාර සමිති ලියාපදිංචිය හා අධීක්ෂණය

සමුපකාර සමිති විගණනය සහ විමර්ශනය

සමුපකාර ආරවුල් බේරුම්කරණය හා තීරකකරණය

පළාත් සහා සමග සම්බන්ධීකරණය

සමුපකාර සමිති වල බැංකු හා මූල්‍ය අංශ අධීක්ෂණය

සමුපකාර ව්‍යාපාරයේ පාරිභෝගික අංශ සංවර්ධනය කිරීම

සමුපකාර අරමුදල් කළමනාකරණය

සමුපකාර ව්‍යාපාරය ප්‍රවර්ධනය හා සංවර්ධනය

මානව හා භෞතික සම්පත් සංවර්ධනය

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

| **ක්‍රියාකාරකම්** | **මිණුම් ඒකකය** | **භෞතික ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **ඉලක්කය** | **ලඟා කර ගැනීම** |
| සමුපදීපනී සිංහල පුවත්පත සඳහා ලිපි, පුවත් එකතු කිරීම | මාසිකව සමුපදීපනී සිංහල හා දෙමළ මාධ්‍ය පුවත්පත් අතිරේක පළ කිරීම | පුවත්පත් 24 ක් පළ කිරීම<br><br>සිංහල 12<br>දෙමළ 12 | පුවත්පත් 24 ක් පළ කිරීම<br><br>සිංහල 12<br>දෙමළ 12 |
| පළාත් සම්බන්ධීකාරකවරු සමග සම්බන්ධ වීම | | | |
| සංස්කරණ කටයුතු වලින් අනතුරුව මුද්‍රණයට යොමු කිරීම | | | |

02.**ව්‍යාපෘතියේ නම:** සමුපදීපනී පුවත් පත මුද්‍රණය කිරීම

**ව්‍යාපෘතියේ නම :-** බැංකු හා මුල්‍ය සමුපකාර සමිති වල කටයුතු නියාමනය කිරීමේ වැඩසටහන

| **ක්‍රියාකාරකම්** | **මිණුම් ඒකකය** | **භෞතික ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **ඉලක්කය** | **ලගාකර ගැනීම්** |
| දත්ත සහ තොරතුරු රැස් කිරීම( මුල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තාව වැනි) | වාර්තා සංඛ්‍යාව | 32 | 12 |
| ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම | පරීක්ෂණ සංඛ්‍යාව | 04 | - |
| ග්‍රාමීය බැංකු මෙහෙයුම් අත්පොත හා වෙනත් හඳුන්වාදීම් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 30 | 19 |
| පළාත් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ සමිති සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 03 | - |
| සමුපකාර බැංකු නියාමන ජාතික කමිටු රැස්වීම පැවැත්වීම | රැස්වීම් සංඛ්‍යාව | 05 | 03 |

**ව්‍යාපෘතියේ නම :-** කර්මාන්ත හා නිෂ්පාදන සමුපකාර සමිති ආරම්භ කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ලඟාකර ගැනීම් |
| නිෂ්පාදන සමුපකාර වලට ඇති අවශ්‍යතා, අභියෝග, කාරයඵල හඳුනාගැනීම | පළාත් මට්ටමින් පිහිටුවන ලද සමුපකාර කර්මාන්ත සමිති සංඛ්‍යාව | 9 | 3 |
| නිෂ්පාදන හා කර්මාන්ත සමුපකාර වල කාර්යඵල සඳහා බලපාන ගැටළු හා අභියෝග හඳුනාගැනීම | | | |
| සමුපකාර නිෂ්පාදන සඳහා වෙළඳපල අවශ්‍යතා හා ගුණාත්වය තහවුරු කිරීම | | | |
| නිෂ්පාදන හා කර්මාන්ත සමුපකාර සමිති ස්ථාපනය කිරීමට යෝග්‍ය ප්‍රදේශ හා කලාප හඳුනාගැනීම | | | |
| නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාල රාජ්‍ය ආයතන සමග සාකච්ඡා පැවැත්වීම | | | |
| පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු 09 සමග සම්බන්ධීකරණය | | | |

# මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**දැක්ම**

මනා ලෙස සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා නිවැරදි හා විශ්වාසනීය මිනුම්

**මෙහෙවර**

මිනුම් මත පදනම් වූ සේවා සහ නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙන්දන්, මිනුම් විද්‍යා හෝ වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා යුක්තිය තහවුරු කරන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම හා ඒවා ප්‍රචලිත කිරීම මගින් ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය සහ ගුණාත්මකභාවය ඉහල නැංවීම

**අරමුණ**

| | ඉලක්ක | අරමුණු |
|---|---|---|
| 01 | නිවැරදි හා විශ්වාසදායී ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම හා නඩත්තුව | • 2016 වසර තුළ නව පර්යේෂණාගාර සඳහා වායු සමීකරන පද්දතිය ස්ථාපිත කිරීම පර්යේෂණාගාර උපකරණ සහ ගෘහභාණ්ඩ මිලට ගැනීම<br>• ISO 17025 ප්‍රමිතියට අනුව පර්යේෂණාගාර සඳහා තත්වපාලන පද්දතියක් නිර්මාණය කිරීම.<br>• මිනුම් ප්‍රමිතීන් 3ක් සඳහා 2016 වසර තුළදී ජාත්‍යන්තර සංසන්දන වැඩසටහන්වලට සහභාගි වීම.<br>• ජාතික මිනුම් ප්‍රමිතීන් සඳහා මිනුම් අනුකූලතා ලබාගැනීම. |
| 02 | වාණිජ ගනුදෙනුවලදී නිවැරදී හා සාධාරණ මිනුම් භාවිතය ප්‍රවර්ධනය කිරීම නියාමනය, සහ ඊට පහසුකම් සැලසීම. | • වෙළඳාම සඳහා භාවිතාවන කිරුම් හා මිනුම් උපකරණ ඒකක මිලියනයක් 2016 වසර තුළ සත්‍යායනය කිරීම.<br>• මිනුම් උපකරණ නව මාදිලි 20ක් සඳහා මාදිලි අනුමැතිය ලබාදීම.<br>• 2015 දී 15435 ක් වූ වැටලීම් සංඛ්‍යාව 2016 දී 16000 දක්වා වැඩිකිරීම.<br>• රෙගුලාසි පලකිරීම.(මාදිලි අනුමැතිය, සත්‍යායනය ආදිය ගැන)<br>• සෑම දිස්ත්‍රික්කයකම සත්‍යායනය මධ්‍යස්ථාන |

| | | |
|---|---|---|
| | | සංඛ්‍යාව වැඩිකිරිම<br>• මූලික සත්‍යායන කටයුතු විධිමත් කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුව එක්ව කටයුතු කිරීම. |
| 03 | කර්මාන්තවල භාවිතා කරන මිනුම් ප්‍රමිතීන්වල නිවැරදිබව හා විශ්වාසනීය බව තහවුරු කිරීම. | • 2015 දී කරන ලද කාර්මික මිනුම් උපකරණ අංකශෝධන සංඛ්‍යාව1200 සිට 2016 වසරේදී 1500 දක්වා වැඩි කිරීම.<br>• නව අංකශෝධන ක්ෂේත්‍ර 3ක් අලුතින් ආරම්භ කිරීම.<br>• ISO 17025 තත්ව පාලන පද්ධතිය ස්ථාපනය කිරීම.<br>• අංකශෝධන සහ පරීක්ෂණ විද්‍යාගාර සඳහා මිනුම් අනුකූලතාවය ලබාදීම. |
| 04 | මිනුම් විද්‍යා ක්ෂේත්‍රෙය් නව උත්පාදන සොයා ගැනීම. | • 2016 වසර සඳහා පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම.<br>• 2016 වසර තුළදී පර්යේෂණ කටයුතු ආරම්භ නිරීම.<br>• සංවර්ධිත ක්‍රම මඟින් ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම. |
| 05 | අයතනික සම්පත් කර්යක්ෂම හා ඵලදායිතා කළමණාකරනය | • අතිරේක කාර්යමණ්ඩල සඳහා 2016 වසර තුලදී අනුමැතිය ලබාගැනීම.<br>• දැනට පවතින පුරප්පාඩු පිරවීම.<br>• පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ 2016 වසර තුළදී පුහුණු අවස්ථා පුළුල් කිරීම.<br>• සියළුම කාර්යමණ්ඩල සඳහා පාරිතෝෂික ක්‍රමයක් හඳුන්වාදීම.<br>• අපක්ෂපාතීබව පවත්වාගෙන යාම සඳහා වෙනම වැටලීම් ඒකකයක් ස්ථාපනය කිරීම. |

**ප්‍රධාන කාර්යයන්**

- සත්‍යායන වැඩසටහන් දීපව්‍යාප්ත මට්ටමින් පැවැත්වීම.
- කිරුම් මිනුම් උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබාදීම.
- පෙර ඇසුරුම් පරීක්ෂාව
- කිරුම් මිනුම් උපකරණ නිෂ්පාදකයින්,වෙළෙන්දන්,ආනයනකරුවන්, හා අලුත්වැඩියාකරුවන් ලියාපදිංචිය.
- වෙළඳපොළ වැටලීම් සිදුකිරීම.
- මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කර්මාන්ත ක්ෂේත්‍රය තුළ භාවිතා කරන කිරුම් මිනුම් උපකරණ අංකශෝධනය කිරීම.
- මිනුම් විද්‍යාවට අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

ව්‍යාපෘතියේ නම :වෙළෙඳ ගනුදෙනුවලදී හා අනෙකුත් නියාමනයන්වලදී නිවැරදි හා සාධාරණ මිනුම් ප්‍රවර්ධනය, නියාමනය හා පහසුකම් සැලසීම.

| | අරමුණ | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | ප්‍රගතිය % |
| 01 | වෙළඳාමේ දී හා අනෙකුත් අදාල නියාමන කටයුතුවලදී භාවිතා කරන කිරුම් මිනුම් උපකරණ සත්‍යායන කිරීම. | වාර්ෂික සැලස්ම අනුව දිස්ත්‍රික් පදනම මත සත්‍යායන වැඩසටහන් පැවැත්වීම. | සත්‍යායන කරන කිරුම් මිනුම් උපකරණ ගණන | මිලියන 0.9 (උපකරණ) | 81 (මිලියන 0.81, උපකරණ) |
| 02 | අලුත් සත්‍යායන මධ්‍යස්ථාන ඇතිකිරීම තුළින් පාරිභෝගිකයාට පහසු සේවා සැලසීම. | 1. මධ්‍යස්ථාන අවශ්‍ය ප්‍රදේශ හඳුනාගැනීම<br>2. මධ්‍යස්ථාන ස්ථානගත කළයුතු ස්ථාන හඳුනාගැනීම<br>3. අවශ්‍ය අනුමැතින් ලබාගැනීම<br>4. වාර්ෂික සැලස්මට මෙම මධ්‍යස්ථාන ඇතුලත් කිරීම<br>5. තෝරාගත් නව ස්ථාන තුළ සත්‍යායන සේවා සැපයීම. | අලුත් සත්‍යායන මධ්‍යස්ථාන ගණන | 15 | 12 |
| 03 | නිෂ්පාදකයින්, විකුණන්නන්, ආනයනකරුවන් හා අලුත්වැඩියාකරුවන් සඳහා ලියාපදිංචි කිරීම. | 1. අයදුම්පත් නිකුත්කිරීම<br>2. ලියාපදිංචි සහතික නිකුත්කිරීම | නිකුත්කළ ලියාපදිංචි සහතික ගණන | 600 (ලියාපදිංචි සහතික) | 89 (ලියාපදිංචි සහතික 535) |
| 04 | වෙළෙඳපොළට හඳුන්වාදෙන නව මාදිලි සඳහා ඒවායේ අනුකූලතාවය ඇගයීම හා අනුමැතිය ලබාදීම. | අවම කාල පරිච්ඡේදයක් තුළ පරීක්ෂණ ක්‍රියාවලිය සිදුකිරීම. | අලුතින් ප්‍රධානය කළ මාදිලි අනුමැති ගණන | 40 | 125 (ඒකක 50) |
| 05 | වැටලීම් සිදුකිරීම. | වාර්ෂික සැලස්ම හා ලැබෙන පැමිණිලි අනුව වැටලීම් සිදුකිරීම | සිදුකළ වැටලීම් ගණන | 16000 (වැටලීම්) | 88 (වැටලීම් 14100) |
| 06 | දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වාර්ෂික සැලස්ම අනුව වැඩසටහන් පැවැත්වීම | පැවැත් වූ වැඩසටහන් ගණන | 800 | 90 (වැඩසටහන් 717) |
| 07 | පෙර ඇසුරුම් කරන ලද අයිතම පරීක්ෂාව | ඉල්ලීම මත වැඩබිම් පරීක්ෂා සිදුකිරීම | | 10 | 8 |

ව්‍යාපෘතියේ නම : කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා මිනුම් අනුකූලතාව ලබාදීම

| | අරමුණ | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | ප්‍රගතිය % |
| 01 | කර්මාන්ත තුළ භාවිතා කරන කිරුම් මිනුම් උපකරණ අංක ශෝධනය කිරීම. | 1. කර්මාන්ත තුළින් ලැබෙන උපකරණ අංක ශෝධනය කිරීම.<br>2. අංක ශෝධනය සහතික නිකුත්කිරීම. | අංක ශෝධනය කළ කිරුම් මිනුම් උපකරණ ගණන | 1500(උපකරණ) | 61 (උපකරණ 922) |
| 02 | අලුතින් අංක ශෝධනය සේවාව පටන්ගැනීම | 1. අලුතින් අංක ශෝධනය සේවාවන් අවශ්‍ය ප්‍රදේශ හඳුනාගැනීම | අලුතින් ආරම්භ කළ අංක ශෝධනය ස්ථාන ගණන | 0 | 0 |
| 03 | කර්ය මණ්ඩලය සඳහා පර්යේෂණාගාරයේ පරීක්ෂණ හා අංක ශෝධනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 1. අයදුම්පත් කැඳවීම<br>2. පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩසටහන් ගණන | 5 | 60 (පුහුණු වැඩසටහන් 3) |

ව්‍යාපෘතියේ නම : කර්යක්ෂම හා ඵලදායි ලෙස අනුව මානව සම්පත කළමණාකරණය කිරීම.

| | අරමුණ | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | ප්‍රගතිය % |
| 01 | පවතින සියලුම පුරප්පාඩු පිරවීම | 1.විභාග සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම<br>2. අනුමැතිය ලබාගැනීම<br>3. බඳවා ගැනීම | පිරවූ පුරප්පාඩු ගණන | 100% | 1.සහකාර අධිකාරි තනතුරට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට රා.සේ. කො. ස. වෙත යවා ඇත.<br>2. මිනුම් ප්‍රමිති සේවා සහයක හා රසායනාගාර සහයක තනතුරට බඳවා ගැනීම සඳහා ප්‍රයෝගික පරීක්ෂණයට අයදුම්පත් කැඳවීමට ලිපිය සකස් කිරීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | 3.කාර්මික ශිල්පින් බඳවා ගැනීම සඳහා අදාළ ගැසට් නිවේදනය දෙමළ භාෂා පරිවර්තනයට යවා ඇත.<br>4. ගැසට් පත්‍රය හා විශේෂ ශ්‍රේණියේ පරීක්ෂකවරුන්ට අදාළ ලිපි රා.සේ.කො.ස. වෙත යවා ඇත.<br>5.දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම සඳහා පිළියෙල කල ගැසට් පත්‍රය නිකුත් කිරීමට යවා ඇත. |
| 02 | අමතර කර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම. | 1. කර්ය මණ්ඩල අවශ්‍යතා හදුනාගැනීම<br>2. කර්ය මණ්ඩලයේ අමතර තනතුරු සඳහා තහවුරු කරගැනීම | අනුමැතිය | අනුමැතිය | සාකච්ඡා මට්ටමේ පවතී |
| 03 | අතිරේක අනුමැතිය ලබාගත් කර්ය මණ්ඩලය බඳවා ගැනීම | 1.විභාග සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම<br>2. අනුමැතිය ලබාගැනීම<br>3. බඳවා ගැනීම | බඳවා ගන්නා සංඛ්‍යාව | 0 | 0 |
| 4 | කර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 1. පුහුණු අවශ්‍යතා හදුනාගැනීම<br>2. පුහුණු වැඩසටහන් සැලැස්මක් සැදීම<br>3. පුහුණු වැඩසටහන් සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීම<br>4. පුහුණු වැඩසටහන පැවැත්වීම | 1. පුහුණු වැඩසටහන් ගණන<br>2. පුහුණු වන පුද්ගලයින් ගණන | 50%(සේවක මඩුල්ලෙන්) | 1.දේශීය පුහුණු - 245 පුද්ගලයින් (දවස් 2 ක නේවාසික පුහුණුවක්ද ඇතුළත්ව)<br>2.විදේශීය පුහුණු - 28 පුද්ගලයින් |
| 5 | සේවකයින් සඳහා දිරිදීමනා ක්‍රමයක් හඳුන්වාදීම | බඳවා ගැනීමට යෝජනාව සැකසීම | යෝජනාව | | |

# ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

දැක්ම

"ආරක්ෂිතව,අඛණ්ඩව,පෝෂ්‍යදායී,ධාන්‍යමය ආහාර සැම නිවසකටම"

මෙහෙවර

"ධාන්‍යමය ආහාර ද්‍රව්‍යයන්හි වෙළඳපොළ සුලභතාව, පාරිභෝගිකයාට ළඟා වීමේ පහසුව සහ පාරිභෝගික මිලදී ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම උදෙසා ආහාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශව, දෙපාර්තමේන්තුව සතු වත්කම් සහ කාර්යක්ෂමවූත්, කැපවූත් සේවක සමූහයා සමඟ මනා ලෙස සම්බන්ධීකරණය මගින් ආහාර දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම".

අරමුණු

I. ධාන්‍යමය ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ තහවුරු වීම සහ වෙළඳපොළ මිල ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා සහාය වීම සහ මග පෙන්වීම ලබා දීම.
II. විද්‍යාත්මකව දියුණු කරන ලද ගබඩා ක්‍රමවේදයක් පවත්වාගෙන යාම තුළින් පළිබෝධ උවදුරෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර ජනතාවට ලබා දීම.
III. දෙපාර්තමේන්තුව සතු දේපළ (නිවාස සහ ගබඩා) ප්‍රශස්ථ කළමණාකාරීත්වයක් යටතේ පවත්වාගෙන යාම තුළින් රාජ්‍ය ආදායමට දක්වන දායකත්වය ඉහළ නැංවීම.

ප්‍රධාන කාර්යයන්

I. දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො. 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.
II. 2008/8/27 දිනැති අමාත්‍යමණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.
III. වෙළඳපොළ සහල් සුලභතාවය පිළිබඳ සහතික වීම.
IV. ආයතනයේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් (Stake holders) සමඟ මනා සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.
V. කෘමි උවදුරුවලින් තොර ධාන්‍යමය ආහාර ගබඩා පරිසරයක් ඇති කිරීම.

2. භෞතික හා මූල්‍ය ප්‍රගතිය

- ❖ ව්‍යාපෘතියේ නම : ගබඩා අලුත්වැඩියා
- ❖ ව්‍යාපෘතියේ අරමුණු : පවත්නා ගබඩාවල තත්ත්වය වැඩිදියුණු කිරීම.

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්ක | සාධනය |
| 1) වැඩි දියුණු කරනු ලබන තාක්ෂණික ගබඩා 5. | අලුත්වැඩියාව සම්පූර්ණ කරන ලද ගබඩා 5. | ශක්තිමත් ගබඩා 5 ක් ඉදිකිරීම. | අලුත්වැඩියා කෙරෙමින් පවති. |
| 2) අලුත්වැඩියාව කරනු ලබන අම්පාර ගබඩාව | 100% සම්පූර්ණ කිරීම. | ශක්තිමත් ගබඩා ගොඩනැගිල්ල. | සම්පූර්ණයෙන් නිම කර ඇත. |
| 3) ධූමායන ඒකකය පිහිටුවීම වේයන්ගොඩ ගබඩා අංක 06 . | 100% සම්පූර්ණ කිරීම. | ශක්තිමත් ගබඩා ගොඩනැගිල්ල. | සම්පූර්ණයෙන් නිම කර ඇත. |

# පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

**මෙහෙවර**

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම. එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

**අරමුණු**

01. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම

02. නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම

    * ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්

    * මෝස්තර සම්පාදන වැඩසටහන්

    * පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්

03. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම

04. ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම

05. අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)

06. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම
07. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම
08. ජාතික අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම
09. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදා බැලීම් හා සංරක්ෂණ කටයුතු
10. නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම | ආයතන 10ක ගොඩනැගිලි අලුත්වැඩියාව | සේවා ඵලදායිතාව | • මාතලේ, බණ්ඩාරවෙල,තලාව, බෝයගනේ,වටපුළුව, කොට්ටල,ගැටබේ,කටුබැද්ද පේෂ පාසල්හි ගොඩනැගිලි අළුත්වැඩියාව<br>• අනුරාධපුර ව්‍යාපෘති කාර්යාලයේ වැඩිදියුණුකිරීම් කටයුතු<br>• පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ නැවත සකස් කිරීමේ කටයුතු |
| වාහන අලුත්වැඩියාව | වාහන 04 අලුත්වැඩියාව | කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ලබාදීම | 2016 වර්ෂය තුළ පහත සඳහන් වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීම NB – 3003, PD-4265, KC-7670, 51-5959 |
| කාර්යාලයීය අවශ්‍යතා | සේවා කාර්යක්ෂමතාවය හා ඵලදායිත්වය | කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් ලබාදීම | වර්ෂය තුළ විදුලි උපකරණ, කාර්යාල ගෘහ භාණ්ඩ, පරිගණක හා පරිගණක උපාංග, මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම |
| **අත්‍යන්ත්‍ර ක්ෂේත්‍රයේ පුහුණුව හා හැකියා වර්ධනය** | | | |
| පේෂකර්මාන්ත පුහුණු පාසල් සිසුන් සඳහා නිල ඇඳුම් සැපයීම | සිසුන් 161 | පේෂ පාසල් සඳහා සිසුන් ආකර්ෂණය කිරීම | සිසුන් 161 දෙනෙකු සඳහා නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබාදීම |
| ජාතික අත්‍යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය හා අලෙවි සල්පිල | අලෙවි කුටි 35 පළාත්සභා 09 පෞද්ගලික ව්‍යවසායකයන් | අත්‍යන්ත්‍ර රෙදිපිළි ව්‍යවසායකයන් සඳහා අලෙවි පහසුකම් ප්‍රවර්ධනය | 2016 දෙසැ. මස 9-11 දිනවල බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේදී අත්‍යන්ත්‍ර ප්‍රදර්ශනය හා අලෙවි සල්පිල පැවැත්වීම |

| | | | |
|---|---|---|---|
| පේෂ පාසල් හා මෝස්තර පාසල් සිසුන් සඳහා පැමිණීමේ දීමනා ගෙවීම | සිසුන් 200 | පේෂ පාසල් සඳහා සිසුන් - 175<br>මෝස්තර පුහුණු පාසල් සඳහා සිසුන් - 25 | (i) පේෂ කර්මාන්ත පුහුණු පාසල්<br><br><u>අධ්‍යයන වර්ෂය</u> <u>බඳවාගත් සිසුන්</u><br><br>2015/2016<br>(02.07.2015 - 31.07.2016) 161<br><br>2016/2017<br>(04.07.2016 – 31.07.2017) 157<br><br>(ii) මෝස්තර පුහුණු පාසල්<br><br><u>අධ්‍යයන වර්ෂය</u> <u>බඳවාගත් සිසුන්</u><br><br>2016 20 |
| පේෂ පාසල් හා මෝස්තර පුහුණු පාසල් සඳහා නූල් සහ උපකරණ මිලදී ගැනීම | නූල් සහ අත්යන්ත්‍ර උපාංග | ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යාපන ප්‍රවර්ධනය | පේෂ පාසල් 13 සහ මෝස්තර පුහුණු පාසල් 02 සඳහා නූල් සහ අදාළ උපකරණ සැපයීම |
| ඉංග්‍රීසි භාෂා හැකියා ප්‍රවර්ධනය සඳහා සම්පත්දායකයින්ට ගෙවීම් කිරීම | සිසුන් 200කගේ භාෂා ඥාන වර්ධනය | පුහුණුවන්නන් ගේ භාෂා දැනුම වර්ධනය කිරීම | පේෂ කර්මාන්ත පුහුණු පාසල්හි සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව පැවැත්වීම |
| සේවාස්ථ පුහුණු වැඩසටහන් | පුහුණුලාභීන් 974 | පුහුණුලාභීන් 974කගේ හැකියා වර්ධනය, සේවා කාර්යක්ෂමතාව, ඵලදායිතාවය සහ විෂයානුබද්ධ දැනුම වැඩිදියුණු කිරීම | පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන් 26ක්, නිපුණතා සංවර්ධන වැඩසටහන් 02ක්, පේෂ පාසල් සිසුන් සඳහා පෞරුෂත්ව වැඩසටහන් 03ක් හා අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකා 05 කි.<br><br>( දෙපාර්තමේන්තු නිලධාරීන්, පේෂ පාසල් සිසුන්, පළාත්සභා ආයතන, සමුපකාර සමිතිවල හා පෞද්ගලික අංශයේ පුහුණුලාභීන් 974 දෙනෙකුගේ සහභාගිත්වයෙන්) |

<u>**ප්‍රවර්ධන ක්‍රියාකාරකම්**</u>

| | | | |
|---|---|---|---|
| අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි සල්පිල පැවැත්වීම<br><br>දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා නිල ඇඳුම් සැපයීම | අලෙවි කුටි 34, ප්‍රචාරණාත්මක පුවත්පත් (දිවයින පුරා)<br><br>දෙපාර්තමේන්තු නිලධාරීන් - 121 | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය<br><br>සේවක අභිප්‍රේරණය | අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත අලෙවි සල්පිල 2016 මාර්තු 25-27 දිනවල බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේදී පැවැත්විණි<br><br>ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහභාගි වන නිලධාරින් 117 දෙනෙකු සඳහා නිල ඇඳුම් ලබාදීම (වියදමෙන් කොටසක් දෙපාර්තමේන්තුව විසින් දැරීම) |
| පේෂ පාසල් සඳහා උපකරණ ලබාදීම සහ පරිපාලන වියදම් දැරීම | පේෂ පාසල් අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය | ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය (පේෂ පාසල් - 13, මෝස්තර | පේෂ පාසල්, මෝස්තර පුහුණු පාසල් හා පාසල් නේවාසිකාගාර සඳහා විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ උපකරණ මිලදී ගැනීම හා පරිපාලන වියදම් දැරීම |

| | | | |
|---|---|---|---|
| | (පේෂ පාසල් - 13, මෝස්තර පුහුණු පාසල් - 02) | පුහුණු පාසල් - 02) | |
| වාර්ෂික විභාග පැවැත්වීම (පේෂ පාසල්/මෝස්තර පුහුණු පාසල්/දෙපාර්තමේන්තු විභාග) | පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගයේ අයදුම්කරුවන් 198<br><br>දෙපාර්තමේන්තු පේෂ උපදේශක නිලධාරීන් 31 | ගුණාත්මක තාක්ෂණ ශිල්පීන් බිහිකිරීම | (i) පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගය පැවැත්වීම - 2016 ජූලි 26-28 (පේෂ පාසල් සිසුන් 127 හා බාහිර අයදුම්කරුවන් හා නැවත පෙනී සිටින සිසුන් 61 ක් පෙනී සිටින ලදි. පේෂ පාසල් සිසුන් 02 හා බාහිර අපේක්ෂකයන් 08 දෙනෙකු විභාගය සඳහා සහභාගි නොවීය)<br><br>(ii) අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර නිර්මාණය පිළිබඳ උසස් පුහුණු සහතිකපත්‍ර විභාගය - 2015 (2016 ජනවාරි 25-27/ සිසුන් 19)<br><br>(iii) පේෂ උපදේශක නිලධාරීන් 31 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2016 ජූලි 02 දින පැවැත්වීය. |
| සංවර්ධන ක්‍රියාකාරකම් | පේෂ කර්මාන්ත පුහුණු පාසල් 08 | පුහුණු මධ්‍යස්ථාන ආකර්ශනීය ලෙස පවත්වාගෙන යාම තුළින් වැඩි පුහුණුලාභීන් පිරිසක් ඇතුළත් කර ගැනීම | සමන්තුරේ, කටුබැද්ද, පින්නවල, බණ්ඩාරවෙල, ගැටඹේ, වටපුළුව, මාතලේ, මාතර පේෂ කර්මාන්ත පුහුණු පාසල් ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරීම සඳහා ආම්පන්න මිලදී ගැනීම |
| | | | |

# ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

දැක්ම

වෙළඳ පොළ කේන්ද්‍රීය බුද්ධිමය දේපළ පද්ධතියක් දේශය වෙත ලබාකර දීමේ අභිප්‍රායෙන් යුක්ත ගුණාත්මකබව අරමුණු කරගත් ඵලදායි සේවා සපයන ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම

**මෙහෙවර**

නිර්මාණශීලිත්වය හා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමට රුකුල් දෙන බුද්ධිමය දේපළ පද්ධතියක් තහවුරු කිරීම මඟින් ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැඟීමට සහ නවෝත්පාදන සඳහා වන ආයෝජනයන් දිරිමත් කිරීමට දායක වීම

**අරමුණු**

1. ජාතියේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම
2. වෙළඳාමට පහසුකම් සැලසීම සහ මනා ලෙස ක්‍රමානුකූල කිරීම
3. ආයෝජන වැඩි කිරීම
4. පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ දැනුම මුල්කර ගත් ගෝලීය ක්‍රියාකාරීත්වයට ජාතික ආර්ථිකය ඒකාබද්ධ කිරීමත් වේ

**කාර්යභාරය**

වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සහ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම ඇතුළුව බුද්ධිමය දේපළ පරිපාලනය කිරීම

- බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ ප්‍රචලිත කිරීම
- බුද්ධිමය දේපළ පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා බුද්ධිමය දේපළ භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම
- බුද්ධිමය දේපළ ආශ්‍රිත ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම සපුරාලීම සහ ඒ පිළිබඳ කලාපීය සහ අන්තර් ජාතික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම
- බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා කිරීම
- ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ ආරවුල් නිරාකරණය, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් බලාත්මක කිරීමට පහසුකම් සැලසීම
- බුද්ධිමය දේපළ නියෝජිතයන් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | | ඇගයුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | නිමැවුම |
| **1. තාක්ෂණික සහ නව නිපයුම්කරණ සහයෝගිතා මධ්‍යස්ථාන** | දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි තාක්ෂණික හා නව නිපැයුම්කරණ සහයෝගීතා මධ්‍යස්ථාන පිහිටුවීම | | තාක්ෂණික සහ නව නිපයුම්කරණ සහයෝගිතා මධ්‍යස්ථාන 09 පිහිටුවීම | තෝරා ගත් ආයතන හය (03)ක තාක්ෂණික සහ නව නිපයුම්කරණ සහයෝගිතා මධ්‍යස්ථාන 06ක් ස්ථාපිත කර ඇත. |
| **2. පුහුණුවීම් හා දැනුවත් කිරීම් වැඩසටහන්** | 1. කාර්ය මණ්ඩලය වෙත දේශීය පුහුණු අවස්ථා ලබාදීම<br>• ඵලදායිතා විෂය<br>• භාෂා නිපුණතාවය – ඉංග්‍රීසි/ දෙමළ | | | බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන් දහඅට දෙනෙකු (21) සඳහා දේශීය පුහුණුවීම් අවස්ථා ලබාදී ඇත. |
| | 2. කාර්ය මණ්ඩලය වෙත විදේශීය පුහුණු අවස්ථා ලබාදීම | | | බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන් විසිහතර දෙනෙකු (23) සහ මෙම දෙපාර්තමේන්තුවෙන් බාහිර නිලධාරීන් දෙදෙනෙකු (2) සඳහා විදේශීය පුහුණු අවස්ථා ලබාදී ඇත. |
| | 3. දේශීය සහභාගිවන්නන් 500 ක් සඳහා අවම වශයෙන් වැඩමුළු 15ක් සංවිධානය කිරීම | | වැඩසටහන් 19 | දැනුවත් කිරීමේ වැඩසටහන් පහළොවක් (21) පවත්වා ඇත. |
| | 4. විදේශීය සහභාගිවන්නන් 100 ක් සඳහා අවම වශයෙන් වැඩමුළු 03ක් සංවිධානය කිරීම | | | |
| **3. පාරිභෝගික සේවා කටයුතු** | 1. වෙළඳ ලකුණු ආශ්‍රිත ක්‍රියාකාරකම් | | කාර්යයන් 70,000 | 199,747 |
| | 2. පේටන්ට් බලපත්‍ර ලබාදීම ආශ්‍රිත ක්‍රියාකාරකම් | | කාර්යයන් 5,000 | 22,939 |
| | 3. කාර්මික සැලසුම් ආශ්‍රිත ක්‍රියාකාරකම් | | කාර්යයන් 6,000 | 42,201 |

| | | | | |
|---|---|---|---|---|
| | 4. කාර්මික සැලසුම් ආශ්‍රිත ක්‍රියාකාරකම් | | කාර්යයන් 10,000 | 22,882 |
| | 5. 5. මහජන පිරික්සුම් | | කාර්යයන් 8,000 | 8,679 |
| **4. කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම** | 1. සුදුසු ඉඩමක් සොයා ගැනීම<br>2. ගෘහ නිර්මාණ උපදේශකයකු තෝරා ගැනීම<br>3. ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම<br>4. මිලගණන් කැඳවා ඉන්පසු ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීම | | | 1.කොළඹ නාගරික සීමාව ඇතුලත සුදුසු ඉඩමක් ගබා ගැනීම සඳහා කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇත. මීට අමතරව , නාගරික සංවර්ධන අධිකාරියෙන් ද (UDA ) ඉඩමක් ගබා ගැනීමට ඉල්ලීමක් කරන ලදී. |
| **5. 2. වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම/ ලෝක බුද්ධිමය දේපළ සංවිධානයෙන් (WIPO ) පරිපාලනය කෙරන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීමට පෙර සිදුකල යුතුව ඇති කාර්යයන්.** | 1.මූලික ඇගයිම<br>4. ප්‍රවේශ කණ්ඩායමක් පත්කිරීම ( ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ කාර්යය මණ්ඩලය සහ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා කාර්ය මණ්ඩලය. )<br>WIPO නිලධාරින්ගෙන් උපදෙස් ලබාගැනීම එම නිලධාරින් සමග සාකච්ජා පැවැත්වීම.<br><br>111 මහජනතාවගෙන් සහ සහ අදාළ පාර්ශවකරුවන්ගෙන් අදහස් හා යෝජනා ලබා ගැනීම<br>1V දැනට ක්‍රියාත්මක වන නීති සඳහා අදාළ සංශෝධන යෝජනා කිරීම.<br>v.ආයතනය තුල භෞතික පහසුකම් සැලසුම් කිරීම/ කුසලතා සංවර්ධනය | | 9.මෙම ක්‍රමය ඔස්සේ අයදුම්කරුවෙතුට එක් ජාත්‍යන්තර අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කර අදාළ ගාස්තු ස්විට්සර්ලන්ත ෆ්‍රෑන්ක් මුදල් ඒකකයෙන් එක් වරක්පමණක් ගෙවීමෙන් රටවල් සමුහයක් තුල සිය වෙළඳ ලකුණ අන්තර් ජාතික ලියා පදිංචියට යොමු කල හැකිවීමහ පිරවෙැය ඵලදායි ක්‍රමයකි. පහසු ක්‍රමයකි.<br>එක් ගොනුගත කිරීමකින් මැඩ්රිඩ් ක්‍රමයේ සාමාජික රාජ්‍ය 96කට අයිති බහුවිට ප්‍රදේශ (territories ) 112 ක දී සමගාමී ආරක්ෂණයක් මෙම ක්‍රමය මගින් පිරිනැමේ. | • අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.<br>• උපදේශකවරයකුගේ සේවය ලබාගෙන ඇත.<br>• මෙම ව්‍යාපෘතිය සම්බන්ධ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා උපදේශක සමාගමක් තෝරා ගැනීම සඳහා අභිලාශය ප්‍රකාශ කිරීම ( EOI ) කැඳවා ඇත.<br><br>එක් උපදේශක සැසියක් පවත්වා ඇත. |
| | | | | 12. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මඟින් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙනඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ( මැඩිරිඩ් ව්‍යාපෘතිය අවසන් වනතුරු ) <br>  කාර්යාලීය උපකරණ මිලට ගැනීම. <br>  ඉංග්‍රිසි පාඨමාලාවක් සඳහා මෙම කාර්යාලයේ නිලධාරීන් සිවු දෙනෙකු යොමු කර ඇත |
| | v1. කාර්ය පරිපාටික කරුණු <br> v11 . තොරතුරු තාක්ෂණය සහ ස්වයං ක්‍රියාකරණ කටයුතු. <br><br><br><br><br><br><br><br><br><br><br><br><br> v111.මහජන දැනුවත් කිරීම් | | |  වෙබ් අඩවිය වැඩි දියුණු කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. <br>  IPAS පද්ධතියේ ඉදිරි කටයුතු කරගෙන යෑම සඳහා ICTA ආයතනයේ සහාය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. e- NIPO ව්‍යාපෘතිය සඳහා <br>  සර්වරයෙක් (Sever ) මිලදී ගැනීම. <br><br><br><br> දැනුවත් කිරීම් වැඩ සටහන් 02 ක් පවත්වා ඇත. |

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

**හැඳින්වීම**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාව තුල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනය, දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම මගින් ව්‍යවසාය සංවර්ධනය සඳහා ප්‍රමුඛ දායකත්වයක් දක්වන ආයතනයකි. ව්‍යවසායකත්ව සංවර්ධනය, මූල්‍ය පහසුකම් සඳහා යොමු කිරීම, වෙළඳපොල සම්බන්ධතා ඇති කිරීම, ව්‍යාපාර සංවර්ධන සහ පර්යේෂණ සිදුකිරීම සහ ව්‍යවසායකයන් සහ ව්‍යවසාය සංවර්ධන සේවා සපයන්නන් වෙත පහසුකම් සැලසීම අධිකාරිය මගින් සිදුකරනු ලබයි. තවද, ව්‍යවසායකයන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, අලෙවිකරණය, ව්‍යාපාර සැලසුම් සැකසීම, ගිණුම්කරණ, පොත් තැබීම සහ ඵලදායිතාවය නැංවීමේ වැඩසටහන් වැනි තවත් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**දැක්ම :**

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ප්‍රමුඛතම ආයතනය වීම.

**මෙහෙවර :**

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ වර්ධනය හා තිරසාරභාවය පිණිස කාර්‍යක්ෂමව හා සඵලදායීව අනෙකුත් ක්‍රියාකාරීන් සමඟ සම්හන්ධීකරණයෙන් හා සහයෝගයෙන් සංවර්ධනය, ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම සහ නංවාලීම.

**අරමුණු :**

1. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වර්ධනය සහ වැඩිදියුණුව, තරඟකාරීත්වය සඳහා ඵලදායී සහ සුදුසු ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීම

2. සුදුසු යෙදවුම් සහ ප්‍රතිපත්ති දිශානතීන් ක්‍රියාවට නැංවීම මගින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රතිපත්ති රාමුව බලගැන්වීම.

3. හඳුනාගත් ව්‍යාපාර පර්ෂදයන්හි වර්ධනය වේගවත් කිරීම.

4. වාණිජකරන පේටන්ට් ප්‍රවර්ධනය, තාක්‍ෂණය වර්ධනය කිරීම සහ නිෂ්පාදනයන්හි සංවර්ධනය ඇති කිරීම.

5. ප්‍රාදේශීය මට්ටමින් ඇති සම්පත් උපරිම වශයෙන් භාවිතා කරමින් තරගකාරී සහ ප්‍රායෝගික ව්‍යවසායන් ආරම්භ කිරීම සඳහා පහසුකම් සැපයීම තුලින් ප්‍රාදේශීය වශයෙන් ආර්ථික වර්ධනයට දක්වන දායකත්වය ඉහළ නැංවීම සඳහා

**ප්‍රධාන කාර්යයන්**

1. ව්‍යාපාර සඳහා අවශ්‍ය තාක්ෂණික සහ කලමණාකරන තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය පහසු ප්‍රවේශයන් සැලසීම.

2. ව්‍යාපාර පසුකම් සපයන ආයතන ශක්තිමත් කිරීම සහ ව්‍යාපාර පසුකම් සපයන ආයතන සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රමයක් සැකසීම.

3. ව්‍යවසායකයන් හඳුනාගැනීමේ වැඩසටහන් දිරිගැන්වීම.

4. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සංවර්ධනය කිරීම සඳහා ඇති බාධක හඳුනාගෙන ඒවා විසඳීමට අවශ්‍ය අදහස් ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් හුවමාරු කර ගැනීම.

5. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රතිපත්ති සැකසීම සඳහා විභව්‍ය නිර්දේශයන් මුදල් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපාර පහසු කිරීමේ සංසඳයට සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට යොමු කිරීම.

6. හඳුනාගත් ව්‍යාපාර පර්ෂදයන්හි දැනට පවතින ව්‍යාපාරවල වර්ථමාන ධාරිතාවය ඉහළ නැංවීම

7. නව තාක්ෂණය භාවිතය සඳහා සහාය දැක්වීම තුලින් නව්‍ය ව්‍යාපාර ප්‍රවර්ධනය

8. ප්‍රාදේශීය වශයෙන් තරඟකාරී සහ ප්‍රායෝගික ව්‍යාපාරයන් ආරම්භකිරීම.

9. වෘත්තීමය හා ප්‍රවීණතාවකින් යුතු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සහ කලමණාකරන හැකියාවන් සංවර්ධනය තුලින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මානව සම්පත සංවර්ධනය කිරීම.

10. අභ්‍යන්තර ක්‍රියාකාරකම්හි විනිවිද භාවය සහ සම්මත ක්‍රියාපිළිවෙල අනුගමනය කිරීම තුලින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත ලබා දෙන සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

1. ව්‍යාපෘතියේ නම : තොරතුරු ව්‍යාප්තිය

ව්‍යාපෘතියේ අරමුණ :ව්‍යාපාර සඳහා අවශ්‍ය තාක්ෂණික සහ කලමණාකරන තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය පහසු ප්‍රවේශයන් සැලසීම.

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 1.1 පුවත් හසුනක් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මාර්ගෝපදේශ ග්‍රන්ථයක් සැකසීම (යන්ත්‍රෝපකරණ | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මාර්ගෝපදේශ ග්‍රන්ථය<br><br>පුවත් හසුන | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මාර්ගෝපදේශ ග්‍රන්ථය - යන්ත්‍රෝපකරණ | මාර්ගෝපදේශ ග්‍රන්ථයේ මෘදු පිටපත සම්පූර්ණ කර ඇත |

| | | | |
|---|---|---|---|
| සපයන්නන්/ ආයතන) සහ NEDA, sme.lk සහ ye.lk වෙබ් අඩවි පවත්වාගෙන යාම | වෙබ් අඩවි යාවත්කාලීන කිරීම | පුවත් හසුන් 4 ක් වෙබ් අඩවි යාවත්කාලීන කිරීම | එක් පුවත් හසුනක් ප්‍රකාශයට පත්කර ඇත. sme.lk සහ ye.lk වෙබ් අඩවි යාවත්කාලීන කර ඇත |
| 1.2 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතියක් සැකසීම | දත්ත පද්ධතිය | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතිය | සංවර්ධන නිලධාරීන් මගින් තොරතුරු රැස්කර ඇත |
| 1.3 රූපවාහිනී වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | සතිපතා මිනිත්තු 30 බැගින් විකාශනය කිරීම | වැඩසටහන් 39 ක් විකාශනය කර ඇත සටහන : පෝය දින සහ ජනාධිපති තුමාගේ විශේෂ වැඩසටහන් පැවැත්වෙන දිනයන්හි විකාශය නොවේ. පසු ගිය වර්ෂය සඳහා ගෙවීම් සිදු කර ඇත. |

2. ව්‍යාපෘතියේ නම : ව්‍යාපාර සංවර්ධන සේවා ජාලය

ව්‍යාපෘතියේ අරමුණ :ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ශක්තිමත් කිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 2.1 ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ලියාපදිංචිය සහ බලපත්‍ර ලබාදීම | ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ලියාපදිංචි කල සංඛ්‍යාව | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වූ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සහ උපදේශකයින් සංඛ්‍යාව ( ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 25 ක් සහ උපදේශකයින් 25 ක්) | අයදුම් පත්‍ර කැඳවා ඔවුන් ලැයිස්තුගත කර ඇත. ( ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 130 ) |

3. ව්‍යාපෘතියේ නම : ව්‍යවසායක ඇගයීම්

ව්‍යාපෘතියේ අරමුණ : ව්‍යවසායකයින් දිරි ගැන්වීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 3.1 සම්මාන ප්‍රධාන උළෙල පැවැත්වීම (පළාත් උළෙල - දකුණ, බස්නාහිර, මධ්‍යම, උතුර, නැගෙනහිර, සබරගමුව සහ උතුරු මැද) | හඳුනාගත් ව්‍යවසායකයන් ප්‍රමාණය | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 100 ක් හඳුනාගැනීම | බස්නාහිර, මධ්‍යම, සබරගමුව සහ උතුරු මැද පළාත් වල සම්මාන ප්‍රධාන උළෙල පවත්වා ඇති අතර උතුර සහ නැගෙනහිර පළාත් හි |

| | | | |
|---|---|---|---|
| | | | සම්මාන ප්‍රධාන උළෙල සංවිධානය කර ඇත. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 100 ක් හඳුනාගෙන ඇත.<br><br>සටහනඃ පසු ගිය වර්ෂය සඳහා ගෙවීම් සිදු කර ඇත. |

4. ව්‍යාපෘතියේ නම : ව්‍යවසාය සංසඳ

ව්‍යාපෘතියේ අරමුණ : ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සංවර්ධනය කිරීම සඳහා ඇති බාධක හඳුනාගෙන ඒවා විසඳීමට අවශ්‍ය අදහස් ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් හුවමාරු කර ගැනීම.

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 4.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රාදේශීය ව්‍යවසාය සංසඳ පැවැත්වීම | සංසඳ පැවැත්වූ සංඛ්‍යාව සහ විසඳුම් සංඛ්‍යාව | සංවර්ධන නිලධාරීන් අනුයුක්ත සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ප්‍රාදේශීය ව්‍යවසාය සංසඳ පිහිටුවීම | 2016 වසර වන විට ප්‍රාදේශීය ව්‍යවසාය සංසඳ 88 ක් පිහිටුවා ඇත.<br><br>සටහන :ප්‍රාදේශීය ව්‍යවසාය සංසඳ පිහිටුවීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ සඳහා දක්වන උනන්දුව මත තීරණය වේ. මේ සඳහා මුදල් වෙන් කිරීමේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පෙර අත්දැකීම් සැලකිල්ලට ගෙන ඇත. මීලග වසරේදී ඉලක්කය වෙනස් විය හැක. |
| 4.2 දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික් ව්‍යවසාය සංසඳ පැවැත්වීම | සංසඳ පැවැත්වූ සංඛ්‍යාව සහ විසඳුම් සංඛ්‍යාව | සංවර්ධන නිලධාරීන් අනුයුක්ත සෑම දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයකම දිස්ත්‍රික් ව්‍යවසාය සංසඳ පිහිටුවීම | 2016 වසර වන විට දිස්ත්‍රික් ව්‍යවසාය සංසඳ 13 ක් පිහිටුවා ඇත.<br><br>සටහන : ප්‍රාදේශීය ව්‍යවසාය සංසඳ සේම වේ. |
| 4.3 ජාතික මට්ටමින් ජාතික ව්‍යවසාය සංසඳයක් පැවැත්වීම | සංසඳ පැවැත්වූ සංඛ්‍යාව සහ විසඳුම් සංඛ්‍යාව | ජාතික ව්‍යවසාය සංසඳය පිහිටුවීම | පවත්වා නැත.<br><br>පසු ගිය වර්ෂය සඳහා ගෙවීම් සිදු කර ඇත. |

5. ව්‍යාපෘතියේ නම : Issue Tracker මෘදුකාංගය

ව්‍යාපෘතියේ අරමුණ : ව්‍යාපාරික ගැටළු සඳහා විසඳුම් සැපයීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 5.1 Issue Tracker සංවර්ධනය කිරීම | Issue Tracker සංවර්ධනය කිරීම | Issue Tracker සංවර්ධනය කිරීම | මෘදුකාංගය සංවර්ධනය කිරීම<br><br>නව අන්තර්ජාල සහය සේවාවක් (server) මිලදී ගැනීම, නව ඩොමේන් නාමයක් යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙහි ලියාපදිංචි කිරීම<br><br>පරිගණක මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. |

6. ව්‍යාපෘතියේ නම : ආර්ථික කලාප සංවර්ධනය

ව්‍යාපෘතියේ අරමුණ : වෙළඳපොල සබඳතා ගොඩනැංවීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 6.1 ජාතික සහ ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත සහ ව්‍යාපාරික සල්පිල් පැවැත්වීම (ජාතික වැඩසටහන් අම්පාර සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි) | අලෙවි සල්පිල් පැවැත්වූ සංඛ්‍යාව සහ ව්‍යාපාරික සබඳතා ඇති කල සංඛ්‍යාව | කර්මාන්ත ක්ෂේත්‍රයේ සල්පිල් 2 ක්<br><br>ප්‍රාදේශීය ව්‍යාපාරික සල්පිල් 2 ක් | ප්‍රාදේශීය ව්‍යාපාරික සල්පිල් 2 ක් පවත්වා ඇත (කුරුණෑගල සහ හම්බන්තොට)<br><br>අමතර ක්‍රියාකාරකම්: ව්‍යවසායකයන් 270 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වා ඇත. |

7. ව්‍යාපෘතියේ නම : අලෙවි සබඳතා වැඩසටහන

ව්‍යාපෘතියේ අරමුණ :නව තාක්ෂණය භාවිතය සඳහා සහාය දැක්වීම තුලින් නව්‍ය ව්‍යාපාර ප්‍රවර්ධනය

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 7.1 ඇසුරුම්කරණ තාක්ෂණික සහාය අවශ්‍ය ප්‍රාදේශීය ව්‍යවසායකයන් සඳහා පහසුකම් සැලසීම | පුහුණුව ලබාදුන් සහ සංවර්ධනය කල ව්‍යවසායකයන් ප්‍රමාණය | ව්‍යවසායකයන් 25 ක් සංවර්ධනය කිරීම | කුරුණෑගල, මහනුවර, අම්පාර සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි ව්‍යවසායකයන් 115 ක් සඳහා ඇසුරුම්කරණය පිළිබඳ පුහුණුව ලබාදී ඇති අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ව්‍යවසායකයන් සඳහා මූල්‍ය සහාය ලබාදී ඇත. |

8. ව්‍යාපෘතියේ නම : තාක්‍ෂණ හුවමාරු සහ පෙරවැඩුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම

ව්‍යාපෘතියේ අරමුණ :නව තාක්‍ෂණය භාවිතය සඳහා සහාය දැක්වීම තුලින් නව්‍ය ව්‍යාපාර ප්‍රවර්ධනය

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 8.1 තාක්‍ෂණ හුවමාරු සහ පෙරවැඩුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම - මාකඳුර | සංවර්ධනය කල ව්‍යවසායකයන් ප්‍රමාණය | ව්‍යවසායකයන් 25 දෙනෙකු සංවර්ධනය කිරීම | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ කටයුතු සහ ඉදකිරීම් කටයුතු<br><br>2017 පෙබරවාරි මස අවසානයේදී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ වනු ඇත. |

9. ව්‍යාපෘතියේ නම : ජාතික ව්‍යවසායකත්ව අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීම

ව්‍යාපෘතියේ අරමුණ :ප්‍රාදේශීය වශයෙන් ප්‍රායෝගික මෙන්ම තරඟකාරී ව්‍යාපාර ඇතිකිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 9.1 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා සහතිකපත්‍ර පාඨමාලාවක් සහ වැඩමුළු පැවැත්වීම - කොළඹ | සහතිකපත්‍ර පාඨමාලා ප්‍රමාණය සහ පුහුණුව ලැබූ ව්‍යවසායකයන් ප්‍රමාණය | සහතිකපත්‍ර පාඨමාලා 3 ක් | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමග එක්ව ව්‍යවසායකයන් 35 දෙනෙකු සඳහා සහතිකපත්‍ර පාඨමාලාවක් ආරම්භ කර ඇත. |

10. ව්‍යාපෘතියේ නම : ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධනය

ව්‍යාපෘතියේ අරමුණ :ප්‍රාදේශීය වශයෙන් ප්‍රායෝගික මෙන්ම තරඟකාරී ව්‍යාපාර ඇතිකිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 10.1 නව ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ පවතින ව්‍යාපාර ප්‍රසාරණය කිරීම - සියළුම දිස්ත්‍රික්ක | නව ව්‍යාපාර ආරම්භකල ප්‍රමාණය සහ ප්‍රසාරණය කල පවතින ව්‍යාපාර ප්‍රමාණය | ප්‍රාදේශීය වශයෙන් නව සහ ප්‍රසාරණය කල පවතින ව්‍යාපාර 2000 ක් ඇති කිරීම | ව්‍යවසායකයන් 6259 දෙනෙකු පුහුණු කිරීම |
| 10.2 යුධ වැන්දඹු ජීවිකා වැඩසටහන | ප්‍රවර්ධනය කල කාන්තා ව්‍යවසායිකාවන් ප්‍රමාණය | කාන්තා ව්‍යවසායිකාවන් 50 දෙනෙකු ප්‍රවර්ධනය කිරීම | අවශ්‍යතා තක්සේරු කිරීමේ සමීක්ෂණයක් සිදුකර ඇත. |
| 10.3 ඇඟළුම් ආශ්‍රිත ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන | ප්‍රවර්ධනය කල කාන්තා ව්‍යවසායිකාවන් ප්‍රමාණය | කාන්තා ව්‍යවසායිකාවන් 500 දෙනෙකු ව්‍යාපාරය සඳහා යොමු කිරීම | ප්‍රතිලාභීන් 1013 දෙනෙකු පුහුණු කර ඇත.<br><br>කුරුණෑගල - 313<br>කෑගල්ල - 150<br>ත්‍රිකුණාමලය - 150<br>වවුනියාව - 400 |
| 10.4 Win Biz - කාන්තාවන් සඳහා ව්‍යාපාර (සියළුම දිස්ත්‍රික්ක) | ප්‍රවර්ධනය කල කාන්තා ව්‍යවසායිකාවන් ප්‍රමාණය | කාන්තාවන් 1500 ක ගේ ව්‍යවසායකත්ව ධාරිතා වර්ධනය | ප්‍රතිලාභීන් 2931 දෙනෙකු පුහුණු කර ඇත. |
| 10.5 ග්‍රාමීය කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (ජාතික ශිල්ප සභාව සමග) | ප්‍රවර්ධනය කල කාන්තා ව්‍යවසායිකාවන් ප්‍රමාණය | කාන්තා ව්‍යවසායිකාවන් 50 දෙනෙකු ව්‍යාපාරය සඳහා යොමු කිරීම | මන්නාරම, මඩකලපුව සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි 70 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදී ඇත. |

11. ව්‍යාපෘතියේ නම : ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායකත්වය

ව්‍යාපෘතියේ අරමුණ :ප්‍රාදේශීය වශයෙන් ප්‍රායෝගික මෙන්ම තරගකාරී ව්‍යාපාර ඇතිකිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 11.1 ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව වෙත නව්‍ය ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නව තාක්‍ෂණය සහ පුහුණුව ලබා දීමට බලපත්‍රයක් ලබා ගැනීම | පුහුණු කල තරුණ ශිෂ්‍යයන් ප්‍රමාණය | පාසල් ශිෂ්‍යයන් වෙත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය සඳහා පුහුණු බලපත්‍රයක් ලබාගැනීම<br><br>තරුණ ප්‍රජාව වෙත ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පාසල් ශිෂ්‍යයන් වෙත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය සඳහා තවම මෙම බලපත්‍රය ලබාගෙන නොමැත.<br><br>විශ්ව විද්‍යාල වල සහාය ඇතිව ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. තරුණයන් පුහුණු කර ඇති අතර, ප්‍රායෝගික ව්‍යාපාර 5 ක් සඳහා මූල්‍ය සහාය ලබාදී ඇත.<br><br>සටහන : මෙය පසු ගිය වර්ෂයේ වැඩසටහනකි. මෙම වසරේ ගෙවීම් සිදුකර ඇත. |

12. ව්‍යාපෘතියේ නම : ව්‍යවසායකයන් (උපාධිධාරී ව්‍යවසායක උදානය)

ව්‍යාපෘතියේ අරමුණ :ප්‍රාදේශීය වශයෙන් ප්‍රායෝගික මෙන්ම තරගකාරී ව්‍යාපාර ඇතිකිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 12.1 උපාධිධාරීන් 250 දෙනෙකු සඳහා පුහුණුව සහ වෙනත් පහසුකම් ලබාදීම - වයඹ, සබරගමුව, ඌව වෙල්ලස්ස, ජයවර්ධනපුර, රුහුණ, යාපනය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයන්හි | | උපාධිධාරීන් 250 දෙනෙකු පුහුණු කිරීම සහ 25 දෙනෙකු ව්‍යවසායකයන් බවට පත් කිරීම | පේරාදෙණිය, වයඹ, රුහුණ සහ සබරගමුව විශ්ව විද්‍යාලයන්හි උපාධිධාරීන් 168 දෙනෙකු පුහුණු කර ඇත. |

13. ව්‍යාපෘතියේ නම : කාර්යමණ්ඩලය පුහුණු කිරීම

ව්‍යාපෘතියේ අරමුණ : ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මානව සම්පත සංවර්ධනය

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 13.1 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ කාර්යමණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සැපයීම | ධාරිතා සංවර්ධනයවූ කාර්යමණ්ඩලයේ ප්‍රමාණය | අවශ්‍යතාවයේ පරිදි ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ කාර්යමණ්ඩලය සඳහා සහ සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ඉලක්කයන් අනුව කාර්යමණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී |

14. ව්‍යාපෘතියේ නම : ISO තත්ව සහතිකය ලබා ගැනීම

ව්‍යාපෘතියේ අරමුණ : සේවාවන්ගේ තත්වය සහ ගුණාත්මක භාවය ඉහළ නැංවීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 14.1 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සඳහා ISO තත්ව සහතිකය ලබා ගැනීම | ISO තත්ව සහතිකය | ISO තත්ව සහතිකය ලබා ගැනීම | මෙය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයක් තෝරාගෙන ඇත. |

15. ව්‍යාපෘතියේ නම : විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතියේ අරමුණ : ප්‍රාදේශීය වශයෙන් ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය 2016 | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 15.1විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | සහාය ලබාදුන් ව්‍යවසායකයන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් 3000 ක් සඳහා මූල්‍ය සහාය ලබාදීම | කුරුණෑගල, මුලතිවු, සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි ප්‍රතිලාභීන් 708 ක් සඳහා මූල්‍ය සහාය ලබාදී ඇත. |

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**හැඳින්වීම**

1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත සහ 1987 අංක 1 දරණ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත (173 වන අධිකාරය වූ) අහෝසි කරමින් 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළෙඳාම සහ භාණ්ඩ හා සේවා මිළ ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම'' අසාධාරණ සහ සීමිත වෙළෙඳ පිළිවෙත් වලට එරෙහිව වෙළෙඳුන් සහ සාදන්නන් ආරක්ෂා කිරීමයි. තවද'' හැකිසෑම අවස්ථාවකදීම තරගකාරී මිල ප්‍රවර්ධනය කිරීම'' භාණ්ඩ හා සේවා වෙළෙන්දන් හා සාදන්නන් අතර යහපත් තරගයක් පවත්වාගැනීමත් අපේක්ෂා කෙරේ.

**දැක්ම**

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුල මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයකු බිහිකිරීම

**මෙහෙවර**

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරගකාරිව ප්‍රවර්ධනය කිරීම තුලින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

**ඒකාබද්ධ ඉලක්කයන්**

- වෙළෙඳපොල නියාමනය කිරීම මගින් අමන්දානන්දනයට පත්වූ, පාරිභෝගිකයෙකු බිහි කිරීම
- අසාධාරණ වෙළෙඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයන්ට සහන සැලසීම
- පාරිභෝගික අධ්‍යාපනය සහ පාරිභෝගිකයා සවිබලගැන්වීම
- තරගවිරෝධී වෙළෙඳ චර්යාවන්ගෙන් නිෂ්පාදකයා හා වෙළෙඳුන් ආරක්ෂා කිරීම සහ වඩාත් හිතකර තරගකාරී වාතාවරණයක් ප්‍රවර්ධනය කිරීම
- හැකියාවන් වැඩි දියුණු කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළගාකර ගැනීම

**කාර්යයභාරය**

අ) ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් ව්‍යවසායන් අතර මිල පිළිබඳ වැඩ පිළිවෙලවල් වෙළෙඳපොල ඇතුළත හෝ වෙළෙඳපොලේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම හෝ

දේශීය හෝ ජාත්‍යන්තර වෙළඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරගකාරිත්වය පිළිබඳ යම් අවහිරයක් පාලනය කිරීම හෝ ඉවත් කිරීම

ආ) තරගවිරෝධි චර්යා හා ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරික්ෂණ කිරීම

ඇ) භාණ්ඩ සහ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායි තරගකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම

ඈ) භාණ්ඩ හා සේවාවල මිල'' ඒවා ලබාගත හැකිවීම සහ ඒවායෙහි තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ'' මිලදී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම

ඉ) මිලදී ගැනිමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය'' ප්‍රමාණය'' ශක්තිය'' පිරිසිදුකම'' ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම

ඊ) මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරික්ෂණ පැවැත්වීම

උ) වෙළෙඳපොල තරගකාරිත්වය අඩු ඵලදායිතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොලෙහි තරගකාරී මිල ප්‍රවර්ධනය කිරීම

ඌ) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යනය භාරගැනීම'' වාර්තා පළකිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම

එ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම

ඒ) පාරිභෝගිකයන්ගේ මනා සෞඛ්‍යය'' ආරක්ෂාව'' සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

ඔ) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමග හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කිරීම

ඕ) පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම'' උපකාර කිරීම සහ උනන්දු කිරීම

ක) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම

ග) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය විය හැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත් කිරීම'' සහ

ච) අධිකාරියේ අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු කිරීම

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක | ප්‍රගතිය |
|---|---|---|---|
| වෙළඳ පොළ විමර්ශන හා වැටලීම් | මාසිකව වැටලීම් 2000 බැගින් | 24,000 | 21,874 |
| පනතේ විධිවිධාන උල්ලංඝනය කරන වෙළෙඳුන්ට එරෙහිව නඩු පැවරීම | වැටලීම් අතරින් 90% | 21,600 | 21,774 |
| ගැසට් කිරීම පිණිස පනතේ 10,12 වගන්තිය යටත් අළුත් නිෂ්පාදන හඳුනා ගැනීම | මාසිකව ගැසට් පත්‍රයක් බැගින් | 12 | 1 |
| පනතේ 10,12 වගන්තිය යටතේ විශේෂ , පොදු නියෝග නිකුත් කිරීම | මාසිකව නියෝගයක් බැගින් | 12 | 3 |
| නිෂ්පාදන පරීක්ෂා කිරීමේ හා පාරිභෝගික ආරක්ෂණ විද්‍යාගාරය පිහිටුවීම | අවසන් සැලසුම සකස් කිරීම | | |
| සමථයකට පත් නොවීමේදී නීති මගින් කටයුතු කිරීම | මාසිකව නඩු 5 බැගින් | 80 | 11 |
| වෙළඳ ගිවිසුම් සඳහා වන ප්‍රමුඛතා අවස්ථාවන් හඳුනා ගැනීම | කාර්තුවකට 1 බැගින් | 4 | |
| ගිවිසුම් සකස් කිරීම හා ක්‍රියාවේ යෙදවීම | කාර්තුවකට 1 බැගින් | 4 | |
| ගිවිසුම් කලින් කලට සමාලෝචනය කිරීම | | - | |
| වෙළඳුන් සඳහා සහායක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | මසකට 40 බැගින් | 480 | |
| නියාමනය කිරීම සඳහා අළුත් සේවා ක්ෂේත්‍ර හඳුනා ගැනීම | මාස 6ට 1 බැගින් | 2 | |
| ලෝක වෙළඳපොල මූලයන් හා ලෝක වෙළඳපොල මිළ ගණන්වලට අදාල දත්ත මූලයන් සකස් කර යාවත්කාලීන කිරීම | මිළ ගණන් ප්‍රතිශෝධන යාවත්කාලීන කිරීම් හඳුනාගැනීම | - | |
| මිළ ගණන් පිළිබඳ වෙළඳපොල නිරීක්ෂණයන් ක්‍රියාත්මක කිරීම | වාර්තා 25 බැගින් | 24 | වාර්තා 12 |
| වෙළඳපොල නිරීක්ෂණයන් ක්‍රියාත්මක කිරීම | මසකට 1 බැගින් | 12 | 12 |
| අධික මිළ නියම කිරීම පිළිබඳ විමර්ශන පැවැත්වීම හා භාණ්ඩ හා සේවා කෙරෙහි මිළ සීමාවන් නිර්දේශ කිරීම | | 4 | 4 |
| | සෑම මාස තුනකට වරකම විමර්ශනයක් බැගින් | 4 | |
| වෙළඳ පොළ පිළිබඳ බුද්ධි තොරතුරු එකතු කිරීම | | 2 | වාර්තා 2 |

**ව්‍යාපෘතිය - තරඟවිරෝධී චර්යාවන්ගෙන් පාරිභෝගිකයින් හා වෙළෙඳුන් ආරක්ෂා කිරීම, යහපත් තරඟකාරිත්ව චර්යාවන් ප්‍රවර්ධනය කිරීම**

| **ක්‍රියාකාරකම** | **කාර්ය සාධන දර්ශකය** | **ඉලක්ක** | **ප්‍රගතිය** |
|---|---|---|---|
| තරඟවිරෝධී පරිචයන්ට අදාළ පැමිණිලි පිළිබඳව විමර්ශනය කිරීම හා මැදිහත්වීම | | 3 | 3 |
| | දින 100ක් ඇතුලත සම්පූර්ණ කිරීම | 30 | පැමිණිලි 28ක් |
| වෙළඳපොළ ආධිපත්‍ය අනිසි ලෙස භාවිත කිරීම හඳුනාගැනීම සඳහා වෙළඳ පොළ පර්යේෂණ සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා පැවැත්වීම | කාර්තුවකට එක් පර්යේෂණය බැගින් | 4 | අධ්‍යයන 9ක් |
| හඳුනාගත් නිෂ්පාදන හා කර්මාන්තවලට අදාල වෙළඳපොල කොටස පරීක්ෂණය කිරීම | | 1 | වාර්තා 2ක් |

| **ක්‍රියාකාරකම** | **කාර්ය සාධන දර්ශකය** | **ඉලක්ක** | **ප්‍රගතිය** |
|---|---|---|---|
| දැනුවත් කිරීම<br>මහජනතාව දැනුවත් කිරීම | | 255 | 255 |
| පාසැල් ළමුන් දැනුවත් කිරීම | මාසිකව 20 බැගින් | 264 | 206 |
| පාරිභෝගික සමිති, පාසල් පාදක පාරිභෝගික කවයන් ප්‍රවර්ධනය කිරීම | | | |
| පාරිභෝගික සමිති පිහිටුවීම | මසකට සමිති 7 බැගින් | 105 | 6 |
| පාසල් පාදක පාරිභෝගික කවයන් | මසකට සමිති 7 බැගින් | 84 | 87 |
| සමාජ මාධ්‍ය, IVR කෙටි සංකේත, කෙටි පණිවුඩ හරහා තොරතුරු උත්පතනය කිරීම | | 260,000 | 234,720 ඇතුලත් |

| ව්‍යාපෘතියේ නම - හැකියා වර්ධනය තුලින් සංවිධානාත්මක දියුණුව ලබාගැනීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක - 2016 | | | | එකතුව | ප්‍රගතිය - 2016 |
| | | කා. 1 | කා. 2 | කා. 3 | කා. 4 | | |
| වෙළඳ පොළ විමර්ශන හා වැටලීම් | ලියාපදිංචි කිරීම් ක්‍රියාත්මක කිරීම | - | - | | | | |
| ව්‍යාපාරික ක්ෂේත්‍ර වර්ගීකරණය කිරීම | | - | - | | | | |
| පනතට යෝජනාවී අවසාන සංශෝධන | | අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත සංශෝධන අවසන් කිරීම | | | | | |
| අවශ්‍ය පරිදි වැඩිදුර දියුණු කිරීම් සමලෝචනය කර සකස් කිරීම | | විමර්ශන නිලධාරීන් - 100<br>කළමනාකරණ සහකාර - 25<br>කාර්යාල කාර්ය සහායක - 25<br>නි. අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) – 05<br>සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීම | | | | | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීම<br>විමර්ශන නිලධාරීන් - 50<br>කළමනාකරණ සහකාර - 20<br>කාර්යාල කාර්ය සහායක - 20<br>රියදුරු - 10 |
| • කාර්ය සාධන ඇගයීම් හා සැලසුම් කිරීම් හරහා පුහුණු කිරීමේ අවශ්‍යතා හඳුනා ගැනීම | | 85 | 85 | 85 | 85 | 340 | |
| • පුහුණු කිරීමේ සැලසුම් සකස් කිරීම | | √ | | | | | |
| • කාර්ය මණ්ඩලයට පුහුණුවීම් ලබාදීම | | 70 | 70 | 70 | 70 | 280 | 146 |
| පුහුණු කිරීමේ ඇගයීම් ලබාදීම හා පසුවිපරම් විශ්ලේශනය | | 70 | 70 | 70 | 70 | 280 | |
| විමර්ශන නිලධාරීන් 50ක් බඳවා ගැනීම | | | | | | | සම්මුඛ පරීක්ෂණ 2016.08.06,10,13 දිනවලදී පැවැත්විණි |

ව්‍යාපෘතිය - පාරිභෝගික සවිබලගැන්වීම

| ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක | ප්‍රගතිය |
|---|---|---|---|
| දැනුවත් කිරීම්<br>මහජනතාව දැනුවත් කිරීම | | 255 | 255 |
| පාසැල් ළමුන් දැනුවත් කිරීම | මාසිකව 20 බැගින් | 264 | 206 |
| පාරිභෝගික සමිති, පාසල් පාදක පාරිභෝගික කවයන් ප්‍රවර්ධනය කිරීම | | | |
| පාරිභෝගික සමිති පිහිටුවීම | මසකට සමිති 7 බැගින් | 105 | 6 |
| පාසල් පාදක පාරිභෝගික කවයන් | මසකට සමිති 7 බැගින් | 84 | 87 |
| සමාජ මාධ්‍ය, IVR කෙටි සංකේත, කෙටි පණිවුඩ හරහා තොරතුරු උත්පතනය කිරීම | | 260,000 | 234,720 ඇතුලත් |

ව්‍යාපෘතිය - අසාධාරණ වෙළඳ පරිචයන් හේතුවෙන් පීඩාවටපත් පාරිභෝගිකයින්ට සහන ලබාදීම

| | | | |
|---|---|---|---|
| **ක්‍රියාකාරකම** | **කාර්ය සාධන දර්ශකය** | **එකතුව** | **ප්‍රගතිය** |
| පාරිභෝගික පැමිණිලි සඳහා ක්‍රියාකිරීම | ලැබුනු පැමිණිලි ගණන 90% | 1740 | 1981 |
| 1977 ව්‍යාප්ත කිරීම | 1977 ඇමතුම් මධ්‍යස්ථානයක් හැටියට වෙනස් කිරීම | | |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**හැඳින්වීම :**

1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ 1996 වර්ෂයේදී පළමුවෙන්ම පිහිටුවන ලද කාර්මික සංවර්ධන මණ්ඩලය, 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ එහි වර්තමාන තත්ත්වයෙන් කටයුතු කරන ප්‍රමුඛතම ආයතනයක් වී ඇති හෙයින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය කිරීම එහි ප්‍රධානම අරමුණ වී තිබේ.

**දැක්ම:**

ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම

**මෙහෙවර:**

ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරන ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයාදීම.

**මණ්ඩලය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්**

1. මණ්ඩලයේ අරමුණු වලට සුදුසු පරිදි රජයේ හෝ රජයේ දෙපාර්තමේන්තු හෝ ව්‍යවස්ථාපිත අනුග්‍රහ ලබන සංස්ථා හෝ කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය සියලු සේවාවන් සැපයීම.
2. මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සියලු පියවර ගැනීම.
3. ඇමතිවරයාගේ ඉල්ලීම පරිදි කර්මාන්ත සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලබන කර්මාන්ත කමිටුවල අදහස් සහ යෝජනා, නිර්දේශ ඇතුළත් වාර්තා ඇමතිවරයා වෙත ඉදිරිපත් කිරීම.
4. තවද, අදාළ විෂයභාර ඇමතවරයා ඉල්ලන ලද අවස්ථා වලදී කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය සම්බන්ධයෙන් අවශ්‍ය යෝජනා ඇමතිවරයා වෙත ඉදිරිපත් කිරීම.

## 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

ව්‍යාපෘතියේ නම : නිෂ්පාදන හා සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන ගම්මාන

ව්‍යාපෘතියේ අරමුණ : නව සහ පවතින කර්මාන්ත සංවර්ධනය

| අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය |
| 1 | මඩකලපුවේ ස්වර්ණාභරණ ගම්මාන සඳහා යන්ත්‍රෝපකරණ බෙදාදීම | උපකරණ සංඛ්‍යාව | 300 | 200 |
| 2 | ස්වර්ණාභරණ ගම්මාන සඳහා උසස් තාක්ෂණික වැඩසටහන් පැවැත්වීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 100 | 56 |
| 3 | නුවර දිස්ත්‍රික් පිටිවල මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සඳහා යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | | | මැටි ඇඹරීමේ යන්ත්‍ර 25ක් මිළයට ගැනීම |
| | | | | සෙවිලි තහඩු 170 ක් මිළයට ගැනීම |
| 4 | නුවර දිස්ත්‍රික් පිටිවල ගම්මානය සඳහා උසස් තාක්ෂණය ලබාදීම | පුහුණු කරන ලද සංඛ්‍යාව | | 125 |
| 5 | මුලතිව් දිස්ත්‍රික් කජු ගම්මාන සඳහා යන්ත්‍ර සවිකිරීම | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | | කජු ලෙලි ඉවත්කිරීමේ සහ කජු ශ්‍රේණි ශ්‍රේණිගත කිරීමේ උපකරණ කට්ටල 64 ක් මිළයට ගැනීම |
| 6 | කුරුණෑගල දිස්ත්‍රික් පහළ ගම්මාන මැටි කර්මාන්ත සඳහා යන්ත්‍ර සවිකිරීම | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | | සකපෝරු 10 ක් සවිකිරීම |
| 7 | පහළ ගම්මාන මැටි කර්මාන්ත සඳහා තාක්ෂණය ලබාදීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | | 10 |
| 8 | පහළ ගම්මාන මැටි කර්මාන්ත සඳහා කළමනාකරණ වැඩසටහන් පැවැත්වීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | | 10 |
| 9 | මුල්ලාවලි කජු ගම්මාන සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | | 50 |
| 10 | කලුතර දිස්ත්‍රික් ඉළිඹ කොහු ගම්මානය සඳහා යන්ත්‍රෝපරකණ සවිකිරීම | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව | | යන්ත්‍ර කට්ටලයක් මිළයට ගැනීම |

ව්‍යාපෘතියේ නම : නිෂ්පාදන ගම්මාන සංවර්ධනය

ව්‍යාපෘතියේ අරමුණ : නව සහ පවතින කර්මාන්ත සංවර්ධනය

| අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| 1 | කෑගල්ල දිස්ත්‍රික් මැණික් කඩවර පන් හා බට ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය සඳහා යන්ත්‍රෝපරකණ ලබාදීම | උපකරණ සංඛ්‍යාව | 40 | 40 |
| 2 | මැණික් කඩවර පන් හා බට ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය සඳහා තාක්ෂණික වැඩසටහන් පැවැත්වීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 27 | 20 |
| 3 | තවාර පුරම් කජු ගම්මානය සඳහා යන්ත්‍රෝපරකණ ලබාදීම | යන්තෝපරණ සංඛ්‍යාව | | යන්තෝපරණ 72 ක් බෙදාබෙදාදීම සහ කර්මාන්තකරුවන් 50 ක් පුහුණුකිරීම |
| 4 | තවාර පුරම් කජු ගම්මානය සඳහා තාක්ෂණය ලබාදීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව 52 | | කජුලෙලි ඉවත්කිරීමේ කජු ශ්‍රේණිගත කිරීමේ කට්ටල 104 ක් මිළයට ගැනීම |

ව්‍යාපෘතියේ නම : කාර්මික ජනපදවල යටිලත පහසුකම් නවීකරණ කිරීම සහ යාවත්කාලීන කිරීම

ව්‍යාපෘතියේ අරමුණ : නව සහ පවතින කර්මාන්ත සංවර්ධනය

| අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| 1 | **පල්ලේකැලේ කාර්මික ජනපදය**<br>කාණු පද්ධති සහ පවතින වැට අලුත්වැඩියා කිරීම | උස සහ පළල | 16.00 | සම්පූර්ණයි (වියදම- රු. 0,725,725.51) |
| 2 | **පානළුව කාර්මික ජනපදය**<br>ඉඩම් අත්පත්කරගැනීම | ඉඩමේ ප්‍රමාණය | 25.00 | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 3 | **ගලිගමුව කාර්මික ජනපදය**<br>කාණු පද්ධති, වැට, වැසිකිළි ආදිය ඉදිකිරීම | උස පළල | 15.2 | 70% සම්පූර්ණයි. (වියදම - රු. 6,977,537.50) |
| 4 | **පුස්වැල්ල කාර්මික ජනපදය**<br>වැටේ කොටසක් ඉදිකිරීම | උස සහ පළල | 4.8 | 80% සම්පූර්ණයි. (වියදම - රු. 3,000,000.00) |
| | එකතුව | | **61.00** | |

**ව්‍යාපෘතියේ නම : නවීකරණය , යාවත්කාල සහ නඩත්තුව (මිලියන 250)**

**ව්‍යාපෘතියේ අරමුණ : නව සහ පවතින කර්මාන්ත සංවර්ධනය**

| අංකය | ක්‍රියාකාරකම | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක (රු.මිලි) | ප්‍රගතිය |
| 1 | කලුදෑවල | අභ්‍යන්තර මාර්ග සහ කාණු පද්ධති ඉදිකිරීම | 39 | 50% සම්පූර්ණයි |
| 2 | පන්නල | විදුලි ට්‍රාන්ස්පෝමරය සවිකිරීම | 2.75 | මූල්‍ය අවශ්‍යතා 100% අමාත්‍යාංශය මගින් ඉල්ලා ඇත. |
| | | වෙන පියවර සංවර්ධනය | 76.67 | |
| 3 | හොරණ | අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම සහ කාණු පද්ධතිය ඉදිකිරීම | 11 | |
| 4 | පල්ලෙකැලේ | අභ්‍යන්තර මාර්ග සහ වැට කාපට් කිරීම සහ කාණු පද්ධතිය ඉදිකිරීම | 35.71 | 50% සම්පූර්ණයි. |
| 5 | කොටගල | වැසිකිළි සහ ප්‍රධාන අලුත්වැඩියා සහ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | 4 | මූල්‍ය අවශ්‍යතා 50% අමාත්‍යාංශය මගින් ඉල්ලා ඇත. |
| 6 | පුස්වැල්ල | අභ්‍යන්තර මාර්ග සහ කාණු පද්ධති ඉදිකිරීම | 5.75 | |
| 7 | වවුනියාව | අභ්‍යන්තර මාර්ග පද්ධති ඉදිකිරීම | 12 | |
| 8 | ඒකල | අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම | 31 | |
| 9 | මිහින්තලේ | විදුලි ට්‍රාන්ස්පෝමරය සවිකිරීම | 2.76 | |
| | | ඉඩම ප්‍රතිසංස්කරණය සහ වැට ඉදිකිරීම | 7.6 | මූල්‍ය අවශ්‍යතා 100% අමාත්‍යාංශය මගින් ඉල්ලා ඇත. |
| 10 | නෑගම්පහ | ඉඩම ප්‍රතිසංස්කරණය සහ වැට ඉදිකිරීම | 5.13 | මූල්‍ය අවශ්‍යතා 100% අමාත්‍යාංශය මගින් ඉල්ලා ඇත. |
| 11 | ඒකල | ඉදිකිරීම් කටයුතු | 4.6 | මූල්‍ය අවශ්‍යතා 100% අමාත්‍යාංශය මගින් ඉල්ලා ඇත. |
| 12 | බුත්තල | අභ්‍යන්තර මාර්ග, කාණු පද්ධති සහ වැට වැට ඉදිකිරීම | 22.13 | මූල්‍ය අවශ්‍යතා 100% අමාත්‍යාංශය මගින් ඉල්ලා ඇත. |
| | එකතුව | | **250.00** | |

ව්‍යාපෘතියේ නම : බස්නාහිර පළාතේ ආහාර නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය

**(නියමු ව්‍යාපතීය - මිලියන 03)**

**ව්‍යාපෘතියේ අරමුණ : පවතින කර්මාන්ත සංවර්ධනය**

| අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| **1** | කර්මාන්තකරුවන්ගේ අයදුම්පත් කැඳවීම සහ ව්‍යාපෘති යෝජනා ලබාගැනීම | මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය | 6 | 5 |
| **2** | සුදුසු ආහාර නිෂ්පාදන කර්මාන්ත තෝරාගැනීම සහ ක්‍රියාත්මක කිරීම | | | |
| **3** | පසුවිපරම් | | | |
| | | | | |
| එකතුව | | | **6** | **5** |

ව්‍යාපෘතියේ නම : දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සංවර්ධන (මිලියන 0.32)

**ව්‍යාපෘතියේ අරමුණ : පවතින කර්මාන්ත සංවර්ධනය**

| අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| **1** | **නිෂ්පාදන තත්ත්ව හා ඵලදායිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම** | වැඩසටහන් සංඛ්‍යාව | 1 | 100% |
| **2** | **දැනුවත් කිරීමේ සහ ගිණුම්කරණ වැඩසටහන් පැවැත්වීම** | | | |
| එකතුව | | | | |

ව්‍යාපෘතියේ නම : **ආහාර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇසුරුම්කරණය සඳහා පහසුකම් සැපයීම (රු.337814 - අමාත්‍යාංශයේ අරමුදල්)**

**ව්‍යාපෘතියේ අරමුණ** : **ආහාර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇසුරුම්කරණය සංවර්ධනය**

| අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| **1** | • නිෂ්පාදන තත්ත්වය වැඩිදියුණු කිරීම<br>මේ සඳහාදිස්තමේ දිස්ත්‍රික් කාර්යාලයට අනුබද්ධ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 25 ක් පුහුණුකිරීම. | වැඩසටහන් සංඛ්‍යාව | 1 | 100% |
| **එකතුව** | | | | |

ව්‍යාපෘතියේ නම : **රොබෝටික් (Robbotik) 30.Rs.Mn**

**ව්‍යාපෘතියේ අරමුණ** : **නව යාන්ත්‍රණය මගින් දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය**

| අංකය | ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| **1** | ටෙන්ඩරය ප්‍රදානය | | | 25% |
| **2** | ගොඩනැගිලි අලුත්වැඩියාව | | | |
| **එකතුව** | | | | |

# සමුපකාර සේවක කොමිෂන් සභාව

**හැඳින්වීම**

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ මෙම ආයතනය පිහිටුවා ඇත. රේඛීය සමුපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ ජාතික මට්ටමේ සමුපකාර සංගම්/ දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති සෘජුවම මෙම කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වේ.

**දැක්ම**

තෘප්තිමත් සමුපකාරික මානව සම්පතක් නිර්මාණය කිරීම

**මෙහෙවර**

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා එම ක්ෂේත්‍රයෙහි මානව සම්පතෙහි අභිවෘද්ධිය පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම

**අරමුණු**

- සමුපකාර ක්ෂේත්‍රයෙහි මානව සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතභාවය සඳහා නෛතික විධිවිධාන පැනවීම
- සේවක අභිප්‍රේරණයට අවශ්‍ය ක්‍රියාවලින් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- සමුපකාර ක්ෂේත්‍රයේ කාර්මික ආරවුල් විසඳීම හා උපදේශන සේවා සැපයීම

**කාර්යයන්**

- සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේදී ,උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම

- සමුපකාර සමිතිවල තනතුරුවලට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එවැනි තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.

- සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතිමය පියවර ගැනීම

- කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම

- ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයනුකූල ක්‍රියාමාර්ගයන්හිදී සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටීන් තීරණය කිරීම

- මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

**ව්‍යාපෘතියේ නම** : දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**ව්‍යාපෘතියේ අරමුණ** : සමුපකාර සේවකයින්ගේ හා සමුපකාර සේවක කොමිෂන් සභා නිලධාරීන්ගේ දැනුවත් භාවය ඉහළ නැංවීම හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම

| ක්‍රියාකාරකම | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය % | ප්‍රගතිය |
| සමුපකාර සේවකයින් හා සමුපකාර සේවක කොමිෂන් සභා නිලධාරීන් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව | 100% | 100% |

# මාන්තායි සෝල්ට් සමාගම

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ ලුණු නිශ්පාදන කර්මාන්තය සම්බන්ධව ඉතා දිර්ඝ ඉතිහාසයක් සහිත මාන්තායි සෝල්ට් සමාගම සාමාන්‍ය ලුණු නිශ්පාදනය කර අයඩීන් මිශ්‍ර ලුණු , අඹරන ලද ලුණු සහ කර්මාන්ත සඳහා ලුණු යන විවිධ වර්ගවල ලුණු නිශ්පාදන මෙරට නිපදවයි

ප්‍රධානතම ලුණු නිශ්පාදන ප්‍රදේශය මන්නාරම සහ අලිමංකඩ ලුණු ලේවාය ප්‍රදේශය වන අතර එහි පාලනය කොළඹ ප්‍රධාන කාර්යාලය මගින් සිදු කරයි.

1938 දි ආරම්භ කරන ලද ලුණු දේපාර්තමේන්තුව විවිධ පරිපාලන ආයතන යටතේ පාලනය වී 2001 වසරේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් නමින් හඳුන්වා දි ඇත. මාන්තායි සෝල්ට් සමාගම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය යටතේ දැනට පාලනය වේ.

ලංකාවේ අනිකුත් ප්‍රදේශවල ලුණු සමග සසදන කල මෙම ලුණු ඉතා හොඳ තත්වයේ (එන් ඒ සී එල් 98.0) පවති.

ස්වාභාවික සම්පත් උපයෝගි කරගෙන නිශ්පාදනයන් සිදුකිරීමට අමතරව උතුරු පළාතේ මානව සම්පත් උපයෝගි කරගෙන ශ්‍රම සම්පත ප්‍රයොජනයට ගැනිමද මාන්තායි සෝල්ට් ආයතනයේ වශේෂත්වයකි. ස්ථිර සේවකයින් 60 දෙනෙකු සහ සේවකයින් 100 දෙනෙකු ආයතනයේ අනියම් සේවයේ යෙදෙති.

මුදල් අමාත්‍යාංශයේ සහ අනිකුත් රජයේ දේපාර්තමේන්තුවලින් නියොජනය වන අධ්‍යක්ෂක මණ්ඩලයක් ආයතනයේ පාලනය සිදු කරයි.කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය යටතේ පවත්නා මෙම ආයතනයේ කටයුතු එම අමාත්‍යංශයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය මගින් මුල්‍යමය හා නීතිමය පාලනය සිදුකරයි. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ආයතනය ලියාපදිංචි කර ඇත.

ආයතනයේ නිශ්පාදන ප්‍රමිතිය පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සහතික කර ඇත.මුදල් අමාත්‍යාංශය මගින් නම් කල අනුමත විගණන සමාගමක් මගින් ආයතනයේ විගණන කටයුතු සිදු කරයි.

**දැක්ම**

ව්‍යාපාරික ස්වභාවයට අනුකූල වෙමින් පහත දැක්වෙන ස්වරූපයේ දැක්මක් සමාගම සතුව පවතියි.

''රසායනික හා වෙනත් ක්‍රියාවලි සමග සම්බන්ධ ස්වභාවික සම්පත් ගවේෂණය කිරීමෙන් උතුරෙහි සහ නැගෙනහිරෙහි ලුණු පදනම් කරගත් ව්‍යවසායන් සංවර්ධනය කිරීම සහ එමගින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.''

**මෙහෙවර ප්‍රකාශය**

සමාගමේ මෙහෙවර පහත පරිදි වේ.

''උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ලුණු ලේවා ක්‍රියාත්මක ලුණු සහ එහි අතුරු ඵල නිෂ්පාදනය, පිරිසැකසුම හා අලෙවි කිරීම.''

***පරමාර්ථ**

ස්වාභාවික සම්පත් උපයෝගි කරගෙන දේශිය වශයෙන් ආදායම් ඉපයිම, රැකි රක්ෂා පහසුකම් ඇතිකිරිම සහ සමාජය වෙත පොදු වගකිම් ඉටුකිරීම.

***ප්‍රධාන ක්‍රියාකාරකම්**

සාමාන්‍ය ලුණු නිශ්පාදනය කර ,අගය එකතුකර, පරිභෝජනය සදහා අයඩීන් මිශ්‍රකැට ලුණු නිශ්පාදනය.

### 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

*ව්‍යාපෘතියේ නම : අලිමංකඩ ලුණු ලේවාය සංවර්ධනය

*ව්‍යාපෘතියේ පරමාර්ථ : ලේවාය නැවත ක්‍රියාත්මක කර මෙට්‍රික් ටොන් 20000 ක ලුණු වසරකට නිශ්පාදනය කර දේශිය රැකියා පයසුකම් උත්පාදනය

| ක්‍රියාකාරකම | ඒකක මිනුම | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ලගාකරගැනිම |
| අලිමංකඩ ලුණු ලේවාය ප්‍රතිසංස්කරණය හා ප්‍රතිසක්‍රිය කරණය | අදියර 1 - ී නල මාර්ග හා තටාක ප්‍රතිසංස්කරණය | 100 % | 100 % |
| | අදියර 2 - ජල පද්ධති,තටාක,නලමාර්ග අක්කර 350 (භූමි සංවර්ධනය කටයුතු ) | 80 % | 45 % |
| | ගොඩනැගිලි ඉදිකිරීම (පරිපාලන ගොඩනැගිල්ල, ක්ෂේත්‍රකාර්යාලයය කාර්මික වැඩපල) | 100 % | 100 % |

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## හැඳින්වීම

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය (SLITA) වර්ෂ 2009 අංක 12 දරණ පනත යටතේ ස්ථාපිත කරන ලද අතර එහි ක්‍රියාකාරී මෙහෙයුම් 2009 ජුනි මස 15 වන දින සිට ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය ශ්‍රී ලංකාවේ පේෂකර්ම, ඇඟලුම් සහ පාවහන් කර්මාන්තයට අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීමේ ආයතන අතර ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි. පුහුණුවට අමතරව ආයතනය මගින් උපදේශනය, තාක්ෂණික සේවා සහ පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය පරීක්ෂණාගාර සේවා සපයනු ලබයි. ආයතනය මගින් දිගුකාලීන ඩිප්ලෝමා, කෙටිකාලීන සහ කර්මාන්තශාලාවල අවශ්‍යතාවයන්ට අනුව පාඨමාලා මගින් පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබාදේ. පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය (TT&SC) සහ ඇඟලුම් කර්මාන්ත අභ්‍යාස ආයතනය (CITI) යන ආයතන ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ගික තීරණය මගින් මිනිස් සම්පත්, යන්ත්‍රෝපකරණ, ආයතනික ගොඩනැගිලි කාර්යක්ෂමව ඵලදායි ලෙස භාවිතා කිරීම සිදුකර ඇත. තවද ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය එහි ආයතනික ව්‍යුහය ප්‍රතිසංවිධානය කර ඇති අතර ආයතනය තුල අංශ හයක් ව්‍යුහගත කර ඇත. එමගින් පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ ඇතිවන නව ව්‍යාපාරික අභියෝගයන්ට මුහුණදීමට පියවර ගෙන ඇත. ආයතනයේ කළමනාකාරිත්ව ව්‍යුහය තුලින් එක් එක් අංශවල කාර්යභාරය පැහැදිලි ලෙස නිර්වචනය කර තිබීම මගින් ආයතනික ආදායම වැඩි කරගනු ලබයි.

නව පනතේ සඳහන් ආකාරයට පහත අරමුණු සාක්ෂාත් කර ශ්‍රී ලාංකේය පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය දියුණු කිරීමේ වඩා වැඩි වගකීමක් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය මත පැවරී ඇත.

- පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා විශේෂඥ සේවය සැපයීම.
- නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම පුළුල් කිරීම.
- දේශීය හා විදේශීය ඇඟලුම් නිෂ්පාදකයින්ට උපදේශනය සහ තාක්ෂණික සේවා ලබාදීමේ මූලිකයා ලෙස ක්‍රියා කිරීම.
- ගෘහාශ්‍රිත අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය සඳහා තාක්ෂණික දැනුම ලබාදීම.
- පේෂකර්ම, ඇඟලුම්, අත්යන්ත්‍ර, පාවහන් කර්මාන්තවල යෙදෙන ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා විවිධ ආකාරයෙන් තාක්ෂණික දැනුම ලබාදීම.
- වෘත්තිමය පුහුණු පාඨමාලා පවත්වන්නන් අතර ප්‍රමුඛයා ලෙස ක්‍රියා කරමින් ජාතික වෘත්තිමය ප්‍රමිතීන්ට අනුකූල වූ ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා දක්වා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ සේවාවන් පුළුල් කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම.

ඉහත සඳහන් අරමුණු මත පිහිටා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයට සේවා සැපයීමේ ප්‍රමුඛයා ලෙස අඛණ්ඩව සහ කාර්යක්ෂමව සේවා සැපයීමට බලාපොරොත්තු වන අතර ඉදිරි කාලයේදී වැඩදායි ලෙස කටයුතු කිරීම තුලින් ආයතනයේ ස්වයං මූල්‍ය තත්වය ස්ථාවර කිරීමට කටයුතු කිරීම.

**දැක්ම**

"පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තය සඳහා ජාත්‍යන්තරව පිළිගනු ලබන පුහුණුව සහ තාක්‍ෂණික සේවා වෘත්තිය මට්ටමින් සහ ඒකාග්‍රතාවයකින් යුතු සේවා සපයන්නෙකු බවට පත්වීම,"

**මෙහෙවර**

"පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ ධරණීය සංවර්ධනයට පහසුකම් සැපයීමෙන් තත්වය සහ ඵලදායිතාවය වඩාත් දියුණුකර ගැනීම සඳහා විශ්වාසවන්තනීය වූ විශේෂඥයින් සහ තාක්‍ෂණික සේවාවන් සැපයීම."

**2016** දෙසැම්බර් **31** දිනට ප්‍රගතිය

| | **2016** |
|---|---|
| පරීක්‍ෂණ සංඛ්‍යාව | 43937 |
| පුහුණුවන්නන් | 4048 |
| පාඨමාලා සංඛ්‍යාව | 167 |



# ලංකා සතොස සමාගම

**දැක්ම**

**"ශ්‍රී ලංකාවේ සත්‍ය වියදම විදහා දක්වන්නා වූ ජාතියේ මිල තීරකයා බවට පත්වීම."**

**පරමාර්ථය**

**"අපගේ පරමාර්ථය වන්නේ ජීවන වියදම අඩුකිරීම,දිවයිනේ පොදු ජනතාව අතරට ව්‍යාපාරික ප්‍රජාව සම්බන්ධ කිරීම,දිවයිනේ ඉල්ලුම් දාමයට සම්බන්ධ වීම සඳහා කුඩා පරිමාණ ව්‍යවසායකයක් වෙත අවස්ථාවක් සලසා දීම සහ දිවයින පුරා ව්‍යාප්ත වූ සිල්ලර වෙළඳසැල් ජාලය පුළුල් කිරීම මගින් ඉතා උසස් මට්ටමේ පාරිභෝගින සේවාවක් සැපයීම."**

**අරමුණු**

පහත සඳහන් උපක්‍රම මගින් අලෙවිසැලෙහි වටිනාකම 4+ දක්වා වැඩි කිරීම.

- ගුණාත්වයෙන් යුතු නිෂ්පාදන සැපයීම.
- භාණ්ඩ පැසට අදාල වන භාණ්ඩ සුලභ කිරීම.
- වියදම් වන මුදලට සාධාරණ අගයක් ලබාදීම.
- ඉතා හොඳ පාරිභෝගික සේවාවක් සැපයීම.
- ඉතා ප්‍රසන්න සහ සුහදශීලි පාරිභෝගික අත්දැකීමක් ලබා දීම.

➢ රු.30,000.00 හෝ ඊට අඩු ආදායම්ලාභී පාරිභෝගික කාණ්ඩයට වඩා පුළුල් වූ සාප්පු අත්දැකීමක් ලබා දීම.

**2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති අරමුණු | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය |
| නව අලෙවිසැල් විවෘත කිරිම | ලංකා සතොස ආයතනයේ ආදායම් වර්ධනය කිරිම.<br>ආහාරවල සුරක්ෂිතභාවය සහ මිල ස්ථායිතාවය පවත්වා ගැනීම. | විවෘත කරන ලද අලෙවිසැල් ප්‍රමාණය | අලෙවිසැල් 100 | අලෙවිසැල් 15ක් දැනටමත් විවෘත කර ඇති අතර තවත් අලෙවිසැල් 68ක් 2017 පෙබරවාරි මස විවෘත කිරීමට යෝජනා කර ඇත. |
| අලෙවිසැල් වෙනත් ස්ථානයක් වෙත රුගෙන යාම | ජනාවාස තත්වය පදනම්ව උපාය මාර්ගිකව වැදගත් වන ස්ථාන වල ස්ථාන ගත වීම. | නව ස්ථාන වෙත රගෙන යන අලෙවිසැල් ප්‍රමාණය | අලෙවිසැල් 10 | අලෙවිසැල් 02ක් වෙනත් ස්ථාන වෙත රගෙන ගොස් ඇති අතර තවත් 07 ක් නව ස්ථාන වෙත රගෙන යාමට කටයුතු කරමින් සිටි. |
| CCTV ව්‍යාපෘතිය | සොරකම් අවමකිරිම සහ තොග හානි අවම කිරිම.<br>සේවකයන්ගේ විනයානුකුල බව වර්ධනය කිරිම.<br>පාරිභෝගික සේවා වර්ධනය කිරිම. | CCTV කැමරා සවිකළ අලෙවිසැල් ප්‍රමාණය. | අලෙවිසැල් 309 සඳහා කැමරා සවිකිරිම. | ආදර්ශ ව්‍යාපෘතියට අනුව අලෙවිසැල් 11ක කැමරා සවි කර ඇත. |
| ERP ව්‍යාපෘතිය | ලංකා සතොස ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරිම<br>නිරවද්‍යා තොරතුරු ජනනය කරවා ගැනීම සහ ඒ තුලින් නිරවද්‍යා තිරණ ගැනීම. | ERP පද්ධතිය ඇතුගත් කරන ලද අලෙවිසැල් ප්‍රමාණය. | ERP පද්ධතිය ස්ථාන 320 කට ඇතුලත් කිරිම. | ටෙන්ඩරය ප්‍රදානය කරන ලදී. ERP පද්ධතිය ඇතුලත් කිරීමේ කටයුතු දැනටමත් කෙරීගෙන යයි. |
| වායු සමීකරණ ව්‍යාපෘතිය | ඉතා හොඳ මිලදී ගැණුම් අත්දැකීමක් පාරිභෝගිකයාට ලබා දීම සඳහා සුදුසු වාතාවරණයක් ඇති කිරිම.<br>දැනට පවතින අඩු ආදායම්ලාභී පාරිභොගික කාණ්ඩයකට අමතරව මධ්‍ය ආදායම්ලාභි පාරිභෝගිකයින් ඉලක්ක තර ගැනීම.<br>නිෂ්පාදිත කාණ්ඩ හා වර්ග,එළවළු සහ පළතුරු වෙළඳාම තුලින් පුළුල් කරවා ගැනීම(වායුසමීකරණය ලද තත්වයන් තුළිදී එළවළු සහ පළතුරු වල නැවුම් බව ආරක්ෂා කර ගත හැති වීම. | වායු සමීකරණය කරන ලද අලෙවිසැල් ප්‍රමාණය | දැනට පවතින අලෙවිසැල් 100 වායු සමනය කීරිම. | අලෙවිසැල් 40 වායුසමනය කර ඇති අතර අනෙක් අලෙවිසැල් වල වැඩ කෙරීගෙන යයි |
| මිලදී ගැණුම් දෙපාර්තමේන්තුවට Lab එකක් පිහිටුවීම | තත්ව පරීක්ෂාවක් තුළින් නිෂ්පාදනයන්ගේ ගුණත්වය තහවුරු කිරීම. | අවශ්‍ය මුලික පහසුකම් ස්ථාපිත කිරීම හරහා පාරිභෝගිකයාට හිතකර වාතාවරණයක් ඇති කිරීම. | | අරමුදල් හිඟතාවය නිසා 2017 ක්‍රියාකාරී සැලැස්මට යොමු කරන ලදී. |
| අලෙවිසැල් අළුත්වැඩියා කිරීම | අවශ්‍ය මුලික පහසුකම් ස්ථාපිත කිරීම හරහා පාරිභෝගිකයාට හිතකර වාතාවරණයක් ඇති කිරීම | අළුත්වැඩියා කරන අලෙවිසැල් ප්‍රමාණය(සුළු පරිමාණ) | සුළු පරිමාණ අළුත්වැඩියා කිරීම්- අලෙවිසැල් 33 | සුළු අළුත්වැඩියා කිරීම්- 70% වැඩ සම්පූර්ණ කර ඇති අතර ඉතිරි වැඩ කෙරීගෙන යයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | අළුත්වැඩියා කරන අලෙවිසැල් ප්‍රමාණය(මහා පරිමාණ) | මහා පරිමාණ අළුත්වැඩියා කිරීම්- අලෙවිසැල් 08 | මහා පරිමාණ අළුත්වැඩියා කිරීම්- 40% වැඩ සම්පූර්ණ කර ඇති අතර ඉතිරි වැඩ කෙරීගෙන යයි. |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම. | මානව සම්පත් තොරතුරු පද්ධතියේ සහ මානව සම්පත් කළමණාකරණයේ වර්ධනය | | | ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කර ඇති අතර 2017 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම. | පාරිභෝගික හිතකර වාතාවරණයක් නිර්මාණය කිරිම තුලින්වැඩි පාරිභෝගික පිරිසත් ආකර්ශණය කර ගැනීම සහ ඒ තුලින් ආදායම් වර්ධනය. | අලෙවිසැලට අවශ්‍ය මූලික වත්කම් ලබා දීම. | දැනට පවතින සියළු අලෙවිසැල්හි අඩුපාඩු ප්‍රතිපූර්ණය කිරිම. | 60% වැඩ සම්පූර්ණ කර ඇති අතර ඉතිරිය කෙරීගෙක යයි. |

# ජාතික ශිල්ප සභාව

### හැඳින්වීම

වසර දහස් ගණනක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව අත්කම් හා කලා ශිල්පයන්ගෙන් පරිපූර්ණ වූවකි. සංස්කෘතික දායාදයක් වූ අත්කම් පෝෂණය සඳහා පෙර රජ දවස රාජ්‍ය අනුග්‍රහය නොමදව ලැබිණ. අත්කම් නිර්මාණයන්හි නිරතවූ ශිල්පීන් හට සමාජය තුල සුවිශේෂී ස්ථානයක් හිමි වූ අතර, රාජ්‍ය ගෞරව සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

ශ්‍රී ලංකාව දේශීය ආධිපත්‍යයට නතු වීමෙන් පසු වසර දහස් ගණනක් පාරම්පරිකව ආරක්ෂා කරගනිමින් පෝෂණය කළ අත්කම් නිර්මාණ, ශිල්පීය ක්‍රම සහ කුසලතා රාජ්‍ය අනුග්‍රහය නොලැබීමත්, ඇගයීමකට ලක් නොවීමත් හේතු කොටගෙන ක්‍රම ක්‍රමයෙන් විනාශ වී යන්නට විය.

ශ්‍රී ලංකාව නිදහස ලැබීමත් සමඟ හස්ත කර්මාන්තයන්හි නැවත පුනර්ජීවනයක් ඇති වූ අතර, ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් ද බිහි විය.

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභ සාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතීන් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

### දර්ශනය

තිරසාර පැවැත්ම උදෙසා හෙළ අත්කම් පෝෂණය කිරීම හා සංරක්ෂණය කිරීම.

### මෙහෙවර

සාම්ප්‍රදායික සහ සංස්කෘතික වටිනාකමක් ඇති දේශීය හස්ත කර්මාන්ත සංරක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම, දිරි ගැන්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ශිල්පීන්ගේ ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම.

### අරමුණු

a) හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන සියලු දෙනාට නිසි පුහුණුවක් ලබා දීම.
b) හස්ත කර්මාන්ත නිෂ්පාදන ජනප්‍රිය කරවීම සහ අළෙවිය සඳහා පහසුකම් සැලසීම.
c) හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා අවස්ථා බිහි කිරීම.
d) හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි යොමුවීම සඳහා පාසල් ළමුන් ධෛර්යමත් කිරීම.
e) දේශීය හස්ත කර්මාන්ත තරඟ සඳහා ශිල්පීන්ගේ සහභාගීත්වය උපරිම කිරීම.
f) හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය, සංවර්ධනය සහ වැඩි දියුණු කිරීම.
g) සේවක සඵලතාවය, කාර්යක්ෂමතාවය සහ තෘප්තිය ඉහල නැංවීම.

### ජාතික ශිල්ප සභාවේ වැඩසටහන් හා ක්‍රියාමාර්ග

a) ප්‍රාදේශීය මට්ටමින් ශිල්පීන්ගේ සමිති පිහිටුවීම තුලින් ශිල්පින් සංවිධානය කිරීම හා ශිල්ප ගම්මාන ඇති කිරීම.
b) අත්කම් ශිල්පීන් හඳුනාගෙන ජාතික මට්ටමින් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම.
c) ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම.
d) අත්කම් භාණ්ඩවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වැඩමුළු පැවැත්වීම.
e) ගුරු ශිල්ප පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
f) ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පූර්ණ කාලීන හස්ත කර්මාන්ත පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හා නිෂ්පාදන පහසුකම් ලබා දීම.
g) විදේශීය වෙළඳ පොළ සඳහා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, දිරිගැන්වීම, ප්‍රදර්ශනය කිරීම හා විදේශ ප්‍රදර්ශනවලට ශිල්පීන් ඉදිරිපත් කිරීම.

h) පළාත් හා ජාතික මට්ටමින් ප්‍රදර්ශන සහ තරඟ පැවැත්වීම තුළින් ශිල්පීන් ඇගයීමට ලක් කිරීම සහ අළෙවි සල්පිල් පැවැත්වීම, ශිල්ප ගම්මාන පිහිටුවීම මගින් ශිල්පීන්ගේ නිෂ්පාදන භාණ්ඩ අලෙවි කරගැනීම සඳහා පහසුකම් සංවිධානය කිරීම.

i) ශිල්පීන් සඳහා සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
